COLLABORATIVE LEARNING PROJECTS

# සවන්දීමේ වැඩ සටහන

## ක්ෂේත්‍ර චාරිකා වර්තාව

ශ්‍රී ලංකාව

2007, සැප්තැම්බර්-ඔක්තෝබර්

CDA COLLABORATIVE LEARNING PROJECTS

මෙම ලේඛනය සීඩීඒ (CDA-The Collaborative for Development Action) මගින් මෙහෙයවන ලද සාමූහික ඉගෙනීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ඉදිරිපත් කර ඇත. මෙය ලේඛන එකතුවක කොටසක් වන අතර මෙය ව්‍යාපෘතියේ ප්‍රාථමික සොයාගැනීම් අතරින් එක් කොටසක් වේ. මෙම ලේඛන රචනා කිරීම මගින් විවිධ වාතාවරණ පරාසයක තේමාවන් හා ගැටලුවල පැතිකඩ හඳුනාගැනීම සඳහා අවස්ථාවක් සැපයේ. ඒ ඒ සිද්ධියක් මගින් මෙම ලේඛනය සකසන අවස්ථාවේ සිටි විවිධ පුද්ගලයින්ගේ දැක්මන් හා ආකාල්ප නියෝජනය කෙරේ.

**මෙම ලේඛනයන් ව්‍යාපෘතියේ අවසන් ඵලය නොවන්නේය.** මෙම ලේඛනයන් උපුටා දැක්විය හැකිවූවද මෙය සාමුහික ඉගෙනීමේ ව්‍යාපෘතියේ කාර්ය ලේඛන ලෙස පවතී. ව්‍යාපෘතියේ සොයාගැනීම් පිළිබඳ පුළුල් සාධාරණීකරණයක් තනි සිද්ධියක් ආධාරයෙන් සිදු කළ නොහැකිය.

මෙම ව්‍යාපෘතිය ගොඩ නැගීම සඳහා කාලය, අත්දැකීම් හා ආකල්පයන් ආදී නන් අයුරින් දායක වීම වෙනුවෙන් අනෙකුත් ආයතනයන්ට හා පුද්ගලයින්ට සීඩීඒ සිය ස්තුතිය පිරිණමයි.

ව්‍යාපෘතිය වෙනුවෙන් ලිඛිත සියලුම ලේඛන ප්‍රසිද්ධියට පත් නොකෙරේ. යම් වාර්තාවක් සිදු කරන අවස්ථාවකදී ඊට අදාළ පුද්ලගයින් ඔවුන්ගේ නිර්ණාමිකත්වය හා ආරක්‍ෂාව තහවරු කිරීම සඳහා ඉල්ලා සිටින අවස්ථාවන්හිදී එම ලේඛන පුද්ගලික වශයෙන් තබා ගැනීමටත් ප්‍රසිද්ධියට පත් නොකිරීමටත් අප කටයුතු කරන්නෙමු.

www.cdainc.com/TEL: 617.661.6310/FAX: 617.661.3805/Cambridge, MA USA

## පටුන

සවන්දීමේ වැඩ සටහනේ පසුබිම
ශ්‍රී ලංකා සවන්දීමේ වැඩ සටහන
ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ආධාර ලැබීමේ ඉතිහාසය

සවන්දීමේ කණ්ඩායමට ඇසුණු දේ

1. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්හි කාර්යක්ෂමබව හා ඵලදායීබව

(අ). ජාත්‍යන්තර සහාය සඳහා ප්‍රශංසා
(ආ). වේගවත්බව, තරගකාරීත්වය, හා පුනරාවර්තනය
(ඇ). ඉලක්ක ප්‍රදේශ හා ප්‍රතිලාභීන් තෝරාගැනීම
(ඈ). යෝග්‍යතාවය හා සපයන ආධාරයන්හි ගුණාත්මකබාවය
(ඉ). දිගු කාලීන මැදිහත්වීම් හා කෙටි කාලීන ව්‍යාපෘති

2. ආධාරකරුවන්ගේ න්‍යායපත්‍රයන්, රාජ්‍ය නොවන සංවිධානයන්හි කාර්ය පටිපාටීන් හා ප්‍රමුඛතා

(අ). යුද බලපෑම් ලත් හා සුනාමි බලපෑම් ලත්
(ආ). දිළිඳු ජනතාවට ආධාර?

3. ආධාර සම්පත් කළමනාකරණය

(අ). ආධාර අවනතු කරගැනීම හා දූෂණය
ආ) අන්තර්ජාතික හා ජාතික සහනසේවා ආයතන විසින් අරමුදල් වැය කරන්නේ කෙසේද?

4. බාහිර අගයන් ප්‍රවර්ධනය හා ගෞරවය හා වැදගත්කම පිළිබඳ ගැටලු

අ) බාහිර අගයන් ප්‍රවර්ධනය කිරීම
ආ) ගෞරවය හා වැදගත්කම පිළිබඳ ගැටලු

5. ආර්ථික හා සමාජයීය බලපෑම

අ.) ආර්ථික බලපෑම ඃ වැටුප්, උද්ධමනය, ආර්ථිකය
ආ) යහපත් බලපෑම් ප්‍රජාව ශක්තිමත් කිරීම හා ඒකාබද්ධ කිරීම
ඇ) ස්වයං පැවැත්ම හා අන් අයෙක් මත යැපීම
ඈ) අයහපත් සමාජයීය බලපෑම් : ප්‍රජාවන් අතර හා ප්‍රජාවන් තුළ ඇතිවන ආතතිය

6. ආධාර සපයන්නන් හා සැලසුම් ක්‍රියාත්මක කරනන්නන්ගේ කාර්ය භාරය හා වගකීම්

අ) නියමිත කාර්යයන් හා අපේක්ෂා පිළිබඳ අදහස් දැක්වීම
ආ) ක්‍රියාවලියට ආධර ලබන්නන් සම්බන්ධ කර ගැනීම.
ඇ) ධාරිතා සංවර්ධනය හා එකාවන්ව කටයුතු කිරීම
ඈ) නිරීක්ෂණය
ඉ) ජාතික හා ප්‍රාදේශීය පාලනය සමග කටයුතු කිරීම

7. ගැටුම් පවතින ප්‍රදේශවල රජය හා ආරක්ෂක හමුදා සමග සහන සේවාවල සම්බන්ධය

අවසාන ප්‍රත්‍යාවේක්ෂණය

## සවන්දීමේ වැඩ සටහනේ පසුබිම

සීඩීඒ සාමූහික ඉගෙනීමේ ව්‍යාපෘති කණ්ඩායම, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්, ආධාරක ආයතන හා මානුෂීය හා සංවර්ධන ආයතනයන්හි සගයන් කිහිපදෙනෙකු හා එක්ව සවන්දීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ ජාත්‍යන්තර ආධාර ලබන්නා වූ සමාජයන්හි පුද්ගලයින්ගේ අදහස්, ආකල්ප, විධිමත් හා සවිස්තරාත්මක ලෙස විමසා බැලීම සඳහාය. ආධාර ලබාගන්නා සමාජයන්හි විවිධ තනතුරු දරන්නා වූ, අත්දැකීම් සහිත පුද්ගලයින්ගේ අදහස් සොයාබැලීමක් සවන්දීමේ වැඩ සටහන මගින් සිදු කෙරෙන අතර එමගින් අභ්‍යන්තර ක්‍රියාකාරීන් මගින් ආධාර සැපයීම සඳහා දරන උත්සාහයන් හි බලපෑම තක්සේරු කිරීමක් සිදු කෙරේ. මානුෂීය ආධාර, සංවර්ධන සහාය, පරිසර සංරක්ෂණය, මානව හිමිකම් සුරැකීම, සාමය ගොඩනැගීම වැනි ක්ෂේත්‍රයන්හි ලොව පුරා රටවල සහන කටයුතුවල නිරතව සිටින අප වැන්නන්ට, ආධාර ලබන්නාවූ ප්‍රජාව ඔවුනට ලැබෙන්නා වූ ආධාරයන්හි ක්ෂණික බලපෑම් හා දිගුකාලීන බලපෑම් පිළිබඳ ඉදිරිපත් කරන්නාවූ අදහස් හා විශ්ලේෂණයන්ට සවන් දීම මගින් උගත හැකි දෑ බොහෝය.

සවන්දීමේ කණ්ඩායම් පෙර සැලසුම් කළ ප්‍රශ්නාවලි හෝ ඍජු සම්මුඛ සාකච්ඡා විධි අනුගමනය නොකළේය. අප ජනතාවට පැවසූයේ අප ජාත්‍යන්තර ආධාර සැපයීමේ කටයුතුවල නිරත වූ පුද්ගලයින් වශයෙන් ඒ පිළිබඳ ඔවුන්ගේ අදහස් දැන ගැනීමට කැමැත්තක් දක්වන බව පමණි. ජාත්‍යන්තර ආධාර පිළිබඳ ඔවුන්ගේ අදහස්, ඒ පිළිබඳ ඔවුන් ලබා ඇති අත්දැකීම් අප හා බෙදා ගනිමින් අප හා කාලය ගත කිරීමට ඔවුන් කැමත්තක් දක්වන්නේදැයි අපි විමසා සිටියෙමු. මේ ආකාරයෙන් අප ඔවුන්ගේ ගැටලුකාරී තත්ත්වයන් හා අවස්ථා පිළිබඳ කතා බහෙහි යෙදුනේ පූර්ව වශයෙන් නිගමනය කෙරුණු ප්‍රශ්න හෝ මාතෘකා ඉදිරිපත්කිරීමකින් තොරවය.

ඇතැම් කතා බහ එක් පුද්ගලයෙකු හෝ දෙදෙනකුට සීමා වූ අතර ඇතැම් අවස්ථාවන්හිදී කුඩා කණ්ඩායම් සංවාදයක් ලෙස පටන් ගන්නා කතාබහ විශාල කණ්ඩායමක් දක්වා වර්ධනය වී එය නිදහසේ ගලා යන කණ්ඩායම් සාකච්ඡාවක් බවට පෙරළිණ. බොහෝ අවස්ථාවන්හිදී සංවාද පෙර සැලසුම් නොකරන ලද ඒවා වන අතර යම් ප්‍රජාවකට පියමනින සංවාද කණ්ඩායම ආධාර ලැබූ හෝ නොලැබූ, මග තොට හමුවන, කතාබස් කිරීමට කැමැත්තක් දක්වන ඕනෑම පුද්ගලයකු සමග කතාබහ ආරම්භ කරයි. මීට අමතරව, පෙර වේලාවන් යොදා ගනිමින් රජයේ නිලධාරීන් හා ප්‍රාදේශීය නායකයින් ද මුණ ගැසිණි.

වසර තුනක කාලයක් තුළ, සවන්දීමේ ව්‍යාපෘතිය රටවල් 20ක් පුරා සැරිසරන අතර ශ්‍රී ලංකාව මෙහි එකොලොස්වැන්නයි. මේ සියලුම ස්ථානයන්හි පුද්ගලයින් පවසන දෑ මෙම ව්‍යාපෘතිය මගින් එක්රැස් කර එම දැක්මන් අනාගත ආධාර හා සහන වැඩ කටයුතු සඳහා ඒකාබද්ධ කෙරෙන අතර එමගින් එම කර්තව්‍යයන්හි ඵලදායීතාවය ඉහළ දැමීම අපේක්ෂා කෙරේ.

සවන්දීමේ වැඩ සටහන වැනි ඒකාබද්ධ ඉගෙනීමේ ක්‍රියාවලීන්හි සාර්ථකත්වය තීරණය වන්නේ ඒ සඳහා සහභාගීවන සංවිධානයන්හි දායකත්වය හා මැදිහත්වීමේ ප්‍රමාණය මතයි. ශ්‍රී ලංකාවේ සවන්දීමේ වැඩ සටහන සඳහා සහභාගී වූ සංවිධානයන් විසින් ලබා දුන් සුහදශීලී සහාය වෙනුවෙන් ද එම කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ දැක්මන් හා කැපවීම වෙනුවෙන් ද ඔවුන් නොමඳ ඇගයීමට ලක් විය යුතුය.

## ශ්‍රී ලංකා සවන්දීමේ වැඩ සටහන

සවන්දීමේ වැඩ සටහනක් ශ්‍රී ලංකාවේ 2007 වසරේ සැප්තැම්බර් මස පැවැත්වූයේ මානුෂීය සේවායතන සමූහය (CHA), ෆෝරූට් (FORUT), රතු කුරුස හා රතු චන්ද්‍රවංක සමාජයන්හි ජාත්‍යන්තර සංයුක්ත මණ්ඩලය (IFRC), අයර්ලන්ත රතු කුරුසය (IRC), මර්සි කෝ(ර්) (Mercy Corps), ඔක්ස්ෆෑම් ඇමරිකා (Oxfam America), ඔක්ස්ෆෑම් GB (Oxfam GB), සේවාලංකා හා වර්ල්ඩ් විෂන් (World Vision) යන සංවිධානයන්හි එකතුවෙනි. මෙම කර්තව්‍යයන් සඳහා අවශ්‍ය ආධාර, කාර්යමණ්ඩලය හා ආගන්තුක සත්කාර හා ප්‍රවහන පහසුකම් වැනි අනෙකුත් පහසුකම් මෙම සංවිධාන විසින් සැපයූ අතර මානුෂීය සේවායතන සමූහය (CHA) ඔවුන්ගේ එක් කාර්යමණ්ඩල සාමාජිකයකු පහසුකම් සපයන්නකු ලෙස යෙදවීය. සීඩීඒ එක් කාර්යමණ්ඩල සාමාජිකයකු ද උපදේශකයින් දෙදෙනෙකු ද දේශීය පහසුකම්සපයන්නෙකු ද සැපයීය.

මෙම සවන්දීමේ අභ්‍යාසය ශ්‍රී ලංකාවේ ප්‍රදේශ 6ක පැවැත්විණි: 1. සුනාමි බලපෑම් ලද දකුණු පලාතේ ගාල්ල ප්‍රදේශය හා ඒ අවට, 2. සුනාමි බලපෑම් මෙන්ම යුද බලපෑම් ද පවතින නැගෙනහිර පලාතේ මඩකලපුව ප්‍රදේශය, 3. 1990 ගණන්වල සිට මුස්ලිම් අභ්‍යන්තර අවතැන්වූවන් වෙසෙන පුත්තලම ප්‍රදේශය, 4. මධ්‍යම කඳුකරය හා තේ වතු සහිත බදුල්ල හා ඌව පලාත්, 5. උතුරු ප්‍රදේශයේ සිට පැමිණෙන අභ්‍යන්තර අවතැන්වූවන් සිටින අනුරාධපුර මායිම් ප්‍රදේශ, 6. රෙදිපිළි කර්මාන්ත සේවකයින්, රජයේ අමාත්‍යාංශ කාර්යමණ්ඩල, විදේශ ආධාරකරුවන්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන හා පර්යේෂණ මධ්‍යස්ථාන ආවරණය වන ආකාරයෙන් කොළඹ ප්‍රදේශය. සීඩීඒ හි උපදේශනය ද සහිතව සහභාගීත්ව සංවිධාන විසින් මෙම ප්‍රදේශ තෝරා ගත් අතර මෙම ප්‍රදේශ, කාලාන්තරයක් පුරා විවිධ ආකාරයේ ආධාර ලැබූ ප්‍රදේශයන් වේ.

සහභාගී වූ සංවිධානයන්හි කාර්ය මණ්ඩල සාමාජිකයින් තිස් පස් දෙනෙකු "සවන්දෙන්නන්" ලෙස මෙම ප්‍රදේශ 6 මුළුල්ලේම යෙදවූ අතර පුද්ගලයින් 375ක් පමණ දායක වූ සංවාද 195ක් පවත් වන ලදී. මෙම සංවාද සඳහා ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රධාන වාර්ගික හා ආගමික කණ්ඩායම් සහභාගීවූ අතර වැඩිහිටි ගැහැණු හා පිරිමින්, වැඩිමහළු වියේ පසුවන්නන්, තරුණයින්, ගොවීන්, ධීවරයින්, වතු කම්කරුවන්, ආගමික නායකයින්, කුඩා ව්‍යාපාර හිමිකරුවන්, පාසල් ගුරුවරුන් හා විදුහල්පතිවරුන්, දිස්ත්‍රික්ක හා ජාතික මට්ටමේ රාජ්‍ය නිලධාරීන්, ප්‍රජා නායකයින්, නාගරික මෙන්ම ග්‍රාමීය ජනතාව, නායකත්ව තනතුරු දැරූවන් හා කොන්වීමට ලක් වූවන් සහභාගී වනු ලැබීය. සවන්දීමේ කණ්ඩායම අභ්‍යන්තර ව අවතැන්වූවන්, සුනාමි බලපෑමට ලක්වූවන්, ගැටුම් බලපෑමට ලක්වූවන්, හා ප්‍රජා මූල සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් සමග සංවාද පැවැත්වීය. කණ්ඩායම කොළඹ නගරයේ පිහිටි ආධාර සපයන ජාත්‍යන්තර සංවිධානයන්හි කාර්යමණ්ඩල සාමාජිකයින් සමග ද කතාබස් කළේය.

සෑම ස්ථානයකදීම සවන්දීමේ කණ්ඩායම ඍජුව ජත්‍යන්තර සහන හා ආධාර ලැබූවන් මෙන්ම නොලැබූවන් ද සමග කතා බස් කළේය. මිනිසුන් ඔවුන්ගේ අත්දැකීම් හා එදිනෙදා ඇසූදුටු දෑ සලකා බලමින් ඔවුන්ගේ අදහස් දැක්වීමට කැමැත්තක් දක්වන බව සවන්දීමේ කණ්ඩායම් වලට වැටහී ගියේය. පුළුල් පරාසයක දැක්මන්/දර්ශනයන් සහිත පුද්ගලයින්ගේ කතාබහට සවන්දීමට අවස්ථාව ලැබීමට අපි වාසනාවන්ත වීමු. කෙසේවූවද, මෙම අදහස් ශ්‍රී ලංකාවේ ජනතාවගේ අදහස් හා ආකල්ප වලින් සුළු කොටසක් පමණක් නියෝජනය වන බව අපි දනිමු. එබැවින් මෙම සංචාරයෙන් පුළුල් නිගමනයන්ට නොඑළඹෙමු. ජාත්‍යන්තර ආධාරයන්හි සාමූහික බලපෑම් පිළිබඳ ඉතා වටිනා දැක්මන් හා අදහස් හසුකරගැනීමට අප සමත් වූ අතර ඉදිරි මාසයන්හිදී

ලොව අනෙකුත් රටවල් වලට ද සවන් දුන් පසු අපි මේවායේ පොදු තේමාවන්, ආකල්ප, නිගමන හා යෝජනා සොයාබැලීම සඳහා යොමු වන්නෙමු.

**ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ආධාර ලැබීමේ ඉතිහාසය**[1]

වර්ෂ 1948දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබීමත් සමගම පොදුරාජ්‍ය මණ්ඩලීය රටවලින් ශ්‍රී ලංකාවට විදේශ රටවලින් ආධාර ලැබීම ආරම්භ වූ අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව 1954 වර්ෂයේදී පළමු ණය ගිවිසුම අත්සන් කරන ලදී. වර්ෂ 1950 දශකයේ අගභාගයේ සිට 1970 දශකය දක්වා ශ්‍රී ලංකාව සිය විදේශාධාර සම්පත් නානාංගීකරණය කරමින් චීනය හා නැගෙනහිර රටවල් සමග සමීප සබඳතා පවත්වාගත් අතර එමගින් රට, රජය මගින් මෙහෙයවන ලද කාර්මීකරණයකට යොමු විය. මෙම කාලය තුළදී සීතල යුද්ධය හා සම්බන්ධ රජයේ ආකතීන් හේතුවෙන් බටහිර විදේශාධාරයන් පහත වැටිණි. දේශපාලන වෙනස්වීමක් ද සමග 1970 දශකයේ අගභාගයේදී ශ්‍රී ලංකාවට ජපන්, ඇමරිකානු එක්සත් ජනපදයෙන් හා බටහිර යුරෝපයෙන් විදේශාධාර ගලා එන්නට පටන් ගත්තේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලද ලෝක බැංකුවද ශ්‍රී ලංකාවේ සිය කාර්යාල ස්ථාපිත කළ අතර ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩ සටහන් හා ප්‍රතිව්‍යුහගත කිරීම් කිහිපයක් ම කෘෂි කර්මාන්තය, තේ කර්මාන්තය, හා කාර්මික අංශය ඉලක්ක කර ගනිමින් සිදු කෙරිණි. 1980 දශකයේ මුල් භාගයේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් වෙන්කර ඇති විදේශ ආධාර අරමුදල් ඉහළ යාමත් සමග බොහෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ශ්‍රී ලංකාව තුළ සංවර්ධන වැඩ සටහන් ආරම්භ කිරීම පටන් ගැනිණි. ආරම්භයේදී බොහෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන දරිද්‍රතාවය තුරන්කිරීම, ප්‍රජා සජීවීකරණය ආශ්‍රිත ආදායම් උත්පාදනය, පෝෂණය, අධ්‍යාපනය හා සෞඛ්‍යය යන අංශයන් කෙරෙහි අවධානය යොමු කරන ලදී. 1980 දශකයේ අගභාගයේදී ශ්‍රී ලංකා රජය හා දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර දේශපාලන ගැටුම් උත්සන්න වීමෙන් පසු බොහෝ ජාත්‍යන්තර සංවිධාන පාලනය, මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය හා ගැටුම් නිරාකරණය යන අංශයන්හි වඩාත් ක්‍රියාකාරීව කටයුතු කිරීමට පටන් ගත්තේය. උතුරෙහි එල්ටීටීඊ පාලන ප්‍රදේශයන්හි වෙසෙන ජනතාව සඳහා මානුෂීය සහන හා සංවර්ධන සහාය සැලසීම සඳහා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා විදේශ ආධාර සපයන්නන් ගත් තීරණය මධ්‍යම රජයෙන් හා ඇතැම් දේශපාලන පක්ෂයන්ගේ දැඩි විවේචනයට ලක්විය.

ශ්‍රී ලංකාවේ වෙරළ තීරයෙන් හතරෙන් තුනක පමණ කොටසක් විනාශයට ලක් වූ දෙදහස් හතර වර්ෂයේ දෙසැම්බර් මස ඇති වූ සුනාමි ව්‍යසනයෙන් පසු අසීමිත සංඛ්‍යාවක් වූ ජත්‍යන්තර හා දේශීය සහන ආයතන හා පෞද්ගලික සහන සේවා කණ්ඩායම් ද රටේ දකුණු හා නැගෙනහිර ප්‍රදේශයේ සහන කටයුතු සැලසීම සඳහා කටයුතු කළේය. වසර 15ක් පුරා මානුෂීය, සංවර්ධන හා සමාය ගොඩනැගීම සම්බන්ධව කටයුතු කළ දේශීය හා විදේශීය ආයතන දැන් අභිනවයෙන් පැමිණි සංවිධාන සමග එක්ව කටයුතු කරයි. ශ්‍රී ලංකාවට පැමිණි ඉහළ නව ක්‍රියාකාරීන්ගේ සංඛ්‍යාව හේතුවෙන් ආධාරකරුවන් "තදබද මානුෂීය අවකාශය" ලෙස හැඳින්වෙන තත්වය උදා විය. රජය හා එල්ටීටීඊය අතර ගැටුම් 2005 වර්ෂය අවසානයේදී යළි උත්සන්න වීමත් සමග මානුෂීය අර්බුදය තවත් තීව්‍ර කරමින් අභ්‍යන්තර අවතැන්වූවන්ගේ සංඛ්‍යාව ඉහළ යන්නට විය.
සුනාමි සහන වැඩ සටහන් අවසන් ව ගියද බොහෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන මානුෂීය හා සංවර්ධන කාර්යයන්හි ද වත්මන් දේශපාලන වාතාවරණය මගින් ඉඩ ප්‍රස්ථා සැලසෙන කල්හි සාමය ගොඩනැගීමේ කාර්යයන්හිදි නියැළෙමින් රට තුළ රැඳී සිටියේය.

[1] සුනිල් බැසිටියන්ගේ ප්‍රකාශයට පත් නොකෙරුණු "Globalization, Foreign Aid and Conflict – The Case of Sri Lanka" යන ලිපිය මෙම කෙටි විස්තරය සැකසීමේ ලා බෙහෙවින් උපකාර විය.

**සවන්දීමේ කණ්ඩායමට ඇසුණු දේ**

සොයාගත් දෑ ප්‍රධාන තේමා කාණ්ඩ යටතේ අනුපිළිවෙලට සකස් කරන ලද්දේ ඒවා විශ්ලේෂණය කිරීමට හා අප එක් රැස්කරගත් මහා තොරතුරු සම්භාරයෙන් යම් අරුතක් ගොඩනැගීමටත් ය. අප සවන් දුන් ජනතාවට ගෞරවයක් ලෙසත් ඔවුන්ගේ අදහස් තත් ආකාරයෙන් ඉදිරිපත් කිරීමටත් අප ඔවුන් පැවසූ දෑ ද නිශ්චිත නිදසුන් ද ඔවුන්ගේ වචනයෙන්ම සටහන් කර ගැනීමට බොහෝ වෙහෙස දැරුවෙමු. තෝරාගත් උපුටා දැක්වීම් හා නිදසුන් අප සවන්දුන් බොහෝ සංවාදයන් නියෝජනය කරන අතර එමගින් ඔවුන්ගේ දැක්මන්, ආකල්ප හා අත්දැකීම් විදහා දක්වයි. මෙම අදහස් දැක්වීම් හි සුලබ හෝ දුලබ බව "ඇතැම්", "ටිකක්", " බොහෝ", "බහුතරය" වැනි යෙදුම් මගින් දක්වා ඇත. එක් පුද්ගලයකුගේ අදහස් පොදු අදහසක් ලෙස අපි ඉදිරිපත් නොකරමු. කෙසේවුවද වාර්තාව මුළුල්ලේම එක් එක් පුද්ගලයින්ගේ අදහස් අපගේ අදහස් දැක්වීමකින් තොරව ඉදිරිපත් කර ඇත්තේ අපගේ අලංකරණයන් නොමැති වුවද මෙසේ යහමින් ඉදිරිපත් කරන ලද අදහස් මගින් බොහෝ දෑ හැඟවෙන බැවිනි. ශ්‍රී ලංකාවේ සවන්දීමේ කණ්ඩායමේ අදහස් ද වඩාත් සවන්දීමට හා විශ්ලේෂණයට ලක් විය යුතු යැයි හැඟෙන අපට ඇසුණු දෙයින් නැගෙන ගැටලු කිහිපයක් ද මෙහි සාරංශ ගත කර ඇත.

**1. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්හි කාර්යක්ෂමබව හා ඵලදායීබව**

(අ). **ජාත්‍යන්තර සහාය සඳහා ප්‍රශංසා**

සංචාරය කළ ප්‍රදේශ හයේදීම දක්නට ලැබූ පොදු තේමාවක් වන්නේ ගැටුම් උත්සන්න වූ අවස්ථාවන්හිදී හා සුනාමි ව්‍යසනය සිදුවූ අවස්ථාවන්හිදී ජනතාවගේ මූලික අවශ්‍යතා සපයා ගැනීම සඳහා බාහිර සහාය මගින් ඉටු කළ වැදගත් කාර්යභාර්යයි. සුනාමි ව්‍යසනය සිදුවූ වහාම ඔවුන්ගේ හදිසි අවශ්‍යතා සපුරා ලීම සඳහා විශ්මිත ලෙස දේශීය ස්වේච්ඡා උත්සාහයන් සිදු කෙරුණද ජාත්‍යන්තර සහන හා සංවර්ධන ආයතනයන්ගේ සහාය නොවන්නට සුනාමියෙන් දිවිගලවා ගත්තවුන් කුසගින්නේ මිය යන්නටත් අනාරක්ෂිතව නොසලකා හැරෙන්නටත් ඉඩ තිබුණු බව ජනතාව පිළිගනිති. ජාතික රජයට කලට වේලාවට දිළිඳු හා අවදානමට ලක් වූ ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු කර දීමට නොහැකි බව බොහෝ දෙනෙකුට හැඟී ගියේය.

"හැබැයි ජාත්‍යන්තර සංවිධාන නැතිවුණානම් මිනිස්සුන්ට ගොඩක් දුක්විඳින්න වෙනවා, මිනිස්සු මෙහෙම නොඉන්න තිබුණා. ජාත්‍යන්තර ආධාර ගොඩක් වටිනවා. රජයට තනිවම හැමකෙනෙක්ගෙම ඕනෑ එපාකම් බලන්න පුළුවන් කමක් නෑ"

-පුත්තලම ප්‍රදේශයේ අභ්‍යන්තර ව අවතැන්වූවන් බාරව කටයුතු කරන පරිපාලන නිලධාරියක්

"රාජ්‍ය නොවන සංවිධාන වඩා වැදගත් වන්නේ ඔවුන් වඩාත් කාර්යක්ෂම නිසා. ඒ වගේම ඔවුන් ප්‍රජාවට පේන්න දකින්න ඉන්නවා, රජය වගේ නෙමෙයි. රාජ්‍ය නොවන සංවිධානයන් විගණන කටයුතු වගවීම් වගේම හොඳ ප්‍රතිඵලත් පෙන්නුම් කරනවා"

-අනුරාධපුර ප්‍රදේශයේ පාසලක උප විදුහල්පතිවරයෙක්

"අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලින් හොඳ සේවාවක් සැපයෙනවා: ජල සැපයුම, කඳවුරු සඳහා වැසිකිලි ඉදිකිරීම, අභ්‍යන්තර ව අවතැන්වූවන්ගේ ලේඛන සකස් කර දීම, ගැටුම් බලපෑම් ලත් ජනතාවගේ උප්පැන්න සහතික සැකසීම ඉන් කිහිපයක්."

-මඩකලපුව ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා මානව හිමිකම් සුරැකීමේ කණ්ඩායමක කාර්යමණ්ඩල සාමාජිකයෙක්

"(රාජ්‍ය නොවන සංවිධානයක්) වැඩ කරන තැන්වල වෙනසක් වෙලා කියලා මං විශ්වාස කරනවා. පෙර පාසල් අංශයේ සැලකිය යුතු වැඩිදියුණු වීම් දකින්න පුළුවන්. බොහෝ දරුවන්ට ඉගෙනීමට ඉඩ සලසා තියෙනවා. පාසල් යැමම විතරක් නෙමෙයි, ඒ අයට හොඳ බඩු බාහිර හා සම්පත් ද ලබා දී තිබෙනවා. පාසල් වඩා හොඳ තත්වයකට ගේන්න අපට උපකාර කළේ මේ පිටස්තර ආධාර තමයි. පාසල් ගොඩනැගිලි ඉදිකර තිබෙන මෙම පෙර පාසල් පද්ධතියේ යහපත් බලපෑම් දිගු කාලීනයි. පොඩි පොඩි අඩුපාඩුකම් තිබුණත් මිනිසුන්ට ඒ දේවල් හරිගස්සා ගන්න පුළුවන්. මෙම ව්‍යාපෘති සාර්ථකත්වය ගැන රජයත් වටහා ගෙනයි ඉන්නේ. ඒවගේම ඊට උදව් කරන්නත් රජය පෙළඹී සිටිනවා."

-බදුල්ල නගරයේ පලාත් සභා නිලධාරියෙක්

"ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්ට එල්ටීටීඊය නිසා කරදරයි. ඒ අය රජයේ පැත්තෙනුයි එල්ටීටීඊය පැත්තෙනුයි දෙපැත්තෙන්ම පීඩනයට අහුවෙලා. රාජ්‍ය නොවන සංවිධානයන්ගේත් අඩු පාඩු තියෙනවා එත් ඒගොල්ලන්ගේ උත්සාහය හොඳයි. ඔවුන් නොහිටින්න, මරණ, නිරාහාරව සිටීම්, දුක්ගැහැට බොහෝමයක් ඇතිවෙන්න තිබුණා. මෙම උනන්දුව තවදුරටත් පැවතිය යුතුයි. රාජ්‍ය නොවන සංවිධාන ලංකාවට ඇවිත් ඉන්නේ අපගේ අවශ්‍යතා සපුරා දීලා අපගේ මිනිසුන් ගැටලුවලින් ගලවා ගන්න. ඇතැම් වේලාවට රජය මීට බාධාවක් වෙලා."

-මඩකලපුවේ ක්‍රිස්තියානි ආගමික නායකයෙක්

"(ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක්) මෙහි අවුරුදු 10ක් සේවය කළා. රෝහලේ එක් වාට්ටුවක් ඉදි කළේ ඔවුන්. ඉක්මනින් ඇවිත් ඉක්මනින්ම ගිය අනිත් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන එක්ක බැලුවහම (ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය) මෙහි එකදිගට අවුරුදු දහයහක් හිටියා;රෝහලට නව වාට්ටුවකුත්, පාසල්, එක් ගමකට පාලමකුත් පිරිසිදු ජලය සඳහා පහසුකම්නුත් ලබා දී තිබෙනවා. අනෙකුත් ප්‍රජාවන් එක්ක සසඳා බලන විට මෙහි ලොකු වෙනසක් තියෙනවා."

-බදුල්ල ප්‍රදේශයේ පිටිහි පාලත් සභා නිලධාරියෙක්

**(ආ). වේගවත්බව, තරඟකාරීත්වය, හා පුනරාවර්තනය**

සුනාමි ව්‍යසනයෙන් පසු සහනාධාර බෙදා දීම පිළිබඳ නැවත ආවර්ජනය කළ බොහෝදෙනා, කතාබහ වූයේ මෙම ආයතනයන් කඩිමුඩියේ ප්‍රතිචාර දැක්වීම වෙනුවට යම් කාලයක් මිඩංගු කර වඩාත් සුපරීක්ෂාකාරීව එය සිදු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවයි. භාණ්ඩ ඉක්මනින් බෙදා හැරීමත් ආධාර ඉක්මනින් වියදම් කිරීමට ඇති අවශ්‍යතාවය හා කැමැත්ත, බොහෝවිට ඉක්මන් තීරණවලට එළඹීමටත් දේශීය මට්ටමෙන් අනවශ්‍ය මැදිහත්වීම් සිදුවීමටත් හේතු වූ බව ජනතාවට හැඟී ගියේය. නැගෙනහිර ප්‍රදේශයේ ඇතැම් නැවත පදිංචි කිරීමේ ස්ථාන ඉදිකර ඇත්තේ ගංවතුර ඇති වන ප්‍රදේශයක බවත් ඉදිකිරීමට පෙර කිසිදු පාරිසරික තක්සේරුවක් සිදු කර නොමැති අතර දැන් කානු පද්ධති ඉදිකිරීමට බලවත් වෙහෙසක් දරන බවත් ජනතාව පෙන්වා දුන්හ. කිසිවෙකු පදිංචි ව නොමැති නව නිවාස පෙලක්ද භාවිතයට නොගත් ජල ටැංකිද පෙන්වමින් ජනතාවට උපකාරයක් නොවූ 'කඩිමුඩියේ' සිදු කළ බවට පෙනෙන පුනරුත්ථාපන ව්‍යාපෘති පිළිබඳ ඇතැම්මු කතාබස් කළහ. අවශ්‍යතා මෙන්ම පරිසරය තක්සේරු කිරීමට අවශ්‍ය කාලය ගනිමින්, ප්‍රාදේශීය බලධාරීන් හා ප්‍රජාවන් සැලසුම්කරණ කටයුතු සඳහා සම්බන්ධ කරගනිමින් සිදුකරන්නා වූ කටයුතු වඩා යහපත් ප්‍රතිඵල ගෙන එන බවටත්, එමගින් පාලනය, වගවීම හා විනිවිදබාවය යන යන්ත්‍රණයන් ශක්තිමත් වන බවටත් පොදු පිළිගැනීමක් ඇත.

"මෙහේ යම් කාලයක් සිටි රාජ්‍ය නොවන සංවිධානයන්ට මෙහි ප්‍රජාවන් එක්ක කටයුතු කරන්න ඕන ආකාරය ගැන අවබෝධයක් තිබෙනවා. නමුත් එක් සැනින් මෙහි පැමිණි රාජ්‍ය නොවන සංවිධාන ලොකු අවුලක් ඇති කළා, විශේෂයෙන්ම අලුතෙන් ආ රාජ්‍ය නොවන සංවිධාන. ඒ හැමෝටම ඕන වුනේ ගෙවල් හදන්න. මිනිසුන්ට ඇත්තටම අවශ්‍ය දේ වටහා ගැනීම අපහසු වෙන්න පුළුවන්. ඒ නිසා කලබල නොවී පරිස්සමෙන් කටයුතු කරන්න ඕන."

-අවුරුදු 15ක පළපුරුද්ද සහිත ශ්‍රී ලංකාවේ සහන සේවකයෙක්

"ඒගොල්ලන්ට (රාජ්‍ය නොවන සංවිධාන) ඕනෙ මෙහෙ ඇවිත් පුළුවන් ඉක්මනට ගෙවල් හදන්න. මෙහේ තියෙන්නේ වැලි පොළව. මෙහෙට ගැලපෙන්නෙ මොන වගේ ගෙවල්ද කියලා ඒ ගොල්ලන්ට අවබෝධයක් නෑ. අපිට තේරෙනවා ඒ ගොල්ලන්ට ඕනෙ අපට උදව් කරන්න කියලා. අපි ඒක බොහොම අගය කරනවා. නමුත් හැමදේම බොහොම කඩිමුඩියේ කිරීමෙන් සිදුවුනේ අනාදරයක්. ගෙවල් ඕන නැති අයටත් ගෙවල් ලැබුණා."

-මඩකලපුව ප්‍රදේශයේ ප්‍රාදේශීය සිවිල් සමාජ නායකයෙක්

"සහභාගීත්වය, ගැටුම් සංවේදීතාව වැනි යහපත් සංවර්ධන මූලධර්ම පිළිබඳ අපි දැන සිටියත් පශ්චාත් ව්‍යසන සහන සැලසීමේ කටයුතු ක්‍ෂණිකව සිදු කිරීමේදී මුදල් ඉක්මනින් වැය කිරීම සඳහා වූ අවශ්‍යතාවය නිසා මෙවැනි මූලධර්මයන්ට අනුව කටයුතු කිරීමට හැකි වූයේ සුළු පිරිසකට විතරයි. "

-ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමග හවුල්කාරත්වයන් ගොඩ නගා ගනිමින් කටයුතු කරන බදුල්ල ප්‍රදේශයේ දේශීය රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධානියෙක්

"දේශීය ක්‍රමයන් යොදාගැනීමට කාලය ගන්න. තාවකාලික නිවාස වැදගත් ඒ වගේම ඉක්මනට සපයන්න ඕනෙ. නමුත් ස්ථිර නිවාස වලට වැඩි කාලයක් ගත වෙනවා වගේම ඒවා නිවැරදිව ඉදි කරන්න ඕනෙ. ඉක්මන් නොවී හරියට කරන්න. "

-මඩකලපුව ප්‍රදේශයේ සුනාමි ව්‍යසනයට ලක් වූ ගම්මානයක ගම් වැසියෙක්

"සමහරක් වෙලාවට ව්‍යාපෘති සම්පූර්ණ උනත් ප්‍රතිලාභීන්ට එහි ප්‍රතිඵල ලැබී නැහැ. මේකෙන් වැටහෙන්නෙ ව්‍යාපෘතියේ අරමුණු ඉටු උනත් ප්‍රතිලාභීන්ගේ දායකත්වය හා ප්‍රතිඵල නොමැති බවයි."

-පුත්තලම ප්‍රදේශයේ සහන සේවකයෙක්

තරගකාරීත්වය නිසා ඇති වූ ගැටලු ප්‍රදේශ කිහිපයකින් ම අසන්නට ලැබිණි. පුත්තලම ප්‍රදේශයේ ජනතාව දකින ආකාරයට තරගකාරීත්වයේ එක් බලපෑමක් වූයේ සහන මැදිහත්වීම් සම්පූර්ණ කිරීමට උනන්දුවක් නොදැක්වීමයි. පහත නිදසුන ඒ සම්බන්ධයෙනි. "එක් රාජ්‍ය නොවන සංවිධානයක් යම් ගමක ඔවුන්ගේ ව්‍යාපෘති සිදු කරන අතරේ වෙනත් රාජ්‍ය නොවන සංවිධානයක් ඇවිත් ඔවුන්ගේ ව්‍යාපෘති පටන් ගත්තොත් මුල් සංවිධානය ඒ ගොල්ලන්ගේ සහන කටයුතු නතර කර ගමෙන් පිටවී වෙනත් තැනකට යනවා. ඒ තරගකාරීත්වය නිසා. අන්තිමේදී මේක බලපාන්නෙ ගමේ මිනිස්සුන්ට". අනුරාධපුර ප්‍රදේශයේ වැන්දඹු කාන්තාවක් මෙසේ පැවසූවාය. "රාජ්‍ය නොවන සංවිධාන ඇවිත් ඔවුන් එකිනෙකා එක්ක තරගකරමින් එකම වැඩ සටහන් සිදු කළා".

"එක සංවිධානයක් (රාජ්‍ය නොවන සංවිධානයක්) කඳවුරේ වගකීම ගත්තම ඒගොල්ලො අනිත් සංවිධානවලට කඳවුරට එන්න දෙන්නෙ නෑ. ඒකයි අපිට එච්චර ආධාර නොලැබුනේ."

-පුත්තලම අවට ප්‍රදේශයේ කඳවුරු වාසී අභ්‍යන්තරව අවතැන්වූවෙක්

සහන වැඩ සටහන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කළ හැකි ආකාරය පිළිබඳ උපදෙස් ද ඔවුහු ලබා දුන්හ:

"රාජ්‍ය නොවන සංවිධාන මීට ක්‍රියාකාරී විය යුතුයි. ප්‍රජාවගේ අවශ්‍යතා හඳුනාගත යුතුයි. ප්‍රායෝගික විය යුතුයි. අපට ඕනෙ සිද්ධාන්ත නෙවෙයි; ප්‍රායෝගික ප්‍රජා මූල වැඩ සටහන්"

-මඩකලපුව ප්‍රදේශයේ සහන ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු බාරව සිටින හමුදා නිලධාරියෙක්

බොහෝ ප්‍රදේශයන්හි ජනතාව ව්‍යාපෘති පුනරාවර්තනය ගැටලුවක් ලෙසත් එය සම්පත් නාස්තියක් ලෙසත් දකිති. මඩකලපුව ප්‍රදේශයේ ප්‍රාදේශීය රජයේ නිලධාරියෙක් මෙසේ පැවසීය. "සුනාමි ව්‍යසනයෙන් පසු ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන 160ක් හිටියා. ඔවුන් අතර සම්බන්ධීකරණයක් තිබුණේ නෑ. මේ නිසා එකම කටයුත්ත කිහිප දෙනෙක් අතින් සිදු කෙරුණා."

අනුරාධපුර ප්‍රදේශයේදී එක් ආයතනයක් පැමිණ අභ්‍යන්තරව අවතැන්වූවන්ට බාස්කට් බෙදා දුනි. පසු දින පැමිණි තවත් රාජ්‍ය නොවන සංවිධානයක් ඒ දෙයම සිදු කළේය. දැන් ගබඩා කාමරයක් පිරෙන්නට ගොඩ ගැසූ බාස්කට් තොගයක් ප්‍රජාව සතුය. මේ වනවිට අතැර දමා තිබෙන කිරි එක් රැස් කරන මධ්‍යස්ථාන පහක් සඳහා ආධාර සපයා ඉදිකර දුන් ප්‍රධාන පෙළේ විදේශ ආධාර කරුවකු පිළිබඳ තොරතුරු බෞද්ධ භික්ෂූන්වහන්සේ නමක් අපට හෙළි කළ සේක. කිරි එක්රැස් කිරීමේදී අතරමැදියන් මත යැපෙන ප්‍රදේශයේ ජනතාවට මෙම එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ඔවුන්ගේ අවශ්‍යතාවයක් ලෙස නොහැඟුනෙන් ප්‍රදේශයේ ඒ වන විටත් ක්‍රියාත්මක වන යන්ත්‍රණයක් තිබියදී මෙවැනි ආධාර සැපයීම පුනරාවර්තන කටයුත්තක් ලෙස ඔවුනට හැඟී යයි.

**(ඇ). ඉලක්ක ප්‍රදේශ හා ප්‍රතිලාභීන් තෝරාගැනීම**

පුත්තලම අවට ප්‍රදේශයන්හි කඳවුරුවල වෙසෙන ඇතැම් අභ්‍යන්තර අවතැන්වූවන් පවසන්නේ දේශපාලන බලපෑම් හේතුවෙන් බොහෝ ජාත්‍යන්තර ආධාර ගලා ගියේ පුත්තලම ප්‍රදේශයේ පිහිටි කඳවුරුවලට බවයි. තවත් පිරිසක් පවසා සිටියේ ඉලක්ක ප්‍රදේශ තෝරාගැනීම තීරණය වූයේ ආයතනයන්ට "පාරට කිට්ටුවෙන්" සිටීමට ඇති අවශ්‍යතාවය පදනම් කරගෙන බවයි.

"සංවිධාන (රාජ්‍ය නොවන සංවිධාන) ආධාර ලබා දෙන්නේ ඔවුන්ට පහසුවෙන් ළඟා වෙන්න පුළුවන් තැන්වලට විතරයි. ඒගොල්ලො ගම් ඇතුළට ඇවිල්ලා ඒවායේ ඉන්න අවතැන්වූවන්ට උපකාර කරන්නෙ නෑ. ඒ ගොල්ලො හොයන්නේ ආධාර දෙන්න පුළුවන් පහසු විධි. ඒ නිසා අපි වගේ මිනිස්සු හරිම අසරණයි."

-පුත්තලම ප්‍රදේශයේ දුෂ්කර ප්‍රදේශයක පිහිටි අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරක වෙසෙන කාන්තාවක්

"අපට ආධාර නොලැබුනේ ගමට ඇතුළු වෙන තැන ලොකු ලොකු ගෙවල් හදලා තිබුණ නිසා. ආධාර දෙන අය මේ ගෙවල් දැකලා ගම ඇතුළට එන්නෙ නැතුව හැරිලා යනවා."

-පුත්තලම අවට ප්‍රදේශයේ අභ්‍යන්තර අවතැන් කඳවුරක වෙසෙන තරුණ කාන්තාවක්

"තෝරාගත්ත අය සෑම විටම උපකාර ඕන කරපු අය නොවෙයි. ඒ අය තෝරගෙන තියෙන්නේ ලේසියටයි"

-අනුරාධපුර ප්‍රදේශයේ වැන්දඹු ප්‍රජා නායිකාවක්

"උපකාර අවශ්‍ය බොහෝ අය ඉන්නවා.අපටත් වඩා අමාරුකම් තියෙන අය ඉන්නවා. හැබැයි අපිව තේරිලා. අපි ලැබුණ අවස්ථාව නැති කරගන්නෙ නැහැ. මේ ගමට කිලෝමීටර පහක් විතර එහායින් තවත් ගමක් තියෙනවා. ඒ අය හරිම දුප්පත්. කිසිම ආධාරයක් ලැබිලත් නැහැ. ප්‍රදේශීය බලධාරීන් කැමතියි ඔවුනුත් මේ ආධාර ලබා ගන්නවානම්. නමුත් ඔවුන්ගේ අවශ්‍යතා පැහැදිලි කරගන්න ක්‍රමයක් වත් ඊට අවශ්‍ය දැනුමවත් ඔවුන්ට නැහැ."

-අනුරාධපුර ප්‍රදේශයේ කඩහිමියෙක්

"කොළඹ ඉන්න දේශපාලන නායකයින් පිටස්තර ආධාර ඔවුන්ගේ උපන්ගම් වෙත යොමු කරනවා. ආධාරක ආයතන ජාතික රජයට පැමිණි විට ඔවුන්ද ඒ ඒ පලාත්වලට යොමු කරනවා. බොහෝ රාජ්‍ය නොවන සංවිධාන අනෙකුත් දිස්ත්‍රික්කයන්හි එක්රැස් වෙලා ඉන්නේ ආධර දේශපාලනීකරණය වූ නිසා. එක්කො ඒ අයට ඕනෙ යුද බලපෑම් ලත් අයට උපකාර කරන්න විතරයි, එහෙම නැත්නම් රජය විසින් ඒවා වෙනත් තැන් වලට යොමු කරවලා"

-ඌව පලාතේ වතු ද්‍රවිඩ ජනතාව සමග කටයුතු කරන ප්‍රජා මූල සංවිධාන නායකයෙක්

"පොදුවේ කාන්තාවන්ද විශේෂයෙන් වැන්දඹු කාන්තාවන්ද කිසිදු ක්‍රමෝපායක් මගින් ඉලක්ක රක ඇති බවක් පෙනෙන්නේ නෑ. අපි මෙම ඉලක්ක කණ්ඩායම් සමග කටයුතු කරත් සංවර්ධනය සඳහා දායකත්වය සපයන්නන් ලෙස ඔවුන් සතු හැකියාව වටහාගෙන නෑ. ඇතැම් වැඩ සටහන් කාන්තාව පවුල තුළ කරන කාර්යභාර්ය පිළිබඳ ගැඹුරින් සලකා බලා නෑ. උදාහරණයක් විදිහට ගත්තොත් කාන්තාවන් සඳහා වූ සංවර්ධන වැඩ සටහන් එම කාන්තාවන් අදාළ වැඩ සටහන සඳහා වැඩි කාලයක් මිඩංගු කරන්නේයැයි අපේක්ෂා කරනවා. එමගින් බොහෝ විට සිදු වන්නේ කාන්තාවගේ පවුලේ කාර්යභාර්ය සඳහා වූ අවස්ථාව කැප කිරීමට සිදු වීමයි."

-කොළඹ ජාත්‍යාන්තර රාජ්‍ය නොවන සංවිධානයක වැඩ සටහන් නිලධාරියෙක්

සියලුම සවන්දීමේ කණ්ඩායම්වලට ප්‍රතිලාභීන් තෝරාගැනීම පිළිබඳ බොහෝ දෑ අසන්නට ලැබිණි. ඇතැම්හු එය සාධාරණ හා යෝග්‍ය අයුරින් සිදුවූ බැව් ඔවුන්ගේ අත්දැකීම් ඇසුරෙන් පැවසූහ. ගාල්ල ප්‍රදේශයේ සුනාමි ව්‍යසනයට ලක් වූ ගම් වැසියෙක් කියා සිටියේ, "අවදානමට ලක් වු බාණ්ඩය තීරණය කළේ ජනතාවමයි. ඔවුන් ජනතාවගෙන් ඉල්ලා සිටියා ඒ ඒ අයව බාණ්ඩ කරන ලෙස. ඔවුන් මෙය කළේ සියල්ලන් ඉදිරිපිට. මිනිසුන්ට මෙසේ ඔවුන්ව ද දායක කරගෙන කටයුතු කරපු එක ගැන සතුටුයි. එය හරි විදිහට කෙරුණා." කෙසේවෙතත් බහුතරයකගේ අදහස වූයේ ප්‍රතිලාභීන් තෝරාගැනීමට යොදාගන්නා නිර්ණායකයන් හා ක්‍රියාවලිය වඩාත් පැහැදිලිව විස්තර කළ යුතු බවත් එය වඩාත් විනිවිදබාවයෙන් හා සහභාගීත්වයෙන් යුක්ත විය යුතු බවත්ය. මෙම අදහස් හා නිර්දේශයෙන් හදිසි ආපදා සහනාදාර ලැබුණු ස්ථාන මෙන්ම දිගු කාලීන සංවර්ධන සහනාදාර සැපයූ ස්ථාන යන ස්ථානයන්

දෙකෙහිදීම ඉදිරිපත් විණි. බොහෝ පුද්ගලයින් ඇසුවේ ආධාරක ආයතනයන් දේශීය වශයෙන් යෝග්‍ය අවදානම් නිර්ණායකයන් අඩුවෙන් යොදාගන්නේ ඇයිද යන්නයි.

බදුල්ල ප්‍රදේශයේ මවුවරුන් කිහිප දෙනෙක් ඔවුනට වැටහුණු ආකාරයෙන් තෝරාගැනීමේ පටිපාටිය විස්තර කරන්නට වූහ. එක් ආයතනයක කාර්යමණ්ඩලය ප්‍රදේශයට පැමිණ නිවස ඉදිරිපිට එහි සාමාජිකයින් හිඳුවා ඡායාරූප ගන්නා අතර ඉන්පසු එම ඡායාරූප ප්‍රධාන කාර්යාලයේ සිටින වෙනත් තැනැත්තෙකු නරඹා 'වඩාත් දුප්පත්' ලෙස පෙනෙන පවුල් තෝරා ගැනේ. මෙම ක්‍රමය සාධාරණ නොමැති බව ඔවුහු පෙන්වා දුන්හ. අනුරාධපුර ප්‍රදේශයේ ගම් වැසියෙක් ද මේ හා සමාන අදහසක් ඉදිරිපත් කළේය. "ප්‍රතිලාභීන් තෝරාගැනීමට යොදාගන්නා නිර්ණායකයන් පැහැදිලි නැහැ. විශේෂයෙන්ම ඡායාරූප යොදාගනිමින් අනුග්‍රාහකත්ව වැඩ සටහන් සිදු කරන සංවිධානයන්වල."

"සංවිධාන සෑම නිවසක් වෙතම ගොස් ඔවුන්ගේ අවශ්‍යතා හා ධාරිතාවන් හඳුනාගෙන ඉන්පසු සහාය දැක්විය යුත්තේ කාටද යන්න තීරණය කළ යුතුයි."

-බදුල්ල ප්‍රදේශයේ දෙදරු මවක්

"ඒ ගොල්ලො ඇවිල්ල විස්තර එකතු කරගන්නවා, ගොඩක් වෙලාවට වියළි ආහාර තමයි බෙදා දෙන්නෙ. ඒගොල්ලො පවුලක කීදෙනෙක් ඉන්නවද කියලා හොයලා බලන්නෑ. දෙන්නෙක් ඉන්න පවුලටයි ළමයි 10 දෙනෙක් ඉන්න පවුලටයි දෙකටම ලැබෙන්නේ එකම ප්‍රමාණය."

-මඩකලපුව ප්‍රදේශයේ කාන්තා සමාජයක් තරුණ ස්වේච්ඡා සේවිකාවක්

"ඉස්සර හිටපු කඳවුරේදී අපිට ගොඩක් සංවිධාන සේවාවන් ලැබුණා. මෙහෙ ඒච්චර නෑ. අනිත් සංවිධාන උදව් කරන්නෙ පොඩි කණ්ඩායම් වලට. මේ කඳවුර තමයි ලොකුම එක. සංවිධාන ගණනත් සීමිතයි. පොඩි කණ්ඩායම්වලට කෑම දෙන්න ලේසියි. මෙහෙට ආවොත් හැමදෙනාටම එක වගේ සලකන්න වෙනවා. ඒක කරන්න බෑ"

- මඩකකලපුව දිස්ත්‍රික්කයේ අභ්‍යන්තර අවතැන්වූවන් ගේ කඳවුරක වැසියෙක්

"අපි ජාත්‍යන්තර සංවිධානයන්ගෙන් ඉල්ලා සිටින්නේ දුප්පත්, උපකාර අවශ්‍ය අයට උපකාර කරන්න කියලා. ඉස්සෙල්ලා මෙහෙට අවිත් හරි ලැයිස්තුවක් ගන්න කියලයි අපි කියන්නෙ"

-පුත්තලම අවට පිහිටි ගමක ගම්වැසියෙක්

**(ඈ). යෝග්‍යතාවය හා සපයන ආධාරයන්හි ගුණාත්මකබාවය**

ලබා දුන් ආධාර ප්‍රජාවගේ අවශ්‍යතාවන්ට නොගැලපුණු බව ඇතැම් පුද්ගලයෝ දක්වා සිටියහ. එමෙන්ම ඇතැම්හු එම ලබා දුන් ආධාරයන්හි දුර්වල තත්වය පිළිබඳව ද පැවසූහ. අනුරාධපුර ප්‍රදේශයේ පාසලක උප විදුහල්පතිවරයෙකු අප සමග කියා සිටියේ සුනාමි සඳහා ලබා දීමට යෙදුණු අතිරික්ත ආධාර ප්‍රමාණය වෙරළ තීරයට ඔබ්බෙන් පිහිටි ඔවුන්ගේ ප්‍රදේශයට බෙදා දුන් බවත් බෝතල් කළ පානීය ජලය හා ඖෂධ වැනි ඇතැම් දෑ කල් ඉකුත් වූ ඒවා වූ බවත් ඒවා පරිහරණය කළ පාසල් ශිෂ්‍යයන් රෝගී වූ බවත්ය. සුනාමි බලපෑමට ලක් නොවූ ප්‍රදේශයන්ට දෙවැනි කොට නොසලකන ලෙස ඔහු කියා සිටියේය.

“සමහර කඳවුරුවල වැසිකිලි හදලා තියෙන්නේ ළිං අසළින්. එමගින් ළිං ජලය අපිරිසිදු වීමෙන් ලෙඩ පැතිරෙන්න පටන්ගත්තා”

-පුත්තලම ප්‍රදේශයේ ප්‍රාදේශීය පර්යේෂණ ආයතනයක කාර්යමණ්ඩල සාමාජිකයෙක්

“ඒගොල්ලන්ගෙ (ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන) වැඩ හොඳ තත්වයේ තියෙන්න ඕන. ඉංග්‍රීසීන් මීට කාලාන්තරේකට කලින් පාරවල්, රේල් පාරවල් හැදුවා, අදටත් ඒවා පාවිච්චි කරනවා. අපිට ඕනේ මේ වගේ හොඳ යටිතලපහසුකම්, සවුත්තු පාරවල් ගොඩක් තිබුණත් වැඩක් නෑ.”

-බදුල්ල ප්‍රදේශයේ ගොවියෙක්

“අපේ ගෙවල් වලට අවිත් බලන්න. හරක් දුන්නා, පොල් පැල දුන්නා. ඒත් හරකුන්ට තණකොළ කවන්න තැනක් අපිට නැති නිසා අපිට උන් විකුණලා දාන්න සිද්ද වුණා. පොල් පැල ඉන්දුවේ නෑ ඒවා ඉන්දන්න තැන් නැති නිසා. හැබැයි සමහරක් සංවිධානනම් හරියට ඒගොල්ලන්ගේ වැඩ සටහන් සැලසුම් කරල තිබුණා. ”

-මඩකලපුව ප්‍රදේශයේ සුනාමි බලපෑම් හේතුවෙන් නැවත ඉදිකළ ප්‍රජාවක වෙසෙන වැසියෙක්

“ආධාර දෙනකොට මිනිස්සුන්ගේ රස්සාවල් ගැනත් හිතන්න ඕනෙ. එතකොට ඒ අයට ඒවා දියුණු කරගන්න පුළුවන්. මිනිස්සුන්ට ඕන උනේ තේ කර්මාන්ත ශාලාවක්. ඒකට සංවිධාන ඇවිත් කොහු කර්මාන්ත ශාලාවක් හදලා හරියන්නෙ නෑ”

-ගාල්ල (උතුර) ප්‍රදේශයේ වතු කම්කරුවෙක්

“ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලින් පවත්වනු ලබන වෘත්තීය පුහුණු වැඩ සටහන් බොහෝමයක් දේශීය රැකියා වෙළඳ පොළ හා යා වෙන්නේ නැහැ. තරුණයින්ට ලබා දී ඇත්තේ ඔවුනට යොදාගැනීමට නොහැකි කුසලතාවයන්. මේ ඒකට උදාහරණයක්. මේ ප්‍රදේශයේ ජල නල කාර්මිකයින්ගේ හා නිවෙස් ඉදිකරන්නන්ගේ හිඟයක් තියෙනවා. මෙහේ ජල නල හා නිවෙස් ඉදිකිරීමේ වැඩ සියල්ල කරන්නේ අසල් වැසි පලාත්වල අය. මේ කුසලතා වර්ධනය කිරීමට කිසිම වෘත්තීය පුහුණුවක් පවත්වා නැහැ. මේ වාහන වයරින් වැඩ කරන අය නැහැ. නමුත් ඒවට කිසිම පුහුණුවක් ලබා දීමට කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒත් ඒ ගොල්ලන් ලබා දෙන්නේ පරිගණක පුහුණු. ඉහළ පාසල් හැර යාමේ තත්වයත් එක්ක මෙය ප්‍රයෝජනවත් නැහැ”

-ඌව පලාතේ ඉන්දියානු සම්භවයක් සහිත වතු ද්‍රවිඩ ජනතාව සමග කටයුතු කරන ප්‍රජා මූල සංවිධානයක ප්‍රධානියෙක්

**(ඉ). දිගු කාලීන මැදිහත්වීම් හා කෙටි කාලීන ව්‍යාපෘති**

කෙටි කාලීන ව්‍යාපෘතිවලට වඩා දිගු කාලීන සංවර්ධන මැදිහත්වීම් වඩාත් ප්‍රයෝජනවත් බව සෑම පලාතකම බොහෝ දෙනෙකු හට හැඟී ගියේය. විශේෂයෙන්ම, බොහෝ පිරිසක් කියා සිටියේ ආධාරක ආයතන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්ට යටිතලපහසුකම් සංවර්ධනය, පුහුණු වැඩ සටහන් හා අධ්‍යාපනය යන අංශයන්ට වැඩි දායකත්යක් ලබා දුන්නේනම් වඩා යහපත් බවයි. මිනිසුන් පැවසූයේ දිගු කාලීන දැක්මක් සහිතව දිගු කාලයක් තුළ රටෙහි රැඳෙන සංවර්ධන ආයතනයන්, ප්‍රජාව සංවර්ධන කාර්යයන් කෙරෙහි දායක කරගැනීම වඩාත් ඵලදායීවන බවත් සංවිධානයන් රටින් පිටව යන අවස්ථාවේදී පූර්ණ හිමිකාරත්වය ප්‍රජාවට ලබා දිය හැකිබවත් එම වගකීම දැරීමට ප්‍රජාවට සූදානම් විය හැකිබවත් ප්‍රජා මතයයි.

"සංවිධාන (රාජ්‍ය නොවන සංවිධාන) වැඩ කටයුතු අපේ ඉදිරි පරම්පරාවට ගැලපෙන්න ඕනෑ. ඉගෙනීම, වගා කටයුතු, රැකියා පුහුණු, යටිතලපහසුකම් වගේ දේවල් වලට වැඩියෙන් අවධානය යොමු කරන්න ඕන. ආයතන වඩාත් සාර්ථක වන්නේ ගොවීන් අනුගමනය කරන ක්‍රමයන්ට වඩා වෙනස් විකල්ප ජීවනෝපාය ක්‍රමෝපායන් පිළිබඳ පුහුණුවක් සපයන විටදීයි. එය ඉදිරි සැලසුම් සඳහා මෙවලමක් වනවා."

-අනුරාධපුර ප්‍රදේශයේ ගැමි කාන්තාවක්

"(ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක්) මෙහේ ඇවිත් සල්ලි ටිකක් දීලා යන්න ගියා. ඒකෙන් අපි ශක්තිමත් වෙන්නේ නෑ. (තවත් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක) වැඩ සටහනකින් අපිට පුහුණු, ක්ෂුද්‍ර මූල්‍ය හා ණය සපයා දුන්නා. එමගින් අපේ ආර්ථිකය ශක්තිමත් වීමට උපකාරයක් වුණා."

-බදුල්ල ප්‍රදේශයේ ගැමි කාන්තාවක්

"ප්‍රජාවන්ට හිමිකාරත්වය ලබා දීමට සැලසුම් කිරීමේ ප්‍රධානතම මෙවලම වන්නේ දිගු කාලීන වැඩ සටහන්. නමුත් බොහෝ ව්‍යාපෘති කෙටි කාලීන ව්‍යාපෘති; සංවිධාන එනවා, ඒ ගොල්ලන්ගෙ ව්‍යාපෘති කරනවා, ආපහු යනවා, කෙටි කාලීන ව්‍යාපෘති කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ආයතන, ශ්‍රී ලංකාවේ දැනටමත් අපි මුහුණ දෙන අනුන් මත යැපීමේ තත්වයට තවත් රුකුල් දෙනවා"

-අනුරාධපුර ප්‍රදේශයේ වෙසෙන බෞද්ධ භික්ෂූන්වහන්සේ නමක්

"මෙහේ තිබෙන සුළු මුදල් ප්‍රමාණය ව්‍යාපෘති මූලිකවයි තියෙන්නෙ. මාස හයකට හෝ වසරකට වැනි සීමිත කාලයකට. මේ වගේ කෙටි කාලයකින් තිරසාර සංවර්ධනයක් හෝ ධනාත්මක වෙනසක් හෝ ළඟා කරගන්නෙ කොහොමද "

-ඌව පලාතේ මුස්ලිම් කාන්තා කණ්ඩායමක නායිකාවක්

"මේ මිනිසුන්ගේ සංවර්ධනයට සහාය වීමටත් ඔවුන්ගේ තත්වය නගා සිටු වීමටත් අපි හැමෝම, ඒ කියන්නේ සංවිධානත් අනෙකුත් ජනතාවත් බොහෝ වෙලාවට 'පිටතින්' ඇවිත් තාවකාලික පිරියම් ඉදිරිපත් කරනවා. මේ කුඩා ව්‍යාපෘති කළමනාකරණය කරන්න පහසුයි ඒ වගේම ව්‍යාපෘති අරමුණු කෙටි කාලයක් තුළදී ළඟා කරගන්න පුළුවන්. නමුත් මිනිසුන්ගේ සංවර්ධනයට අවශ්‍ය වනනේ ඔවුන්ගේ මූලික ගැටලු කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමයි. ඊට ආකල්ප වෙනස්කිරීම්, නිර්මාණශීලීත්වය හා බලගැන්වීම අවශ්‍ය වෙනවා. මෙම අගයන් හා ශක්තීන් ගොඩනැගීමටත් දිගු කාලයක් අවශ්‍ය වෙනවා ඒ වගේම පහසුවෙන් අපගේ වාර්තාවන්හි වාර්තා කරන්නත් බැහැ."

-බදුල්ල ප්‍රදේශයේ කතෝලික පූජකවරයෙක්

සංවිධානයන් ඔවුන්ගේ සහාය සැපයීමේදී ඒවා වඩා දිගු කාලීන වෙනසක් ඇති කිරීම කෙරෙහි වැඩි අවධානයක් හා කැපවීමක් දරන ලෙස පුත්තලම ප්‍රදේශයේ ජනතාව සංවිධානයන්ගෙන් ඉල්ලා සිටියහ. එක් පුද්ගලයෙක් පැවසූයේ "උපකාර කරන සංවිධාන මිනිසුන්ගේ ජීවිතවල සැබෑ වෙනසක් ඇති කරන්න උත්සාහයක් ගත්තේ නෑ."

විපත් බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි වඩාත් සුලබව දැකිය හැකි කරුණක් වූයේ මිනිසුන් හුදෙක් භාණ්ඩ ලබා ගැනීමට වඩා ඔවුන්ගේ ජීවනෝපායන් යළි යථා තත්වයට පත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බවයි. භාණ්ඩ ලබා ගැනීම බොහෝ විට වෙහෙසකාරී හා වරදට

යොමු විය හැකි ක්‍රියාමර්ගයකි. දිගු කාලීන සහායක් ඉන් සැලසෙන්නේ නැත. ජනතාව ඔවුන්ගේ ජීවනෝපාය වැඩි දියුණු කරගැනීම  පිළිබඳ බලාපොරොත්තු ඉටු නොවීමෙන් කනස්සල්ලයට පත්ව සිටිති. නිදසුනක් ලෙස ගාල්ල ප්‍රදේශයේ කකුළුවන් ඇල්ලීමෙහි (වැඩි ආදායමක් ඉපයිය හැකි රැකියාවක්) දක්ෂ සපත්තු සාදන්නෙකු (අඩු ආදායම් රැකියාවක්) යම් ආයතනයකින් ධීවර උපකරණ ඉල්ලා ඇතත් ඔහුගේ ඉල්ලීම එම ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබිණි. සුනාමි ව්‍යසනයෙන් පසු ඔහුට සපත්තු සාදන මෙවලම් කට්ටලයක් ලබා දී ඇති අතර ඔහු එය දකින්නේ ඔහුගේ ජීවනෝපාය ඉහළ නංවා ගැනීමට හැකිවූ අවස්ථාවක් ගිලිහීයාමක් ලෙසයි.

"අපිට පිඟන්, කෝප්ප, වියළි ආහාර ද්‍රව්‍ය බොහෝමයක් ලැබුණා. ඒත් මේ සංවිධාන ඒ වෙනුවට අපිට ජීවනෝපාය සවි කරගන්න මුදල් දෙන්න හිතුවා නම් මීට වඩා හොඳයි."

-ගාල්ල ප්‍රදේශයේ සුනාමි බලපෑම් ලද ගමක අඹු සැමි යුවළක්

"මේ ආහාර දෙන එක නවත්තන්න ඕනෙ. ඒ සල්ලි යටිතලපහසුකම් සංවර්ධනයට යොදවන්න ඕන. ගම් වැසියන් 75% ක් පමණ හැම මාසෙකම වියළි ආහාර ද්‍රව්‍ය ලැබෙනවා එත් තවමත් ඒ අයට දුප්පත්කමෙන් ගොඩ එන්න බැරිවෙලා. පවුල් ඒ ගොල්ලන්ගේ ආර්ථික සංවර්ධනය ඒගොල්ලන්ගෙ අතට ගන්නවා නම් සැබෑ වෙනසක් ඇති කරන්න පුළුවන් වේවි."

-බදුල්ල ප්‍රදේශයේ ප්‍රජා වැසියෙක්

<u>සවන්දීමේ කණ්ඩායමේ සිතා බැලීම්</u>

ආධාර ආයතනයන් ලබා දෙන ආධාර ප්‍රජාවන්ගේ අවශ්‍යතාවන්ට යෝග්‍ය නොවීමට හේතු මොනවාද යන්න සවන්දීමේ කණ්ඩායම සිතා බැලීය. දේශීය ආයතන කාර්යමණ්ඩලයන්ගෙන් විමසීමකින් හෝ ප්‍රජාවන්ගේ අවශ්‍යතා පිළිබඳ තොරතුරු ලබා ගැනීමකින් හෝ තොරව, ප්‍රජාවට පරිභාහිරින් සිටින්නා වූ පුද්ගලයෙකු විසින් "ප්‍රජාවට වඩාත් සුදුසු යැයි ඔවුනට සිතෙන දෑ තෝරා" ආධාර ලෙස ලබා දීමේදී යම් මට්ටමක අහංකාරබවක් පවතින බව යෝජනා විය. වඩාත් වගකීමෙන් යුතු හා යෝග්‍ය මැදිහත්වීමක් සඳහා ප්‍රජාව පිළිබඳ හොඳ වැටහීමක් තිබිය යුතු බවත් මෙම මැදිහත්වීමේ අවසාන ප්‍රතිලාභීන් වන්නේ ජනතාව බැවින් ඔවුන්ගේ තොරතුරු ගෙන උපකල්පනයන් හා සසඳා බැලීමේ හැකියාව තිබිය යුතු බවත් කණ්ඩායම් සාමාජිකයින්හට වැටහී ගියේය.  ආධාර ලබාගන්නා ප්‍රජාවන්හි ජනතාව යම් නිශ්චිත සම්පත් ඔවුනට අවශ්‍ය බව ද ඔවුනට ලැබෙන ආධාරයන්ගෙන් කුමක් කළ යුතු ද යන්න තීරණය කිරීමේදී යම් ස්වාධීනත්වයක් අවශ්‍ය බවද පැහැදිලි කළහ. බොහෝවිට, බාහිර මැදිහත්වීම් කඩිමුඩියේ සංවිධානය කළ ඒවා වන අතර ආයතන ජනතාවගේ කැමැත්තට ගරු නොකරනවා මෙන්ම ඔවුනට තෝරා ගැනීමක් ද ලබා නොදෙයි.

දිගු කාලීන සංවර්ධනය පිළිබඳ ජනතාවගේ අරමුණු හා අවශ්‍යතාවන්ට ගරු නොකරමින් සිදු කෙරෙන බාහිර මැදිහත්වීම් පිළිබඳව ද ඇතැම් කණ්ඩායම් සාමාජිකයෝ සිය අවධානය යොමු කළහ. එක් කණ්ඩායම් සාමාජිකයෙක් පැවසුයේ "අපි ඇතැම් වෙලාවට ඔවුන්ගේ ප්‍රදේශයට යන්නේ ඔවුන්ට තිරසාරබව ගැන අවබෝධයක් නැතැයි ද ඒ සඳහා ඔවුනට හැකියාවන් ගොඩ නැගිය යුතු යැයි ද සිතමින්. නමුත් බොහෝ ප්‍රජාවන් ආධාරවලින් ලබා ගත හැකි දිගු කාලීන ප්‍රතිලාභ පිළිබඳ ඔවුන්ගේ නිශ්චිත අපේක්ෂාවන් අප සමග පැවසුවා. අපේ මැදිහත්වීම් වලින් ඔවුන් වඩා තිරසාරබවක් බලාපොරොත්තු වුණා."

ජාත්‍යන්තර ආධාර සපයන ආයතනයන්හි අරමුණු හා එම සහාය ලබාගන්නා ප්‍රජාවන්හි අරමුණු අතර ඇති මේ වෙනස මගින් පැහැදිලි කරන්නේ කුමක්ද? තිරසාරබව යන්න පිළිබඳ පොදු අවබෝධයක් තිබේද? තිරසාර වෙනසක් බිහි කිරීම සඳහා උපකාරී වන්නේ කුමන ආකාරයේ අන්තර්ක්‍රියාකාරකම් හා මැදිහත්වීම් ද ප්‍රගතියක් සිදුවී ඇත්ද යන්න මැන බැලිය හැක්කේ කෙසේද යන්න පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි අප සතුව තිබේද? බොහෝ ජාත්‍යන්තර හා දේශීය ආයතන මෙම ගැටලු හා සටන් කරන අතර ඇතැම් සංවිධාන පසුගිය හා වත්මන් මැදිහත්වීම් මගින් ඇති වූ ප්‍රතිඵල හා ඒවායේ සාර්ථකත්වය මැන බැලිය යුතු ආකාරය පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා ආධාර ලබන්නන්ට වඩාත් ක්‍රමවත්ව සවන් දීමට පෙළඹී ඇත.

2. ආධාරකරුවන්ගේ න්‍යායපත්‍රයන්, රාජ්‍ය නොවන සංවිධානයන්හි කාර්ය පටිපාටීන් හා ප්‍රමුඛතා

දේශීය රාජ්‍ය නොවන සංවිධානයන්හි හා ප්‍රජා මූල සංවිධානයන්හි කාර්යමණ්ඩල සමග කළ බොහෝමයක් සාකච්ඡා මගින් හැඟී ගියේ බලාපොරොත්තු කඩ වූ හැඟීමකි. ඒ ජාත්‍යන්තර ආධාරකරුවන් ද එම ආධාරකරුවන්ගේ ආධාර ලබා ගන්නා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්හිද "දරදඬු කාර්ය පටිපාටීන්" හා "දේශපාලනික ප්‍රමුඛතාවන්" හේතුවෙනි. ඌව පලාතේ වතු ද්‍රවිඩ ජනතාව සමග කටයුතු කරන ප්‍රජා මූල සංවිධාන නායකයෙක් මෙසේ පැවසීය. "සමහරක් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට ඒ අය කටයුතු කරන ප්‍රදේශ ගැන තියෙන්නේ ඉතා අඩු දැනුමක්. අපේ දේශීය වැඩ සටහන් ප්‍රමුඛතාවයන්, ඒ වැඩ සටහන් සඳහා මූල්‍යාධාර සපයන ආධාරකරුවන්ගේ ප්‍රමුඛතාවයන් හා ආධාර සීමාවන්ට යටත්ව සිදු විය යුතුයි. අප ඒ අයගේ ක්‍රියා පටිපාටීන්ට කොටු වෙලා ඉන්නේ: ඒ සාමයගොඩනැගීම, සිවිල් දේශපාලනය, ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය හා පාලනය. පිටස්තර ආධාරකරුවන්ගේ දැඩි අරමුණු එක්ක අපේ අරමුණු ගැටෙන අවස්ථා තිබෙනවා."

"අපි හැමෝම දන්නවා අපි ප්‍රජාවගේ සත්‍ය අවශ්‍යතාවන් ඉලක්ක කරමින් ඒවාට පිළියම් සෙවිය යුතු බව. අපි කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අප නිතරම වෙහෙසෙන්නේ දේශීය අවශ්‍යතා හා ආධාර කරුවන්ගේ සීමාවන් අතර සමබරතාවයක් ඇති කරමින් කටයුතු සිදු කරන්නයි."
-ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා ආධාරකරුවන්ගෙන් ආධාර ලබා ගන්නා දේශීය රාජ්‍ය නොවන සංවිධානයක වැඩ සටහන් කළමනාකරුවෙක්

ගිවිසුම් සඳහා එළඹීමේදී ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්හි හා ආධාරකරුවන්ගේ නම්‍යතාවය මඳකම ඔවුන්ගේ අහංකාරකමක් ලෙස විස්තර කෙරෙන අතර දේශීය රාජ්‍ය නොවන සංවිධානයන් හා ප්‍රජා මූල සංවිධානයන් ඔවුන්ගේ වැඩ සටහන් අවශ්‍යතා කේවල් කිරීමේදී හා සංස්කෘතිකමය වශයෙන් යෝග්‍ය මැදිහත්වීම් සඳහා උපදෙස් සැපයීමේදී ඔවුන්ගේ බලරහිතබාවය පිළිබිඹු කෙරේ.

ප්‍රධාන ආධාරකරුවකු යටතේ ආධාර ලබන නිවාස ව්‍යාපෘතියක සේවයේ නිරතව සිටින පුත්තලම ප්‍රදේශයේ සහන සපයන්නෙකු කියා සිටියේ ඔහු නිරතව සිටින එක් ව්‍යාපෘතියක් 'නිවසට නිවසක්' යන පදනම යටතේ නිවාස ලබා දෙන බැවින් කිසිදු ආකාරයේ නිවෙසක් නොමැති ජනතාව එම ව්‍යාපෘතියෙන් බැහැර වෙන බවයි. තවත් ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර ආධාර ආයතනයක් මෙම ව්‍යාපෘතිය සඳහා මූලික අවශ්‍යතා සමීක්ෂණයක් සිදු කර ඇති නමුත් එම සමීක්ෂණය එක්රැස් කරගත් තොරතුරු නිවැරදි නොවේ. ඔහු තව දුරටත් කියා සිටියේ "

අවසානාවකට අපට ආධරකරුගේ සමීක්ෂණයට අනුව ව්‍යාපෘතිය කරන්න සිද්දවෙලා තියෙනවා. මේක ආධාරක ආයතනයේ තාක්ෂණික දෝෂයක්, සමීක්ෂණ කණ්ඩායම එතරම් හොඳ නැහැ, ප්‍රධානතම ගැටලුව උනේ ඒකයි. සමීක්ෂණයේ වැරැද්දක් සිද්දවෙලා තිබෙන බව දැන් අභ්‍යන්තර ව අවතැන්වූවනුත් දන්නවා. අපි ළඟට එන්නේ මේ සමීක්ෂණයෙන් නොසලකා හැරුණු අයයි. මුලදී ඒ අය හිතුවේ අපි ඒගොල්ලන්ගේ අයිතීන්ට සීමාවන් පනවනවා කියලා."

"වඩාත් හොඳින් ඉලක්ක ගත කිරීමෙන් වැඩි යහපත් බලපෑම් අත් කරගන්න පුළුවන්. බොහෝ සංවිධානයන්ට තියෙන්නේ තරුණ ජන කොටස් වගේ ජනගහනයේ එක් විශේෂ කොටසක් පිළිබඳ ව යොමු වූ අවධානයක්. සංවිධානයන් එන්නේ පූර්ව නිශ්චිත ක්‍රියා පටිපාටීන් සමගයි. බොහෝ තීරණයන් ගැනෙන්නේ මතුපිටින් පෙනෙන ජාතික විශ්ලේෂණයන්ට අනුවයි."

-කොළඹ ප්‍රදේශයේ පිහිටි ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක වැඩ සටහන් කාර්යමණ්ඩල සාමාජිකයෙක්

**(අ). යුද බලපෑම් ලත් හා සුනාමි බලපෑම් ලත්**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා නැගෙනහිර ප්‍රදේශයේ අභ්‍යන්තර ව අවතැන් වූ පුද්ගලයින් මෙන්ම සුනාමි බලපෑම් ලද නැගෙනහිර හා දකුණු ප්‍රදේශයේ ජනතාව ද ඔවුන්ගේ ප්‍රදේශයන්හි දැඩි අවශ්‍යතාවක් වූ සහන හා මානුෂීය සහාය ලබා දීම වෙනුවෙන් සිය කෘතඥතාවය පළ කළහ.

"රජය මගින් උතුර හා නැගෙනහිර නොසලකා හැරලයි තිබුණේ. ජාත්‍යන්තර සහාය නොතිබුණානම් මඩකලපුවේ ජනතාව දුප්පත්කමින් හා කුසගින්නෙන් පෙළෙන්න තිබුණා. මිනිස්සු අද ජීවත්වෙලා ඉන්නේ ජාත්‍යන්තර ආධාර වලට පින් සිද්ද වෙන්න. ප්‍රදේශයේ සංවර්ධනයත් මේ නිසා වැඩි දියුණු වෙලා. ජාත්‍යන්තර ආධාර නැති වුණා නම් රජයෙනුත් කොන් වුණු මිනිස්සු බඩ ගින්නේ මැරෙන්න තිබුණා. මඩකලපුව ප්‍රදේශයේ තුනෙන් දෙකක් ම විනාශ වුණා. ඒකෙන් ආර්ථිකයට ලොකු බලපෑමක් ඇති වුණා. මෙකෙන් අපිව ගලවා ගන්න පුළුවන් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්ට විතරයි."

-මඩකලපුව ප්‍රදේශයේ දමිළ දේශපාලන නායකයෙක්

"දැන් රාජ්‍ය නොවන සංවිධාන රෝග මූලයට ප්‍රතිකාර කරන නැඹුරුවක් තියෙනවා. මම ඒක අගය කරනවා. ඉස්සර, ඔවුන් ප්‍රතිකාර කළේ රෝග ලක්ෂණවලට මිස රෝග මූලයට නෙවෙයි. නමුත් දැන් රෝග මූලය හඳනාගෙන ඊට ප්‍රතිකාර කරනවා."

-මඩකලපුව ප්‍රදේශයේ රාජ්‍ය නොවන සංවිධාන නායකයෙක්

එමෙන්ම, ගැටුම් හටගන්නා ප්‍රදේශයන්හි සිටින බොහෝ පුද්ගලයින්ට විදේශ ආධාර සපයන්නන්ගේ විශේෂයෙන්ම රජය හා එල්ටීටීඊ සංවිධානය අතර ගැටුමේදී යුද මුක්ත කලාපයේ මානුෂීය සේවා සහන සඳහා මැදිහත් වන එක්සත් ජාතීන් හා අනෙකුත් ආධාරක ආයතනයන්හි දිගු කාලීන දැක්ම වටහා ගැනීමට අවශ්‍ය විණි.

ආධාරක අයාතනයන්ගේ නිර්වචනයට අනුව මෙම ප්‍රදේශයන්හි අවදානමට ගොදුරුවීමේ හැකියාව, වත්මන් ගැටුම් සන්දර්භය හා සමීපව බැඳී ඇත. අනුරාධපුර ප්‍රදේශයේ ඇතැම් ජනතාව පැවසූ ආකාරයට ආරක්ෂක තත්වය පිළිබඳ ගැටලුවක් නොවන්නට මෙහි ජාත්‍යන්තර ආධාර ඉතා සුළු වශයෙන් අවශ්‍ය වන්නට හෝ අවශ්‍ය නොවන්නටම තිබිණි.

නැගෙනහිර ප්‍රදේශයේ හා අනෙකුත් යුද මායිම් ප්‍රදේශයෙන්හි අභ්‍යන්තර ව අවතැන්වූ ජනතාව නැවත පදිංචි කිරීම පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධ අදහස් වලට සවන්දීමට සවන්දීමේ කණ්ඩායමට හැකිවිය. ඇතැම් අය සිතුවේ රාජ්‍ය නොවන සංවිධානයන්ට මිනිසුන් කඳවුරු තුළ රඳවා ගැනීමට අවශ්‍ය වූ බැවින් ඔවුන් ජනතාවට එහි රැඳී සිටින ලෙස ඉල්ලා සිටි බවත් එසේ නොකරන්නේනම් සපයන ආධාර කපා හරින බවත් පැවසූ බවයි. තවත් අවස්ථාවකදී අපට අසන්නට ලැබුණේ රාජ්‍ය නොවන සංවිධානයන්ට කඳවුරු හැර යන ලෙස විධානය කර ඇත්තේ අවතැන්වූවන් නැවත ඔවුන්ගේ ගම් ප්‍රදේශ බලා යැවීමට රජයට අවශ්‍ය වූ බැවින්ය යන ආකල්පයයි. අනුරාධපුර ප්‍රදේශයේ එක් අවතැන්වූවකු පැවසූ ආකාරයට "ආපස්සට යන එක ආරක්ෂාකාරී නැහැ. ඒත් රජයට ඕන වුණා අපිව ආපස්සට ගම් ප්‍රදේශ බලා යන්න මොකද ඒක ඒල්ටීටීඊ එකට විරුද්ධව හොඳ ආරක්ෂක වලල්ලක් වෙන නිසා."

බොහෝ අවතැන්වූවෝ එක්කෝ රජයේ එසේත් නැතිනම් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්හි සරණ පැතූහ. පුත්තලම ප්‍රදේශයේ අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරක වැසියෙක් අප සමග මෙසේ පැවසීය. "රාජ්‍ය නොවන සංවිධානයන් ආධාර දෙන්නේ ඒ අයගේ කැමැත්තට අනුවයි. ඒ අයට ආධාර දෙන්න හිතුනොත් අපිට ආධාර ලැබෙනවා. නැත්නම් නෑ."

(ආ). දිළිඳු ජනතාවට ආධාර?

බදුල්ල ප්‍රදේශයේත් ගාල්ලේ උතුරු ප්‍රදේශයේ තේ වතුවලත් අනුරාධපුර ප්‍රදේශයේ ඇතැම් ප්‍රදේශයන්හිත් සැරිසැරූ සවන්දීමේ කණ්ඩායම්වලට "අපට ආධාර නොලැබෙන්නේ මන්ද" යන්නට හේතු කිහිපයක් එහි ජනතාවගෙන් අසන්නට ලැබිණි. ඔවුන්ගේ වැටහීමට අනුව විදේශ ආධාරකරුවන් හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ආධාර සපයන්නේ මානුෂීය හා දේශපාලන හේතූන් මත උතුරු නැගෙනහිර ගැටුම් බලපෑමට ලක් වූ ජනතාවට පමණි. සුනාමි බලපෑම් ලත් ප්‍රදේශයන් සහන සපයන ආයතනයන්ගෙන් පිරී ඉතිරී ඇති බවත් එම ප්‍රදේශයන්ට විශාල ප්‍රමාණයෙන් විදේශ ආධාර ලැබෙන බවත් ඔවුන්ගේ මතයයි. "නොසලකා හැර ඇති", " ගිලිහී ගිය" හෝ "ප්‍රමුඛතාවයෙන් බැහැර වූ" ජනතාව පිළිබඳ නිරතුරුව ම සඳහන් කරන බොහෝ ජනතාවට ආධාරක අයාතනයන් අවදානමට ගොදුරුවූවන් යන්න නිර්වචනය කරන ආකාරය නොපැහැදිලි බව පෙනේ.

අනුරාධපුර ප්‍රදේශයේ වෙසෙන විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයෙක් පැවසූයේ " අවශ්‍යතාවයන්ට පෙර ක්‍රියාපටිපාටීන් සකස් නොකළ යුතු" බවයි. ඇතැම් අයගේ මතය වූයේ විදේශ ආධාර සපයන්නන්ගෙන් ප්‍රමුඛතා හා සැලකිල්ල සත්‍ය වශයෙන්ම දරිද්‍රතාවය තුරන් කිරීම හෝ තිරසාර සංවර්ධනය කෙරෙහි හෝ යොමු වී නැති බවයි. ඊට හේතු ලෙස දක්වන්නේ රට තුළට මහත් විදේශ ආධාර ප්‍රමාණයක් ගලා ආවද ඒ සඳහා දුප්පත් ජනතාවට ප්‍රවේශයක් නොමැතිව තවමත් දරිද්‍රතාවයෙන් පෙළීමයි. දරිද්‍රතා දර්ශකයන් හෝ අවශ්‍යතා පදනම් කර නොගනිමින් ආධරක ආයතනයන්හි ක්‍රියා පටිපාටීන් හා ලේබල මත පදනම් වෙමින් ආධාර සැපයීම සඳහා ප්‍රදේශ හා ඉලක්ක කණ්ඩායම් තෝරා ගැනීම පිළිබඳ බොහෝ පුද්ගලයින් සිය විරුද්ධතාවය දැක්වීය.

"යුද්ධයයි මාධ්‍ය මගින් ලබා දෙන ප්‍රසිද්ධියයි නිසා පිටතින් ලැබෙන සල්ලි ඔක්කොම යන්නේ නැගෙනහිරටයි උතුරටයි. අපේ අවශ්‍යතා ගැන ආයතනවලට පේන්නෙ නෑ."

-ඌව පලාතේ මුස්ලිම් කාන්තා ප්‍රජා මූල සංවිධානයක නායිකාවක්

"සුනාමි බලපෑම් නොලද ප්‍රදේශවලට ආධාර සැපයිය හැකි අයාතනයක් අපි සොයාගන්න උත්සාහ කළා. එවිට ඒ අය නොසලකා හැරියායැයි කෝප වෙන්නේ නැහැ. නමුත් ආධාරක ආයතන කීවේ ඔවුන් සුනාමි ප්‍රදේශයන්ට මූලිකත්වය දෙන බවයි."

- ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය රජයේ නිලධාරියෙක්

"රාජ්‍ය නොවන සංවිධාන විපත්වලින් ආපදාවට ලක් වූ ප්‍රදේශවලින් ඔබ්බට ගිහින් අනෙක් ප්‍රදේශයක් කෙරෙහි අවධානයක් යොමු කරනවා නම් ඔවුනට දිගු කාලීනව, වඩා වැඩි ජනතාවකට උපකාර කළ හැකියි. ආධාරක ආයතන ජාතික මට්ටමෙන් පමණක් රැස්වීම ප්‍රමාණවත් නැහැ. ඔවුන් ප්‍රජාවන් වෙතද යායුතුයි."

-අනුරාධපුර ප්‍රදේශයේ ඉස්ලාමීය විද්වතෙක්

"අභ්‍යන්තර ව අවතැන්වූවන්", "මව හෝ පියාගෙන් එක් අයෙකු පමණක් සිටින පවුල්"හෝ " සුනාමි බලපෑම් ලත්" වැනි ලේබල නොමැති අතිශය දිළිඳුබාවයෙන් පෙළෙන අවදානම් තත්වයේ සිටින පවුල් සඳහා ආධාර නොලැබෙයි. සුනාමි ව්‍යසනයට ගොදුරු වූ වෙරළ තීරයට මඳක් ඔබ්බෙන් කුඩා මඩුවක වෙසෙන එක් කාන්තාවක් ඇය සුනාමි ව්‍යසනට ගොදුරු වූවානම් යැයි ප්‍රාර්ථනා කළේ ඇයගේ අනාගතය යහපත් කරගැනීමට තිබුණු එකම ක්‍රමය එය යැයි ඇයට හැඟී ගිය බැවිනි. ඇය සවන්දීමේ කණ්ඩායමට මෙසේ පැවසුවාය. "මට දුකයි අපිව මේ විපතට අහු නොවීම ගැන. අපි දුප්පත්. ඒත් අපිට කිසිම උපකාරයක් නෑ."

"මෙච්චර කාලෙකට අපිට කිසිම ආධාරයක් ලැබිල නෑ. ඒ ගොල්ලෝ සුනාමි සුනාමි කියලා ආධාර දෙනවා. ඒගොල්ලො ආධාර දෙන්නේ මුස්ලිම් අයට (මුස්ලිම් අභ්‍යන්තර අවතැන්වූවන්ට). සිංහල, දෙමළ අපිට මුකුත් නෑ. අවතැන්වූවන්ට ආධාර දෙන එක අපට ප්‍රශ්නයක් නෙවෙයි. ඒ ගොල්ලොත් අපි වගේ අය. ඒත් අපිට මුකුත් ලැබෙන්නෙ නැති එක ගැන අපිට කණගාටුයි. අපි ඉන්නේ නගර සීමාවේ. අපි ඉන්නේ දුෂ්කර ප්‍රදේශයක නොවන නිසා අපිට ආධාර ලැබනේනේ නෑ."

-පුත්තලම ප්‍රදේශයේ ගැමි කාන්තාවක්

පුත්තලම ප්‍රදේශයේ එක් දිස්ත්‍රික්ක නිලධාරියෙක් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සිදුව ඇති ධනාත්මක වෙනසක් පිළිබඳව අපිට මෙසේ පැවසීය. "ඉස්සර වැඩි ආධාර ප්‍රමාණයක් දුන්නේ අභ්‍යන්තර ව අවතැන්වූවන්ට. දැන් අවතැන්වූවන් ආශ්‍රිත ව වෙසෙන අසල්වාසීන් ද මෙම වැඩ සටහන් වලට එක් කර ගෙන ඔවුන්ටත් ආධාර සැපයෙනවා." තවත් අයෙක් පැවසුයේ, "මෙහේ ඉන්න රාජ්‍ය නොවන සංවිධාන ගොඩක් ඒවා 'අවතැන්වූවන්ගේ සංවිධාන', පුත්තලමේ මිනිස්සු එන්ජීඕ වචනෙ ඇහුවෙත් මේ අවතැන්වූවන් මෙහෙට ආවට පස්සෙයි."

පොදුවේ, තේ වතු කම්කරුවන් හා සුනාමි හෝ යුද බලපෑම් නොලත් අනෙකුත් දුෂ්කර ප්‍රදේශයන්හි වෙසෙන හා කොන් වූ ජන කොටස්, සුනාමි හා යුද බලපෑම්වලට ගොදුරු වූ තැනැත්තන්ට ආධාර සැපයීම පිළිබඳ සිය ප්‍රසාදය පළ කළ අතර එය ඇගයීමට ද ලක් කළහ. කෙසේවුවද, මෙම ආධාරයන්ගෙන් කොටසක් නාය යෑම් හා ගංවතුර ආදීයෙන් විපතට පත් වූවන්ට නොදෙන්නේ මන්දැයි විමසූහ. එසේත් නොමැතිනම් ඒවා වෙරළට දුරස්ථව පිහිටි ප්‍රදේශයන්හි අතිශය දරිද්‍රතාවයෙන් යුත් පවුල් සඳහා ආදායම් උත්පාදක ව්‍යාපෘති කෙරෙහි නොයදවන්නේ මන්දැයි සිතූහ.

"අපිට හරිහැටි ආදායමක්වත් අපි ඉන්න තත්වෙ වෙනස් කරන්න හැකියාවක්වත් බලයක්වත් නෑ. මොනව කරන්නද කියලා අපි දන්නෑ. ලංකාවේ කොටසකට උදව් කරල කොටසකට උදව් නොකරන්නේ ඇයි කියලා අපි දන්නෑ."

-බදුල්ල ප්‍රදේශයේ තේ වත්තක මඩ නාය යෑමකින් දිවිගලවාගත් අවතැන්වූවෙක්

"වතු දෙමළ ජනතාවටත් රජයෙන් හා ජාත්‍යන්තර සංවිධානයන්ගෙන් ඒ අයගේ අයිතීන් හා ආධාර ඉල්ලා සිටීමට හැකියාවක් තියෙන්න ඕනෙ. මේ විදිහට හිටියොත් ඒ අයගේ තත්වෙ වෙනස් කරන්න බෑ. ඒ අයට සිංහලවත් ඉංග්‍රීසිවත් කතා කරන්න බෑ. ඒ නිසා රජයේ නිලධාරීන් හමුවෙන්න අමාරුයි. ඒ අයව හමුවෙන්න ගියාම ලැබෙන්නේ පොරොන්දු විතරයි. පළමුවෙන්ම ජාත්‍යන්තර සහාය මෙහෙට ලැබෙන්න ඕනෙ. ලංකාවේ ඉන්න වඩාත්ම හඬක් නගන්න අපහසු, අනිත් අයගේ අවධානය නොලැබෙන ජනතාව ඉන්නේ මෙහේ."

-බදුල්ල ප්‍රදේශයේ දමිළ ජාතික වතු කම්කරුවෙක්

**ආධාර සම්පත් කළමනාකරණය**

සවන්දීමේ කණ්ඩායම සංචාරය කළ දිස්ත්‍රික්ක 6 පුරාම අසන්නට ලැබුණු සුලබ කරුණක් වන්නේ "මෙහෙට ආධාර ලැබුනේ නැහැ" හෝ එසේත් නැතිනම් "ආධර ඉලක්ක ජනතාවට ලැබුනේ නැහැ" යන්නයි. අතැම් අය පැවසූයේ විදේශාධාර ඔවුන්ගේ ප්‍රජාවන්ට ලැබුණද ඒවා ලැබිය යුතු ප්‍රමාණයන්ට වඩා අඩුවෙන් ඔවුනට ලැබුණ බවයි. මෙලෙස ආධර අඩුවීමට හා නාස්තිවීමට හේතු බොහෝමයක් ඔවුහු ඉදිරිපත් කළහ. ආධාර අවනතු කරගැනීම, දූෂණය, ආධර වෙන් කිරීම සම්බන්ධයෙන් ආධරක ආයතන ගත් තීරණ, ආධර සපයන්නන් හා ආධර ලබන්නන් අතර ද ආධාර ලබන ජන කොටස් අතර ද ඇති අවිශ්වාසය, ඔවුහු හේතු ලෙස දැක්වූහ. පහත දැක්වෙන්නේ එවන් එක් පුද්ගලයකුගේ අදහසයි.

"ජාත්‍යන්තර ආධාර විශාල අයිස් කුට්ටියක් වගේ. ඒක කිහිප දෙනෙක්ගේ අතින් අතට මාරු වෙවී යන කොට පුංචි වෙනවා. සමහර ප්‍රතිලාභීන්ට ලැබෙන්නේ වතුර බින්දු දෙක තුනක් විතරයි."

- මඩකලපුව ප්‍රදේශයේ නගරසභා නිලධාරියෙක්

ආධාර අඩුවීමට අමතරව, ආධාරක ආයතනයන් කෙරෙහි විශ්වාසය මඳ කම පිළිබඳවද ජනතාව කතා කළහ. අප සවන්දුන් බොහෝ පුද්ගලයින්හට විශ්වාසය, විනිවිදබාවය, හා තොරතුරු සඳහා ප්‍රවේශය ඉතා වැදගත් සාධක විය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක් ගම් වැසියෙක් පැවසූයේ, " විනිවිදබාවය හා අවාබෝධය හැරුණු කොට ප්‍රධානම දේ විශ්වාසය." බවයි. මෙම විශ්වාසය ප්‍රජා මට්ටමෙන් ගොඩනැගීම අත්‍යවශ්‍ය බව පෙනී යන අතර සංවර්ධන සැලසුම්, ප්‍රජා සාමාජිකයින්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා පැහැදිලි කිරීම අවශ්‍ය කෙරේ. සෑම ප්‍රදේශයකම ප්‍රජාවන් අතර තරඟකාරීත්වයක් ගොඩ නැගී ඇති අතර ප්‍රජාවන් ආධාර සඳහා තරග කිරීමේදී විශ්වාසය බිඳීයාමක් සිදුව ඇත.

**(අ). ආධාර අවනතු කරගැනීම හා දූෂණය**

ආධාර රජය හරහා, මැදිහත්කරුවන්, දේශීය ආධර ආයතන හරහා හා ප්‍රජා මට්ටමේ පුද්ගලයින් හරහා ආධාර සැපයෙන විට ඒවා "අතුරුදන් වන" බව සෑම ප්‍රදේශයකම ජනතාව කියා සිටියහ.

මෙලෙස ආධාර වෙනත් මාර්ගයන් කරා බෙදී යාම පිළිබඳ ඔවුහු සිය දැඩි අවධානය යොමු කළහ. ආධාර බෙදා හැරුණ ද ඒවා සත්‍ය වශයෙන්ම අවශ්‍ය පුද්ගලයින් වෙත නොයෑමට එක් හේතුවක් ලෙස දූෂණය දැකිය හැකිය. එමෙන්ම ඇතැම් පුද්ගලයින් මෙම දූෂණය යම් තාක් දුරට විඳ දරා ගන්නා තත්වයක් ද පෙන්නුම් කළේය. අනුරාධපුර ප්‍රදේශයේ එක් හින්දු පූජකවරයෙකු සඳහන් කළේ, "දූෂණය සිදු වුනත් අඩුම ගානේ මොනවම හරි සිද්ද වෙනවානේ. සංවර්ධන කටයුතු වලින් රැකියා අවස්ථා ගොඩ නැගෙනවා."

ආධාර රජය ඔස්සේ ලබා දුන් විට ඊට බොහෝ දේශපාලන බලපෑම් දිස්ත්‍රික්ක හා ගම් මට්ටමෙන් ඇති වන බැවින් ආධාර ලබා දීමට එය දැඩි ලෙස බලපායි. නිදසුනක් ලෙස ගාල්ල ප්‍රදේශයේ වෙසෙන කම්හල්කරුවකු සිතන ආකාරයට "ගෙවල් දෙන්නෙ මැති ඇමතිවරුන්ගේ කැමැත්තට"ය. බදුල්ල ප්‍රදේශයේ රජයේ නිලධාරියෙක් පැවසූයේ ප්‍රතිලාභීන් තෝරාගැනීම රාජ්‍ය නොවන සංවිධානය විසින් සිදු කළ යුත්තේ ඔවුන්ගේ ක්‍රියාවලිය දේශපාලන මැදිහත්වීම්වලින් තොර බැවිනි.

"ආධාර රාජ්‍ය නොවන සංවිධානයන්ට ලැබුණම අපිට ලැබෙන්නේ ඒකෙන් බාගයයි. අපි දන්න තරමට සෑම කඳවුරකම තත්වෙ මේකයි. අපි විදේශ ආධාර කරුවන් පිළිගන්නවා. පගා ගැනීම්, දූෂණ කටයුතු කරන්නේ ලංකාවේ අය. අපි කැමති ආධාර දෙන අය අනිත් සංවිධානවලට නොයා කෙළින්ම අපි ළඟට එනවනම්. ඒක වඩාත් එලදායී වේවි."

-පුත්තලම ප්‍රදේශයේ අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරක සිටින වැඩිහිටි පිරිමියෙක්

"විදේශාධාර රජයට ලැබුණම ඒවා මෙහෙට එන්නේ නෑ. එක්කෝ ඒවා කොළඹදීම අමාත්‍යාංශවලට යනවා නැත්නම් පෞද්ගලික පරිහරණයට යොදාගන්නවා. හොඳ ප්‍රතිඵල ලැබෙන්නනම් විදේශාධර අපේ ගම් වලට කෙලින්ම ලැබෙන්න ඕන."

-බදුල්ල ප්‍රදේශයේ ගමක වෙසෙන ගොවියෙක්

"දූෂණය ගැටලුවක්. රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජාවන්ගේ අත්සන් ලබා ගන්න (ප්‍රතිලාභී ලැයිස්තුව) අතරමැදියෙක් එව්වා. ඊට පස්සේ මුදල් බෙදා දීමට බාර දුන්නේ අතරමැදියාට. නමුත් ඒ මුදල් කවදාවත් ප්‍රජාවට ලැබුනේ නෑ."

-අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් භාණ්ඩාගාරිකවරයෙක්

"බොරු ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුළත් කිරීම ඇතුළු දූෂණය වැඩි වෙලා. රජයත් දූෂණයට ලක් වෙලා, ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය මට්ටමෙන්. අපි ඒකාධිපති පාලනයට හුරුවෙලා. ප්‍රදේශයේ දේවල් සිදුවන්නේ එහෙමයි. මේ රජයත් එල්ටීටීඊ නායකත්වයත් දිහා බලන්න."

-මඩකලපුව ප්‍රදේශයේ ප්‍රජා නායකයෙක්, මීට පෙර එල්ටීටීඊය සමග සිටි

"බොරු පොරොන්දු බොහෝමයි. ආධාර දෙන ආයතන සමහර වෙලාවට තෝරා ගන්නේ විශ්වාසයක් තියන්න බැරි අය. එක මනුස්සයෙක් ඇවිත් ආධාර ඕන කරන අයගේ ෆොටෝ අරන් සල්ලිත් එකතු කරගෙන බෙහෙත් ආධාර ලබා දෙන්නම් කියලා ගියා. ඒ අවුරුදු තුනකට කලින්. අපිට ඒයාව හොයාගන්න බෑ. ඒ මනුස්සයා ආගියඅතක් නෑ"

-බදුල්ල ප්‍රදේශයේ තිදරු මවක්

"මිනිස්සුන්ට ආධාර ලැබෙන්නේ නෑ. ආධාර රජය හරහා දුන්නහම සල්ලි ඔක්කොම යන්නේ අමාත්‍යාංශවලටයි. මිනිසුන්ට ලැබනේනෙ නෑ. ආධාරක ආයතනවලට තොරතුරු යවන්න ඕන වුනාම ඒ අය (රජයේ නිලධාරීන්)ඇවිත් ෆෝටෝ අරන් කියනවා ඒ අය මිනිස්සුන්ට සල්ලි දුන්න කියලා. ආධාර දෙන ආයතනත් ඒක විශ්වාස කරනවා."

-පුත්තලම බස්රථ රියදුරෙක්

"ඇති වෙන දුර්වලකම්වලට වගකියන්න ඕන දේශීය රාජ්‍ය නොවන සංවිධාන. දූෂණ සිද්ද වෙන්නෙ ඒ අය අතින්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන නෙවෙයි. ඒ අයට (ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන) ඕන මිනිසුන්ට ආධාර වලින් යහපතක් කරන්නයි. ඒ කටයුතු කැපවීමෙන් ඉටු කිරීම අපේ අයගේ වගකීමයි."

-මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරියෙක්

"අපි මෙහෙට ආපු දවස්වල අපිට ඇති තරම් කෑම හා ඇඳුම් පැළඳුම් ආදිය වෙලාවට ලැබුණා. ඒත් දැන් එන්න එන්න ලැබෙන ප්‍රමාණය අඩු වෙනවා. කඳවුරු කළමනාකරුයි ග්‍රාම සේවකයි එකතුවෙලා බෙදන්න තියන ආධාර හොරකම් කරනවා."

-මඩකලපුව ප්‍රදේශයේ අභ්‍යන්තරව අවතැන්වූ කඳවුරක කාන්තාවක්

**සවන්දීමේ කණ්ඩායමේ සිතාබැලීම්**

ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී හා බෙදා හැරීමේ ක්‍රියාවලියේදී ප්‍රජා නායකයින් හා ප්‍රාදේශීය රජයේ නිලධාරීන් පිළිබඳ නිරන්තර පැමිණිලි සහන සේවකයින්ට අසන්නට ලැබිණි. අයතනයන්ට බොහෝවිට අවශ්‍යතාවන් සහිත ප්‍රජාවන්ට ප්‍රවේශවීමට, අවශ්‍ය දත්ත ලබා ගැනීමට, විවිධ පර්ශවකරුවන් සමග ධාරිතා ගොඩ නැගීමට ප්‍රාදේශීය රජයේ නිලධාරීන් සමග හා බලය ඇත්තන් සමග කටයුතු කිරීමට සිදු වේ. මෙම සම්බන්ධතා අභියෝගාත්මක වන අතර ඊට විනිවිදබාවය හා සන්නිවේදනයේ විවෘතබාවය අවශ්‍ය වේ.

විදේශාධාර ලබා දෙන ආයතන හා ජාතික රජය සමග රටෙහි නීතිය හා විනය සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීමේ අවශ්‍යතාවය පිළිබඳ සවන්දීමේ කණ්ඩායම් විසින් සාකච්ඡාවට ලක් කෙරිණි. එමෙන්ම ආධාරක ආයතන හා ජාත්‍යන්තර සංවිධාන, රජයේ අමාත්‍යාංශ හා ප්‍රාදේශීය රජය විනිවිදබාවය සාක්ෂාත් කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි දිරිමත් කරන්නේද යන්න පිළිබඳව ද කණ්ඩායම් සාමාජිකයෝ කතාබහ කළහ. එක් සාමාජිකයෙකු පැවසූයේ "ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ඔවුන්ගේ ආධරකරුවන් සමග වගකීමෙන් කටයුතු කරද්දී ප්‍රජා මට්ටමෙන් සිදුවන දූෂණ සඳහා අපි කිසිවක් නොකර සිටියොත් අපිත් එහි කොටස් කරුවන්වනවා. අපි කියන්නේ අපි මිනිසුන්ට උපකාර කරනවා කියලයි. ප්‍රතිපත්ති මට්ටමෙන් මීට වඩා බලපෑමක් කළ යුතුයි." යනුවෙනි. නිවිදබාවය ආරක්‍ෂා කිරීම රජය, සහායක ආයතන හා ප්‍රජාවන් යන සෑම මට්ටමකම අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

**ආ) අන්තර්ජාතික හා ජාතික සහනසේවා ආයතන විසින් අරමුදල් වැය කරන්නේ කෙසේද?**

සහනසේවා ආයතන හා සෙසු වගකිවයුතු පාර්ශ්ව මගින් අරමුදල් වෙනකරන ආකාරය හා ඒවා භාවිත කරන ආකාරය සම්බන්ධයෙන් වන විවේචනාත්මක ප්‍රකාශ කිහිපයක් ම අපට අසන්නට

ලැබිණි. සියලුම ප්‍රදේශවල සැලකූ කළ පොදුවේ පවතින මතය නම් ජාතික හා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන මගින් සිය අරමුදල්වලින් ව්‍යාපෘති ප්‍රතිලාභ වෙනුවෙන් වැය කරන මුදලට වඩා වැඩි ප්‍රමාණයක් වැටුප් උපකරණ හා බාහිර වියදම් වෙනුවෙන් වැය කරන බවයි. බොහෝ දෙනෙක් පවසන අන්දමට සියලුම ආකාරයන්හි ආධාර (රාජ්‍ය ජාතික හා අන්තර්ජාතික) වල දිගු කාලීන බලපෑම සම්බන්ධයෙන් සලකා බලන විට ආධාරවලින් වැඩි ප්‍රතිශතයක් ග්‍රාහක ප්‍රජාවන්ට උපකාර සැපයීම් වෙනුවෙන් වෙන් කරන්නේ නම් එය වඩාත් ප්‍රතිලාභදායී හා තිරසාර වනු ඇති බවයි.

"අපිට තේරෙන විදියට ඒ ගොල්ලන්ට (අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවල කාර්ය මණ්ඩලවලට) අරමුදල්වලින් 40% දක්වා ප්‍රමාණයක් ඒ ගොල්ලන්ගෙ වියදම් වෙනුවෙන් වැය කරන්න අවසර දීලා තියෙනවා. ඒත් ඒ ගොල්ලෝ අරමුදල්වලින් 60%කටත් වඩා ප්‍රමාණයක් ඒ ගොල්ලන්ගේ සැප පහසුව වෙනුවෙන් වැය කරනවා."

-මඩකලපුවේ සුනාමියෙන් විපතට පත් සිවිල් සමාජ නායකයෙක්

"මම දන්න හැටියට නම් සංවිධානයක අරමුදල්වලින් 60 පමණ ප්‍රමාණයක් පරිපාලන කටයුතු වෙනුවෙන් වැය කරනවා. සැලසුම් කළ ව්‍යාපෘති වෙනුවෙන් වෙන් වෙන්නේ 40% පමණ ප්‍රමාණයක්. සහන සේවා කටයුතුවලට වෙන් කරලා තියෙන්නේ බොහෝම සුළු ප්‍රමාණයක්. දුෂ්කර අවස්ථාවලදී හරියාකාර විදියට කටයුතු කරන්න තරම් සමහර ආයතන මෝරලා නෑ."

-මඩකලපුවේ සහන සේවා සම්බන්ධීකරණ කටයුතුවල යෙදී සිටින හමුදා නිලධාරියෙක්

"සුනාමි ආධාරවලින් ඇත්තටම ආධාර අවශ්‍ය අයට ලැබුණේ 10% ප්‍රමාණයක් විතරයි. 90%ක් ම වැය උණේ සහන සේවා නිලධාරීන්ට හෝටල්, වාහන, කෑම බීමවලටයි ඒගොල්ලන්ට විනෝදවෙන්නයි තමයි."

-අන්ධ කාන්තාවක් හා විවාහ වී සිටින ගාල්ලේ සුනාමියෙන් විපතට පත් අන්ධ පුද්ගලයෙක්

ඌව පළාතේ දී ප්‍රාදේශීය ප්‍රජා මූල සංවිධානයක් නිවාස ඉදි කිරීම සම්බන්ධයෙන් විශේෂත්වයක් දරන අන්තර්ජාතික සංවිධානයකින් දෛනික කුළී වැඩවලින් පමණක් ආදායම් ලබන වතු කම්කරුවන් වෙනුවෙන් වන නිවාස ව්‍යාපෘතියකට සහයෝගය ලබා දෙන මෙන් කළ ආයාචනය සම්බන්ධයෙන් තොරතුරු අප සමග පැවසූහ. ඒ සඳහා අවශ්‍යවන අරමුදල් සැපයීමට අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානය එකඟ වුව ද සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු වෙනුවෙන් කිසියම් පාර්ශ්වයක් සොයා ගැනීමේ කටයුත්ත ප්‍රජා මූල සංවිධානයට පැවරිණි. මෙම වතුයායේ සිය කටයුතු දියත් කරමින් සිටින සංවිධානයක් අදාළ කටයුත්ත වෙනුවෙන් පරිපාලන වියදම් වෙනුවෙන් අරමුදල්වලින් 45% වැය වන බවත් 55% ප්‍රමාණයක් නිවාස වෙනුවෙන් වියදම් කළ හැකි බවත් දන්වා තිබුණි. ප්‍රජා මූල සංවිධාන නායකයින් පෙන්වා දෙන අන්දමට මෙම සංවිධානය අන්තර්ජාතික අරමුදල් මගින් පවත්වාගෙන යන අතර ඉතා විශාල කාර්ය මණ්ඩලයක් හා යාන වාහන ඔවුහු සතු වෙති. ඒ අතර මේ රැකියා සැපයීම හැමවිටම සිදුවන්නේ සම්බන්ධතා හරහාය. ප්‍රජා මූල සංවිධානය මෙම කොන්දේසිය පිළි නොගත් අතර මේ හේතුව නිසා ඔවුන්ට ලැබීමට තිබූ අරමුදල ද අහිමි විය. එහා ප්‍රතිඵලය වූයේ කිසිම නිවසක් නොසෑදීමයි.

බොහෝදෙනෙක් අන්තර්ජාතික හා ප්‍රාදේශීය රාජ්‍ය නොවන කාර්ය මණ්ඩල පිළිබඳ සිය අප්‍රසාදය පළ කර සිටියහ. අනුරාධපුර ප්‍රදේශයේ පාසැල් සේවකයෙක් මෙසේ පවසා සිටියේය. "සමහර අයට රාජ්‍ය නොවන සංවිධානවලට ලැබෙන අරමුදල්වලින් සුඛෝපභෝගී ජීවිතයක්

ගත කරන්න ඕනේ." සමස්ත බලපෑම පිළිබඳව අප විසින් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් එක් පුද්ගලයෙක් අප්‍රසාදයෙන් යුතුව "කිසිම ප්‍රතිඵලයක් නෑ. ඒත් ප්‍රාදේශිය රාජ්‍ය නොවන සංවිධානවල වැඩ කරන අයට නං හොඳ පඩි නඩි හම්බ වෙනවා." යනුවෙන් සිය අසතුට පළ කර සිටියේය.

"ප්‍රාදේශිය රාජ්‍ය නොවන සංවිධාන තමන්ගෙ වියහියදම් ගැන මීට වඩා විවෘත වෙන්න ඕනේ. ඒ ගොල්ලො හැම විටම තමන් ගේ වියදම් හංගලා තරු පහේ හෝටල්වල රෑ තිස්සේ පවත්වන වැඩමුළු සාධාරණීකරණය කරන්න උත්සාහ කරනවා."

-අනුරාධපුරයේ ප්‍රජා සාමාජිකයෙක්

"තමන් ගොඩක් දේ කරනවා කියලා පෙන්නන්න එක සංවිධානයක් තමන්ගේ සංවර්ධන කටයුතු වරින් වර වෙනස් කළා. ඒත් ඒ හැම අවස්ථාවෙ දි ම කළේ එකම දේ. කිසිම වෙනසක් නෑ. ඒ ගොල්ලන්ගේ තත්වේ වැඩි දියුණු කර ගන්න තමයි සල්ලි වියදම් කළේ."

-අනුරාධපුරයේ රාජ්‍ය නිලධාරියෙක්

"ඔබගේ වියදම් අඩු කරන්න වග බලා ගන්න ඕනේ. හැම කටයුත්තකම පළමු පියවර වියදම් අධිකයි කියන එක ඇත්ත. ඒත් ඊට පසු පියවරවලදි වියදම් ගැන මීට වැඩිය හිතන්න ඕනේ. ප්‍රාදේශිය සන්දර්භය හොඳ අවබෝධයක් තියෙන රට තුළම සිටින උපදේශකයන් යොදා ගන්න පුළුවන්. විදේශීය උපදේශකයො ශ්‍රී ලංකාවේ තත්වය ගැන විශේෂඥයො නෙමෙයි. අනිත් එක ඔවුන් වියදම් අධිකයි."

-අනුරාධපුර දිස්ත්‍රික් නිලධාරියෙක්

"සමහර දිස්ත්‍රික්කවල ව්‍යාපෘති අනුමත කරන රාජ්‍ය තාක්ෂණික නිළධාරීන් ඉන්නේ සීමිත ගාණක්. සීමිත කාල සීමාව ඇතුළත අදාළ නිලධාරීන්ගේ සේවය ලබා ගන්න ආයතන අතර තියෙන්නේ තරගයක්. ඒ තරගෙන් දිනන්න ඒ ගොල්ලො ඉහළ උපදේශන ගාස්තු ගෙවන්න ලෑස්ති වෙලා ඉන්නවා. අවබෝධතා ගිවිසුම් මගින් මේවා නීත්‍යානුකූල කරලා තිබුණත් අල්ලස් හා නිරන්තරයෙන් තියෙන තරගකාරී බව සමාජ සේවා කටයුතුවල පිළිගත් තත්වයක් බවට පත් වෙලා. මේක රටට හොඳ නෑ. ඒ වගේම යහ පාලනයටත් මේක තර්ජනාත්මක තත්වයක්."

-කොළඹ අන්තර්ජාතික සංවිධානයක වැඩසටහන් කාර්ය මණ්ඩල නිලධාරියෙක්

**සවන්දීමේ කණ්ඩායමේ සිතාබැලීම්**

අන්තර්ජාතික සංවිධාන සියල්ල හා සියලු වගකිව යුතු පාර්ශ්ව එක්ව අරමුදල් වැය කිරීම් සම්බන්ධයෙන් පිළිගත් රීති මාලාවකට අනුව කටයුතු කිරීමෙන් අරමුදල් වෙන් කිරීම හා වැය කිරීම සම්බන්ධයෙන් වඩාත් විනිවිදභාවයක් ලබා ගත හැකි ආකාරය පිළිබඳව කණ්ඩායම් සාමාජිකයන් අතර සංවාදයන් ඇති විය. සිය අරමුදල් නිසියාකාර ලෙස භාවිත නොකරන හා නියමිත පුද්ගලයන්ට ආධාර ලබා නොදෙන ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වී තිබීම ගැන ද කණ්ඩායම් සාමාජිකයෝ අවධාරණය කළහ. කණ්ඩායමට පෙනී ගිය ආකාරයෙන් සිය නිරීක්ෂණ කටයුතු මෙන් ම තමාගේ හා තමාට සම්බන්ධ පාර්ශ්වයන් ගේ මූල්‍ය කටයුතුවල ක්‍රමවත්භාවය වැඩි දියුණු කර ගැනීම සඳහා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලට සිදු කළ හැකි දේ බොහෝය.

## 4. බාහිර අගයන් ප්‍රවර්ධනය හා ගෞරවය හා වැදගත්කම පිළිබඳ ගැටලු

බොහෝ අවස්ථාවන්වල දී අපට සැඟවුණු න්‍යාය පත්‍රයන් යන වචනය අසන්නට ලැබිණි. අන්තර්ජාතික සංවිධාන සම්බන්ධයෙන් අදහස් දක්වන විට බොහෝ දෙනෙක් බාහිර අගයන් බලෙන් පැටවීමට තැත් කිරීම ගැන සඳහන් කළහ. මෙවැනි ක්‍රියාමර්ග නුසුදුසු බවත් එවැනි බාහිර අගනාකම් මගින් ග්‍රාහකයන් තුළ අනවශ්‍ය බලපෑම් ඇති විය හැකි බවත් බොහෝ දෙනෙකුගේ මතය විය.

### අ) බාහිර අගයන් ප්‍රවර්ධනය කිරීම

ගාල්ල හා අනුරාධපුර දිස්ත්‍රික්කවල දී අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන මගින් සංස්කෘතිය වෙනස් කිරීම කරන ලද උත්සාහයන් හා ආගම් පැතිරවීමට කරන ලද උත්සාහයන් පිළිබඳව ජනතාව චෝදනා කරනු අසන්නට ලැබිණි. මේ අතර මේ මේ ප්‍රදේශවල දී සමහර රාජ්‍ය නොවන ආයතන ප්‍රජාවගේ යහපත පිණිස නොව සිය ප්‍රචාරණය ප්‍රමුඛත්වයෙහි ලා කටයුතු කරන බවට වන චෝදනා ද විය. "ඒ ගොල්ලො මෙහෙ ඉන්නේ මිනිස්සුන්ගේ යහපතට වඩා තමන්ගෙ ම යහපත වෙනුවෙන්", අනුරාධපුර ප්‍රදේශයේ බෞද්ධ භික්ෂූන් වහන්සේනමක් සඳහන් කළ ආකාරයට කිසියම් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයක කටයුතු අත්හිටුවන ලෙස ප්‍රජාව විසින් ප්‍රාදේශිය පාලනය වෙත ඉල්ලීම් කර ඇත. ප්‍රජාවට පෙනී ගිය ආකාරයට මෙම ක්‍රිස්තියානි අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානය විසින් ඔවුන් ගැමි දරුවන් වෙත ලබා දෙන ලද කුරුස පැළඳගෙන සිටින දරුවන්ගේ ඡායාරූප ගැනීමක් සිදු වී ඇත. මෙයට හේතු විමසූ විට පිළිතුරු ලැබී ඇත්තේ අරමුදල් ලබා ගැනීමට නම් අදාළ ඡායාරූප සිය ආධාර සපයන පාර්ශ්ව වෙත යැවිය යුතු වන බවයි. කෙසේ වෙතත් ප්‍රාදේශීය පාලනාධිකාරීය විසින් ප්‍රජාවගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමක් සිදු කර නොමැත. මේ අනුව මේ කාරණය වෙනුවෙන් පන්සල මැදිහත් වී අවශ්‍ය ආධාර ලබා ගැනීම සිදු කර ඇත්තේ ඔවුන්ගේ ආගමික අරමුණු පිළිබඳ න්‍යාය පත්‍රයන් නොසළකා හරින බවට වන කොන්දේසි ද සමගිණි. මඩකලපුවේ සුනාමියෙන් විපතට පත් පුද්ගලයෙන් පැවසුවේ "සමහර රාජ්‍ය නොවන සංවිධාන මෙහෙට එන්නේ ඒ ගොල්ලන්ගේ ආගමට හැරුනොත් උදව් කරන පොරොන්දුව පිට." යනුවෙනි. ගාල්ලේ තේරී පත්වූ නිලධාරියෙක් මීට සමාන අදහසක් ප්‍රකාශ කළේය. "රාජ්‍ය නොවන සංවිධානවලට සැඟවුණ අරමුණු තියෙනවා. සමහර රාජ්‍ය නොවන සංවිධාන දුප්පත් මිනිස්සුන්ට උපකාර කරලා ඒ ගොල්ලො ක්‍රිස්තියානි ආගමට හරව ගන්නවා." බොහෝ දෙනෙක් බාහිර වශයෙන් නිර්ණය කරන ලද අවදානම් දර්ශක පිළිබඳ සිය නොසතුට පළ කර සිටි අතර මෙම දර්ශක අභ්‍යන්තර වශයෙන් නිර්ණය කිරීම වඩාත් සුදුසු බව දක්වා සිටියහ. ගාල්ලේ රාජ්‍ය නිලධාරියෙක් සවන්දිමේ කණ්ඩායම අමතා සඳහන් කළේ "මේ දර්ශක පදනම් වෙලා තියෙන්නේ ඒ ගොල්ලන්ගේ පරිසරය මත මිසක් අපේ පරිසරය මත නෙමෙයි." යනුවෙනි. ගාල්ලේ ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් පවත්වාගෙන යන බෞද්ධ භික්ෂූන් වහන්සේනමක් මීට සමාන අදහසක් ඉදිරිපත් කළහ. "රාජ්‍ය නොවන සංවිධාන තමන්ගේ නිර්ණායක මොනවද කියලා අවබෝධතා ගිවිසුම්වල සඳහන් කරනවා. ඉතිං අපට ඒ ගොල්ලන්ගෙන් මුදල් අවශ්‍යයි නම් ව්‍යාපෘතිය ඉදිරිපත් වෙන්නේ කොයි ආකාරයට ද අපි ඒක බාර ගන්න ඕනේ. අපේ දුක තේරෙන්නේ අපිට ම විතරයි. වයෝවෘධ කාන්තාවන්, වැන්දඹුවන් වගේ නිර්ණායක අපිට ඉදිරිත් කරන්නේ බාහිර පුද්ගලයින් විසින්. ඒකත් අපිට අදාළ වෙන නිර්ණායක හඳුනාගන්න අපිට හැකියාවක් තියෙන්න ඕනේ. අඩුම ගාණේ 25% ප්‍රමාණයක්වත් හඳුනා ගැනීමේ හැකියාව තියෙන්න ඕනේ. අපිට අපේම නිර්ණායක තනා ගන්න ඉඩ දෙන්න. මොකද කියනවා නම්

නිර්ණායක ඉදිරිපත් වෙන්න ඕනේ අපි අතින් මිසක් ඉහළින් ඉන්න පුද්ගලයො අතින් නෙමෙයි නිසා. අපි ඒ ගොල්ලන්ගේ කොන්දේසි පිළි ගන්නේ සීමා මායිම් බිඳ දැමීමට වඩා ආධාර ලබා ගැනීම වැදගත් හින්දා."

ශ්‍රී ලාංකික සංස්කෘතිය හා අගයන් සුරැකීම සම්බන්ධයෙන් බාහිර ආයතන ස්වාධීන පුද්ගලයන් හා ප්‍රජාව සතු වගකීම් පිළිබඳ විවිධ අදහස් පළ විණි.

"අපේ සංස්කෘතියට ආගමික වටිනාකම්වලට සෑහෙන්න හානි සිද්ද වෙනවා. ඒත් කිසිම අන්තර්ජාතික රාජ්‍ය නොව සංවිධානයක් ඒකෙ වගකීම බාර ගන්නේ නෑ."

-මඩකලපුවේ පන්සලක බෞද්ධ භික්ෂූන් වහන්සේනමක්

"මේක අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රශ්නයක් නෙමෙයි. අපේ සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කර ගැනීමට බැරි වීම අපේ ම ප්‍රශ්නයක්. අපි විදේශිකයො වගේ වැඩ කර කර අපේ ජීවන රටා වෙනස් කරන්න උත්සාහ කරනවා නම් එකට අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන වග කියන්න ඕනෙ නෑ. අපිට විදේශීකයෝ අනුගමනය කරන්න ඕන කමක් නෑනේ. අපි දැනගන්න ඕනේ අපිට හොඳ මොනවද කියලා."

-මඩකලපුවේ නැවත පදිංචි කළ ගමක කාන්තාවක්

"සිද්ද වෙන සංස්කෘතික වෙනස්කම්වලට රාජ්‍ය නොවන සංවිධානවලට චෝදනා කරන්න බෑ. හැමෝම දැන ගන්න ඕනේ හරි වැරැද්ද මොකක්ද කියලා. අපේ සංස්කෘතිය ආරක්ෂා කරන්නේ කොහොමද කියන එක අපේ වගකීමක්"

-මඩකලපුවේ මුස්ලිම් ප්‍රජා නායකයෙක්

### ආ) ගෞරවය හා වැදගත්කම පිළිබඳ ගැටලු

ගාල්ලේ, මඩකලපුවේ හා පුත්තලමේ බොහෝ දෙනෙක්, බාහිර සංවිධාන, ඔවුන්ගේ කාර්ය මණ්ඩල හා මැදිහත් කරුවන් විසින් තමන් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳ නොසතුට පළ කළහ. අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයකට අයත් වාහනයක ගැටීමෙන් විපතට පත් මඩකලපුවේ දෙමළ වැසියෙකුට ඒ සම්බන්ධයෙන් නිසි නීතිමය පියවරක් ගත නොහැකි වූයේ රාජ්‍ය නිලධාරියෙක් හා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයේ නිලධාරියෙක් නීතියට හමුවට නොයන සේ කළ තර්ජන නිසාය. ඔහුට හුදෙක් මූල්‍යමය වන්දියක් ලැබීම පමණක් සිදු විය. අනතුරේ දී ඔහුගේ පාපැදියට හානි පැමිණුනන අතර පාදයට සිදු වූ තුවාල හේතුවෙන් ඔහුට රැකියාව කිරීමට ද නොහැක. "විදේශීය ආයතන හිතන්න ඕනේ මනුස්ස ජීවිතයක් කියන්නේ වැදගත් දෙයක් කියලා. තමන් කරන දේ ගැන මීට වඩා පරිස්සම් වෙන්න ඕනේ. අපි මිනිස්සුන්ට ගරු කරන්න ඕනේ. අපි දුප්පත් වෙන්න පුළුවන් ඒත් අපිත් මිනිස්සු" ඔහු පැවසුවේය.

එමෙන්ම සහන සේවා ආයතන මගින් හදිසි ආධාර ලබා දීමේ කටයුතුවලදී ආධාර ලබන පාර්ශ්වවල ගෞරවය හා වැදගත්කම සම්බන්ධයෙන් තැකීමක් නොකර කටුයතු කිරීම සම්බන්ධයෙන් ද විවේචන ඉදිරිපත් විය. විශේෂයෙන් ම ආධාර සැපයිය යුත්තේ කෙසේද යන්න සම්බන්ධයෙන් උපදේශනයන් ලබා දී තිබූ අතර මේවා හුදෙක් තනි සිදුවීමක් වශයෙන් නොපැවතුණි. "එක් කණ්ඩායමක් අනෙක් කණ්ඩායම තරම් විපතට පත් වෙලා නෑ කියලා

තේරුම් යනවා නම් ඒ කණ්ඩායමටත් මොනව හරි ලබා දෙන්න. එතකොට ආධාර ලැබෙන්නෙ කාට ද කියලා පැහැදිලිව ම පේන්නේ නෑ." සුනාමියෙන් විපතට පත් පුද්ගලයෙක් පැවසීය.

ආධාර සැපයීමේ කාර්යයේ දී පුද්ගලයන්ට කිසියම් වරණයක් ලබා දීම ද වැදගත් වේ. බොහෝ දෙනෙක් භාණ්ඩ ආධාරවලට වඩා මුදල් ආධාර වලට කැමැත්තක් දක්වන්නේ එවිට තමාට අවශ්‍ය දේ මිලට ගැනීමට ඔවුන්ට හැකියාවක් ලැබෙන බැවිණි. ආධාර ලබා දෙන ස්ථානවල සිදුවන එකිනෙකා පරයා කරන උදුරා ගැනීම්වලට වඩා සාධාරණ ක්‍රමවත් ආකාරයකට ආධාර බෙදා හැරීමේ ක්‍රමයකට බොහෝ දෙනෙක් කැමැත්ත පළ කළහ. තේ වත්තක කම්කරුවෙක් පැවසුවේ "අපිට පරණ ඇඳුම් දෙන්න එපා. අඩුම ගාණේ එක දෙයක් වත් අළුත් දෙයක් වෙන්න ඕනේ. නැත්තම් ඒක හරි ලැජ්ජාවක්. මෙහෙම දුන්න සමහර ඇඳුම් ගැරෙජ්වල කාර් පිහිදාන්න යැව්වා." යනුවෙනි.

සමහර පුද්ගලයින් බාහිර සංවිධානවල ප්‍රාදේශීය ධාරිතාවක් දක්නට නොලැබීම් සම්බන්ධයෙන් චෝදනා කළහ. අදාළ සංවිධානය රාජ්‍ය අංශය, ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් හෝ ප්‍රජා මූල සංවිධානයක් හෝ වේවා එහි ප්‍රාදේශීය වශයෙන් වන ධාරිතාවක් දක්නට නොලැබීම ගැටලුවක් විය. බාහිර පුද්ගලයින් විසින් ශ්‍රී ලංකාව තුළ සිටින ඉන්ජිනේරු තාක්ෂණ හා ගෘහ නිර්මාණ විශේෂඥයන් පිළිබඳ නොසලකා හරිමින් අදාළ සම්පත් බාහිරව සපයා ගැනීම නුසුදුසු කාර්යයක් සේ බොහෝ දෙනෙක් දුටුවහ. අනෙක් අතට අන්තර් සංස්කෘතික සංවාදයන් තුළ දී ප්‍රාදේශීය පාර්ශ්වයන් මත නොරැඳෙමින් සන්දර්භය පිළිබඳ අවබෝධයක් නොමැති බාහිර පුද්ගලයින් ඊට සම්බන්ධ කර ගැනීම පිළිබඳව ද අප්‍රසාදය මතුවිය. "ඇයි අපේ දැනුමයි හැකියාවයි අවතක්සේරු කරන්නේ? අපිටත් ඉන්නවා ඉන්ජිනේරුවොයි විශේෂඥයොයි." ගාල්ලේ පුද්ගලයෙක් පැවසීය. "හොඳට හැදිලා ගෙඩිත් හැදුන ගහක් ගෙනල්ලා මෙහෙ පැල කරන එක කිසි තේරුමක් නැති වැඩක්" තවත් කෙනෙක් පැවසීය.

## සවන්දීමේ කණ්ඩායමේ සිතාබැලීම්

ආධාරය යනු හුදෙක් මිනිසුන්ට ලැබෙන දේ පමණක් නොවන බවත් නමුත් ඒ දේවල් මගින් අදහස් වන්නේ කුමක්ද යන්න බවත් ශ්‍රාවක කණ්ඩායමේ සංවාදයට බඳුන් විය. ආධාරවල ගුණාත්මක භාවය හා සුදුසුබව සම්බන්ධයෙන් පුද්ගලයින් තුළ පවතින දෘෂ්ටිකෝණය ඔවුන්ගේ තත්වය හා සමාජාවබෝධය මත පදනම් වේ. කණ්ඩායම් සාමාජිකයින් විසින් අවධාරණය කරන අන්දමට මෙම කරුණු කෙරෙහි සහන සේවා නිලධාරීන් අවධානයක් නොදක්වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස සිය ආධාර ලබා දීම නිසා ජනතාව තුළ අසතුටක් ඇති වන අයුරු දකීමට ඔවුහු අපොහොසත් වෙති. කිසියම් කාර්ය මණ්ඩලයක් කුමන ජාතියකට එසේත් නැත්නම් සංස්කෘතියකට අයත් වුව ද තීරණ ගැනීමේ කටයුතුවල යෙදී සිටින හා ඍජුව ආධාර බෙදා හැරීමේ කටුයතුවල යෙදී සිටින පුද්ගලයින් ශ්‍රී ලාංකික සංස්කෘතිය පිළිබඳ මනා අවබෝධයකින් සිටිය යුතු බවට කණ්ඩායම් සමාජිකයෝ එකඟ වූහ. ප්‍රාදේශීය භාෂාව කතා නොකරන විදේශිකයන්ට මෙය විශේෂයෙන් ම අදාළ වේ.

ආධාර වැඩසටහන්කරණයේ හා බෙදා හැරීමේ කටයුතුවල නියැළී සිටින ප්‍රාදේශීය හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ කාර්ය භාරය සම්බන්ධයෙන් ද කණ්ඩායම් සාමාජිකයන් අතර සාකච්ඡා විය. එහිදී අවධාරණයට ලක් වූ කරුණක් වන්නේ සමහර වැඩසටහන් තීරණ සංස්කෘතිකමය වශයෙන් නුසුදුසු බව හැඟී ගියත් ඒ සම්බන්ධයෙන් පියවර ගැනීමට ජාතික කාර්ය මණ්ඩලයන්

මැලි වීමයි. ඔවුන්ට වැටහෙන ආකාරයට සමහර තීරණ ගැනීම් සංවිධානයේ ප්‍රමුඛතා අරමුණු නිසා සිදුවන අතර ඒවා වෙනස් කිරීමට තරම් බලයක් තමා වෙත නැති බව ඔවුන්ගේ හැඟීමයි. බොහෝ විට තීරණ ගැනීමේ කාර්යය ඉහළ මට්ටමේ දී සිදුවන අතර එයට එකඟ නොවීමට ඉඩක් නොවේ. විශේෂයෙන් ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය වැනි සුවිශේෂ කරුණු අදාළ වන අවස්ථාවල මෙය සිදුවනු දැකිය හැකිය.

සංස්කෘතිකමය වශයෙන් වඩාත් සුදුසුවන්නේ කුමක්ද යන්න ජාතික කාර්ය මණ්ඩලය මනාව දැන සිටියත් සංයුක්ත සැලසුම් හා වෙනත් ආයතනික ප්‍රමුඛතා ඒ හා සමග එක්වන විට තමා නොසලකා හැරිය යුත්තේ කුමන ප්‍රමුඛතා ද යන්න පැහැදිලි නොවේ. එක් කණ්ඩායම් සාමාජිකයෙන් පැවසූ පරිදි සහන සේවා හා සංවර්ධන මැදිහත් කරුවන් විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කරුණ අවධාරණය කරමින් කාන්තාවන් විසින් ගෘහ මූලිකත්වය දරණ නිවෙස් හෝ වියපත් කාන්තාවන් තෝරා ගැනීම සිදු කළත් සාමාන්‍යයෙන් වියපත් කාන්තාවන් තනිවම නොවෙසෙන බව මෙහිදී ඔවුන්ගේ අවධානයට ලක් නොවේ. වැඩසටහන් පිළිබඳ තීරණ ගනු ලබන අවස්ථාවන් හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කරුණ වැදගත් බව අවධාරණය කර ඇත්නම් ජාතික කාර්ය මණ්ඩලය මෙන් ම සැලසුම් ක්‍රියාත්මක කරන පාර්ශ්වයන් ද ක්‍රියාවලිය සුමුදුව පවත්වා ගෙනයෑම සඳහා කටයුතු කරති. කණ්ඩායම් සාමාජිකයන්ට පෙනී ගිය ආකාරයට ව්‍යාපෘති සැලසුම් කිරීමට පෙර වැඩසටහන්වල ප්‍රමුඛතා හා ඉලක්කවලට බලපෑම් සිදු කිරීමට ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට ඇති අවස්ථා ඉතාම සුළු වේ.

ප්‍රාදේශිය දැනුම හා ධාරිතාව අගය කොට සැලකීම සම්බන්ධයෙන් ග්‍රාහක ප්‍රජාවන් තුළින් එන ඉල්ලීම් කණ්ඩායම් සාමාජිකයන් අතර සංවාදයට බඳුන් විය. එක් කණ්ඩායම් සාමාජිකයෙක් සඳහන් කලේ සහන සේවා ආයතන සිය කටයුතුවල දී ප්‍රාදේශිය වශයෙන් වැදගත් කමක් හා පිළි ගැනීමක් සහිත පුද්ගලයින් යොදා ගන්නේ නම් පණිවිඩය වඩාත් හොඳින් ප්‍රජාව තුළට යන බව බෞද්ධ භික්ෂුන් වහන්සේ නමක් විසින් පැවසූ බවයි. ආයතන මගින් ප්‍රජාවන් හි යහපත නොපතන මැදිහත් කරුවන් සම්බන්ධ කර ගත් විට ශක්තිමත් සම්බන්ධතා ඇති කර ගැනීමට ඇති අවස්ථාව ගිලිහී යයි. ප්‍රාදේශිය නායකයින් හා සමග පවතින සම්බන්ධතාව වැඩි දුරටත් යහපත් හා ඵලදායී කර ගැනීමට නම් අදාළ සහන සේවා ආයතනය විසින් අදාළ ස්ථානයට පැමිණීම මෙන් ම ප්‍රජාව සමග කතා බහ කිරීම ද වැදගත් ය. බාහිර වශයෙන් ලැබෙන ආධාර මිනිසුන්ට විවිධාකාරයෙන් බලපාන බව ආධාර සපයන ආයතන දැන සිටින අතර මේ නිසා ඇතිවන ප්‍රතිඵල ග්‍රහණය කර ගැනීම හෝ සම්මත දර්ශකයන්ට අනුව මැනීම දුෂ්කර වේ. මේ නිසාම සිය කටයුතු නිසා සිදුවන අනපේක්ෂිත බලපෑම් අවම කර ගැනීමට නම් ආයතන විසින් තව දුරටත් සවන් දීම හෝ ප්‍රජාවන් සමග විශ්ලේෂණ කටයුතු සිදු කිරීම වැදගත් වේ.

## 5. ආර්ථික හා සමාජයීය බලපෑම

### අ.) ආර්ථික බලපෑම ඃ වැටුප්, උද්ධමනය, ආර්ථිකය

අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවල වැටුප් නිසා ඇතිවන උද්ධමනය හා විපතට පත් ප්‍රදේශවල මහාපරිමාණ නිවාස ව්‍යාපෘති සිදු කිරීම නිසා ඇති විය හැකි ආර්ථික බලපෑම් සම්බන්ධයෙන් කිහිප දෙනෙක් අදහස් පළ කළහ. විදේශීය කාර්ය මණ්ඩල හා ආයතන ස්ථාපනය වී ඇති නගර වල වෙසෙන විදේශ උපදේශකයන් නිසා මෙරටට විශාල වශයෙන් ඇදී එන විදේශ විනිමය හේතුකොට ගෙන දේශීය ආර්ථිකයට බලපෑම් ඇති වී ඇති ආකාරය

සම්බන්ධයෙන් කිහිප දෙනෙක් අදහස් පළ කළහ. මෙම බලපෑම් විටෙක ඍණාත්මක බලපෑම් ලෙසත් විටෙක ධනාත්මක බලපෑම් ලෙසත් දැක්විණි. ඔවුන් නිසා භාණ්ඩ මිල ඉහල යෑම සිදු වන අතර මේ නිසා සහන සේවා ආයතනවලට සේවා සපයන දේශීය වෙළඳපළට වාසි අත්වෙයි.

"අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන වැඩියෙන් ගෙවන නිසා කුලී මුදල් ඉහල ගිහින් තියෙනවා. නිවාස කුළි ඉහළ ගිහිල්ලා තියෙන්නේ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන ඉහල මුදලක් වැය කරන්න සූදානම් නිසා. මේක දේශීය වැසියන්ට දරන්න බෑ."

-මඩකලපුවේ ප්‍රාදේශීය මානව හිමිකම් පිළිබඳ නීතීඥයෙක්

"අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන වගේම ජාතික රාජ්‍ය නොවන සංවිධාන නිසා ව්‍යාපාරික කටයුතු දියුණු වෙනවා. ආදායම් උපයන මාර්ග ගැන බැලුවමත් රාජ්‍ය නොවන සංවිධාන නිසා ඇති වී තියෙන්නේ යහපත් බලපෑමක්."

-කොළඹ ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සංවිධානයක පර්යේෂකයෙක්

"අපි ප්‍රාදේශිය නායකයො වශයෙන් තරුණයන්ට විශේෂඥ පුහුණුවක් ලබා දුන්නා. අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන විසින් ඒ ගොල්ලන්ට වඩා හොඳ වැටුප් ගෙවලා ඒ ගොල්ලො තමන්ගේ සංවිධානවලට බඳවා ගැනීම නිසා අපිට තරුණයන්ව අපේ කටයුතුවලට යොදා ගැනීමේ අවස්ථාව අහිමි වෙනවා."

-මඩකලපුවේ සුනාමියෙන් විපතට පත් ප්‍රදේශයක සිවිල් සමාජ නායකයෙක්

**ආ) යහපත් බලපෑම් ප්‍රජාව ශක්තිමත් කිරීම හා ඒකාබද්ධ කිරීම**

විවිධ පුද්ගලයින් විසින් අන්තර්ජාතික ආධාර නිසා ඇතිවල වෙනස් ආකාරයන්හි යහපත් බලපෑම් පිළිබඳ සඳහන් කිරීමට යෙදුණි. පසු සුනාමි අවස්ථාවේ දී ප්‍රජා සහයෝගීතාව හා එක්ව කටයුතු කිරීමේ අවස්ථා පිළිබඳ අසන්නට ලැබුණි. විශේෂයෙන් ම සුනාමි විපත සිදු වීමෙන් අනතුරුව උදාවූ පළමු සති කිහිපයේ දී අදාළ ස්ථානවල සිටි විදේශිය සහන සේවකයින් හා දේශීය ආගමික නායකයින් නැවත ගොඩනැගීමේ කටයුතුවල දී එක්ව ක්‍රියාකරන ආකාරය පෙණුනි. සුනාමියෙන් විපතට පත් ප්‍රදේශයක ප්‍රජා සාමාජිකයෙක් සඳහන් කළේ සුනාමියට පෙර අවදියේ දී කුලය හෝ වෙනත් එවැනි කරුණු නිසා සමාජයෙන් කොන් කරනු ලැබ සිටි පුද්ගලයන් සුනාමියෙන් අනතුරුව නිවසක් හා වෙනත් සම්පත් ආධාර වශයෙන් ලැබීමෙන් පසුව සමාජය තුළ පුළුල් ලෙස පිළිගැනීමකට ලක් වූ බවයි. ඌව පළාතේ ප්‍රාදේශීය මුස්ලිම් කාන්තා කණ්ඩායමක නායිකාවක් විස්තර කළේ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයක් සමග එක්ව කටයුතු කිරීමෙන් සිය කණ්ඩායම ප්‍රජා සජීවීකරණ නිපුණත්වයක් ලබා ගනිමින් ඉහළ මට්ටමේ නායකත්ව පුහුණුවක් ලබා ගැනීමට සමත් වූ බවයි. අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සමග කටයුතු කිරීමෙන් සිය කණ්ඩායම ශක්තිමත් වූ බව පැකිළීමකින් තොරව කියා සිටි සුළුතරයක් වූ පිරිස අතරින් මෙම කණ්ඩායම එකකි.

**ඇ) ස්වයං පැවැත්ම හා අන් අයෙක් මත යැපීම**

අන්තර්ජාතික ආධාර මගින් සමාජ ව්‍යූහය හා ප්‍රජාව මත ඇති කරන සියලුම බලපෑම් සමස්තයක් සේ ගත් කළ යහපත් සේ සැලකිය නොහැක. මෙහි දී ඇති විය හැකි අයහපත්

බලපෑම් සේ පෙන්වා දෙනු ලැබුනේ වෙනත් පුද්ගලයින් මත යැපීම ප්‍රජාවක් වශයෙන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීමේ ගුණය ක්ෂය වී යෑම, ප්‍රජාව තුළ ඇති විය හැකි ආතතියයි.

අප සංචාරය කළ බොහෝ ප්‍රදේශවල දී බොහෝ දෙනෙක් සිය ස්වාධීන පැවැත්ම සම්බන්ධයෙන් කතා කළහ. අනුරාධපුරයේ නැවත පදිංචි වූ පුද්ගලයෙක් පැවසුවේ "අපිට ඇත්තටම අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන අවශ්‍ය වෙන්නේ නෑ. මම ග්‍රාමාරක්ෂකයෙක් විදියට රස්සාව කරලා සල්ලි හොයනවා. මම මේ ඉඩම ගත්තේ අවුරුදු 10 කට ඉස්සෙල්ලා. ඒගොල්ලන්ට උදව් කරන්න ඕනෙ නම් ඒක එහෙමයි. උදව් කරන්න ඕනෙ නැත්නම් ඒත් එහෙමයි. අපිට ජීවත් වෙන්න කරදරයක් නෑ." යනුවෙනි. "අනාගතේ දී තව තවත් ආධාර ලැබෙනවා නම් ඒවා අවශ්‍යවන පුද්ගලයින්ට වැදගත් වේවි. ඒත් මට නම් ඒ ගැන වැඩි බලාපොරොත්තුවක් නෑ." නැවත පදිංචි කරවනු ලැබූ කාන්තාවක් කීවාය. "එකම ප්‍රශ්නෙ ආරක්ෂාව. ඒ ප්‍රශ්නෙ විසඳුනොත් අපිට වෙන කිසිම ප්‍රශ්නයක් නෑ. අපිට ඉඩම් තියෙනවා නම් අපිට පුළුවන් ගෙවල් හදාගෙන කරදරයක් නැතුව ජීවත් වෙන්න. ඉඩමකුයි අවශ්‍ය දේවලුයි සැපයුවොත් අපිට ස්වාධීනව ජීවත් වෙන්න පුළුවන්" අනුරාධපුරයේ අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයෙක් පැවසුවේය.

බදුල්ලේ එක්තරා ප්‍රජාවක සමාජිකයන් පිරිසක් පැවසුවේ සහන සේවා ආයතනයක් විසින් අදාළ ප්‍රජාව තුළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමෙන් පසුව ප්‍රජා සාමාජිකයන් විසින් සම්පත් බෙදා හදා ගැනීමට හා එකිනෙකාට උදව් කිරීමට පෙළඹුණු බවයි. ඔවුන් තව දුරටත් සඳහන් කලේ "අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන යන්න ගියත් අපිට කමක් නෑ. ගොඩක් දෙනෙක් දැන් රාජ්‍ය නොවන සංවිධානය මත යැපෙනවා. අපි ඒකට කැමති නෑ. අපිට ඕනෙ ස්වාධීන වෙන්න" යනුවෙනි. එක් ප්‍රජාවක කාන්තාවක් ආඩම්බරයෙන් මෙසේ පැවසුවාය." මොන්ටිසෝරි පවත්වාගෙන යන්නේ අපිම තමයි. අපේ දරුවන්ට පාසැලක් පවත්වාගෙන යන්නත් අපි සහයෝගය දෙනවා. අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානය විසින් අපි වෙනුවෙන් ලොකු කාර්යභාරයක් ඉටු කරලා තියෙනවා." "ආධාර වෙනුවෙන් බලාගෙන ඉඳීමෙන් වැඩක් වෙන්නේ නෑ. තමන්ට අයිති දේ ලබා ගන්න නම් වැඩ කරන්න ඕනේ. ඒක තමයි අපි රාජ්‍ය නොවන සංවිධානවලින් ඉගෙන ගත්ත පාඩම. වැඩ සටහන් අරමුණ කරගන්න ඕනේ මිනිස්සුන්ගේ ආකල්ප වෙනස් කරන්න. ඒ ගොල්ලො හැම තිස්සෙම කියන්නේ මට බෑ කියලා. මේ ආකල්ප මට පුළුවන් කියලා වෙනස් කිරීම වැදගත්." පුත්තලමේ ප්‍රාදේශිය සංවර්ධන ආයතනයක නිලධාරියෙක් පැවසීය.

බාහිර ආධාර මත යැපීම තව දුරටත් වැඩි වීම සම්බන්ධයෙන් බොහෝ දෙනා අදහස් පළ කළහ. "මේ රටේ සම්පත් ගොඩාක් තියෙනවා. ඒත් දුප්පත් මිනිස්සුත් ගොඩක් ඉන්නවා. ප්‍රජා සංවර්ධනය තුළින් දුප්පත්කම තුරන් කිරීම කියන ඉලක්කෙට තාම ලඟා වෙන්න බැරි වෙලා තියෙනවා. ඒ මොකද කියනවා නම් මිනිස්සු අනෙක් අය මත යැපෙන්න පුරුදු වෙලා ඉන්න නිසා. බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවියෙක් පැවසීය. රාජ්‍ය නොවන සංවිධාන නිසා මිනිස්සුන්ගේ ස්වාධීන නැගී සිටීම දුර්වල වෙලා තියෙනවා. මිනිස්සු හැම විටම ආධාර ලැබෙනකල් බලාගෙන ඉන්නවා." පුත්තලමේ පූජකවරයෙක් පැවසීය.

බොහෝ ප්‍රදේශවල දී බාහිර බලපෑම් නිසා කෑදර කම වර්ධනය වීම ග්‍රාමීය මට්ටමින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම, ආදී ගැටලු පැන නැගීම සම්බන්ධයෙන් ඔවුහු අදහස් පළ කළහ. බදුල්ල හා ගාල්ල ප්‍රදේශයේ ආධාර ලැබීම නිසා මිනිසුන්ගේ අගයන් අයහපත් ලෙස වෙනස් වී

ඇති ආකාරය එනම් කම්මැලිකම හා නිරන්තර ආධාර අපේක්ෂාව වර්ධනය වී ඇති ආකාරය දැකිය හැකි විය.

"ආධාර ලැබීමේ ප්‍රතිඵලයක් විදියට මිනිස්සුන්ගේ පෞද්ගලික අගයන් වෙනස් වෙනවා. මුලදී ඒ ගොල්ලො එකිනෙකාට උදව් කරන්න ස්වේච්ඡාවෙන් ම ඉදිරිපත් උණා. ඒත් ඒ ගොල්ලො අතට මුදල් එන්න පටන් ගත්තට පස්සේ මිනිස්සු කෑදර වෙන්න පටන් ගත්තා. එකිනෙකා කෙරෙහි ඇති විශ්වාසය ගෞරවය බිඳිලා ගියා."

-ගාල්ලේ පූජකවරයෙක්

ප්‍රජා සංවර්ධන කටයුතු වෙනුවෙන් හා පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් මිනිසුන් වෙත මුදල් ආධාර සැපයීම අනෙක් අයෙක් මත යැපීම කෙරෙහි මිනිසුන් යොමු කරවන්නක් බව බොහෝ දෙනාගේ මතය විය. කලකට පෙර බොහෝ දෙනෙක් ප්‍රජා ව්‍යාපෘතිවල දී ගෙවීමකින් තොරව කටයුතු කළ බවත් දැන් ඔවුන් රාජ්‍ය නොවන ආයතනයක් මගින් ගෙවීම් කරන තෙක් බලා සිටින බවත් අසන්නට ලැබිණි. අතීතයේ දී සිය ගම්මානවල තත්වය වැඩි දියුණු කර ගැනීමට හා ප්‍රජා කටයුතු වලදී එක්ව කටයුතු කිරීම සඳහා ගැමියෝ ප්‍රජා සංවිධාන හා එක්ව සිටියහ. එහෙත් වර්තමානයේ දී බොහෝ දෙනෙක් ප්‍රජා මූලික සංවිධානවලට එක් වන්නේ ආධාර ලැබීමට හෝ වෙනත් කිසියම් ආකාරයක ප්‍රතිලාභයක් ලැබීමේ අපේක්ෂාවෙනි.

"පුද්ගලයින්ට ගෙවීම් කරලා වැඩ කරව ගන්න බාහිර පුද්ගලයින් හින්දා එකිනෙකාට උදව් කර ගන්නා දේශීය වටිනාකම් නැතිවෙලා යනවා."

-බදුල්ලේ ක්‍රිස්තියානි ආගමික නායකයෙක්

ගාල්ලේ සමහර පුද්ගලයින් සඳහන් කළ අන්දමට අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලට ග්‍රාමීය වශයෙන් පැවතුණු ව්‍යුහයන් ඒ ආකාරයෙන් යොදා ගැනීමේ හැකියාව තිබුණි. එහෙත් සිදු වූයේ ඔවුන් විසින් නව ව්‍යුහයන් සකස් කරමින් මිනිසුන් තුළ පැවති ව්‍යුහයන් හා බලය සොරා ගැනීමයි.

බදුල්ලේ එක් ගමක දී මිනිසුන් විසින් පෙන්වා දෙනු ලැබූයේ ආධාර ව්‍යාපෘති නිසා තවත් ආකාරයක ගැටලුවක් ඇති වෙමින් ඇති බවයි. උදාරහණයක් වශයෙන් ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිවල දී නඩත්තු කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා නොදීම නිසා උපකරණවලට හානි සිදු වූ අවස්ථාවන්වල දී අසළ නගරයේ වෙසෙන කාර්මිකයන්ගේ උපකාර ලබා ගැනීමට සිදුවන අතර මෙය ඉතා මිල අධික වේ. මිනිසුන්ගේ ධාරිතාවන් නිසියාකාරව හඳුනාගෙන ආයෝජනයන් සිදු කළේ නම් යැපීම යම් ප්‍රමාණයකින් අඩු කර ගැනීමට ඉඩ කඩ තිබූ බව ඔවුන්ගේ අදහසයි. "අපිට ගොඩක් දේවල් කරන්න පුළුවන්. සමහර වෙලාවට අපිට අවශ්‍ය වෙන්නේ සම්පත් සමහර වෙලාවට අවශ්‍ය වෙන්නේ අලුත් දැනුම. අපිට ජීවිතේ හැම දෙයක් ම හම්බ වෙන්නෙ නෑ. අපිට ඕනේ ස්වාධීන වෙන්න. එතකොට අපිට මීට වඩා හොඳ ජීවිතයක් ගත කරන්න පුළුවන්." බදුල්ලේ කාන්තාවක් කීවාය.

"විශාල වශයෙන් ලැබෙන ආධාර නිසා ආකල්පවල සැලකිය යුතු වෙනසක් ඇති වෙලා තියෙනවා. යැපීම හා කෑදරකම යතාර්ථයක් බවට පත්වෙලා. සමහර රාජ්‍ය නොවන සංවිධාන අනවශ්‍ය දේවල් බෙදා හරිනවා. ඒගොල්ලො පොරොන්දු වුණ ප්‍රතිඵල ලබා ගත්තා කියලා පෙන්නන්න නුසුදුසු විදියට කටයුතු කරනවා. ඒකට හොඳම උදාහරණයක් විදියට රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබෙන ණය දක්වන්න පුළුවන්. ගොඩක් දෙනා ප්‍රජා මූලික සුළු ණය

වෙනුවට දුන් ඉල්ලන්නේ රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබෙන ණය. ඒ ගොල්ලො හිතනවා ඒවා නිකං ලැබෙන දේවල් කියලා. මොකද ගොඩක් දෙනෙක් ඒවා නොගෙවා ඉන්නවා ඒ ගොල්ලො දැකලා තියෙනවා. ඒත් ඉතිරිකිරීම් කණ්ඩායමකින් ගන්න ණය මීට වඩා වෙනස්. ඒක මීට වඩා වගකීම් සහිතයි. ඒ ගොල්ලො අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන දකින්නේ ලේසියෙන් සල්ලි ගන්න පුළුවන් ලේසි බැංකු විදියට."

-කොළඹ විදේශීය ආධාර සපයන පාර්ශ්වයක නියෝජිතයෙක්

තනි පුද්ගල වශයෙන් සිදුවන යැපීම හැරුණු කොට ප්‍රාදේශීය වශයෙන් හා ජාතික වශයෙන් බාහිර ආධාර මත යැපීම සම්බන්ධයෙන් බොහෝ දේශපාලන පක්ෂ සාමාජිකයින් හා රාජ්‍ය නිලධාරීන් විසින් පෙන්වා දී ඇත. "මෙහේ දීර්ඝ කාලයක් තිස්සේ එකම දේ කරමින් රාජ්‍ය නොවන සංවිධාන රැඳී සිටීමේ අවශ්‍යතාවක් නෑ. කිසියම් අවස්ථාවක දී මේ කටයුතු සියතට අරගෙන බාහිර ආධාරවලින් තොරව පවත්වාගෙන යෑමේ හැකියාව රජයට තියෙන්න ඕනෙ. බදුල්ලේ රාජ්‍ය නිලධාරියෙක් කීවේය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් පැවසුවේ රටක ස්වාධීන පැවත්මට වගේම අනන්‍යතාවට හානි නොකරන තාක් කල් ආධාර කියන්නේ නරක දෙයක් නෙමෙයි." යනුවෙනි.

**සවන්දීමේ කණ්ඩායමේ සිතාබැලීම්**

සමහර ආයතන මගින් සිදු කරන කටයුතු නිසා යැපීම වැඩි වන කාරණය පිළිබඳව කණ්ඩායම් සාමාජිකයන් අතර සාකච්ඡා ඇති විය. සමහර සාමාජිකයන් විසින් පෙන්වා දුන් ආකාරයට කෙනෙක් නොමැති විට උදව් සැපයීමට වෙනත් කෙනෙක් හැමවිටම සිටියි. මේ හේතුව නිසාම ආධාර ලැබෙන පුද්ගලයින් ප්‍රමාණාත්මකව ඉහලය. නිපුණතා සංවර්ධනයකින් තොරව ආධාර සැපයීමේ කටයුත්ත පමණක් සිදු වීමේ ප්‍රතිඵලයක් වනනේ ආධාර ලබන පාර්ශවයන් දිගින් දිගටම ඒවා බලාපොරොත්තු වීමයි.

ආධාර සපයන ආයතන දිගින් දිගටම රැඳී සිටීම නිසා මිනිසුන්ගේ අපේක්ෂා කෙරෙහි ඇතිවන බලපෑම සම්බන්ධයෙන් ද කණ්ඩායම් සාමාජිකයන් අතර සංවාදයට බඳුන් විය. බොහෝ ප්‍රජාවන් විසින් ආධාර සපයන සංවිධාන දීර්ඝ කාලීන වශයෙන් අදාළ සන්දර්භය තුළ රැඳී සිටීම සම්බන්ධයෙන් ප්‍රශංසාමුඛයෙන් සඳහන් කළහ. එමගින් සන්දර්භය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම මෙන්ම ශක්තිමත් සබඳතා ගොඩනගා ගැනීම ද සිදු කළ හැකි වේ. එහෙත් අනෙක් අතට බලන විට ව්‍යාපෘතියක කටයුතු ඉක්මණින් අවසන් වීමේ දී පුද්ගලයින්ට සිය ධාරිතාව වඩාත් හොඳින් වැඩි දියුණු කර ගත හැකි වේ. එක් කණ්ඩායම් සාමාජිකයෙක් කවුරුන් කා මත යැපෙයිද? අප විසින් අප සඳහාම විවිධ කටයුතු කරමින් අපගේ පැවැත්ම දික් කර ගැනීමක් සිදු කරනවාද? අප අපගේ රාජ්‍ය නොවන සංවිධානයේ තිරසාරත්වය පිළිබඳ උනන්දු වේද? යන ගැටලු මතු කළේය. තවත් කණ්ඩායම් සාමාජිකයෙක් පවසා සිටියේ යැපීම එතරම් අයහපත් තත්වයක් නොවන බවයි. ප්‍රජා මට්ටමින් කිසියම් අන්තර්යැපීමක් අවශ්‍ය බව ඔහු තව දුරටත් සඳහන් කර සිටියේය.

දේශිය හා විදේශීය කාර්ය මණ්ඩලයන් අතර ඇති අන්තර් සම්බන්ධතාව පිළිබඳව ද සාකච්ඡාවට භාජනය විය. යැපීම යම්තාක් දුරකට අඩු කිරීම සඳහා විශේෂඥයින් පැමිණ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සිදු කළ අතර එහෙත් තවමත් දේශිය කාර්ය මණ්ඩලය විදේශීය කාර්ය මණ්ඩලය මත යැපීම සිදු වේ. විදේශීය කාර්ය මණ්ඩලය විසින් ප්‍රාදේශිය කාර්ය මණ්ඩලය පුහුණු කිරීමක් විනා ඔවුන් පාලනය කිරීමක් සිදු නොකළ යුතු වේ. එමෙන්ම ප්‍රාදේශීය වශයෙන්

සැලසුම් සකස් කිරීම හා තීරණ ගැනීමේ කටයුතුවල යෙදීමට ඔවුන් දිරිමත් කිරීම ද වැදගත් ය. තම රැකියා අහිමි වනු ඇතැයි යන බිය නිසා සමහර අවස්ථාවල දී නිහඬව සිටීමට ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයට සිදුවේ. කිසියම් ව්‍යාපෘතියක ආරම්භක පියවර අදාළ සන්දර්භය තුළ නුසුදුසුබව හැඟී ගියත් සිය රැකියා අහිමි වනු ඇතැයි යන බිය නිසා ජ්‍යෙෂ්ඨ වැඩසටහන් කාර්ය මණ්ඩලය හා මූලස්ථානය සමග එකඟ නොවීමට ඔවුහු පැකිලෙති.

**ඈ) අයහපත් සමාජයීය බලපෑම් : ප්‍රජාවන් අතර හා ප්‍රජාවන් තුළ ඇතිවන ආතතිය**

ආධාර නිසියාකාරව බෙදී නොයන බවට වන මතය නිසා ප්‍රජා මට්ටමින් ඇති වන බෙදීම් සම්බන්ධයෙන් බොහෝ දෙනෙක් අදහස් පළ කළහ. ප්‍රජාවන් අතර හා ප්‍රජාවන් තුළ ඇති විය හැකි මේ හැඟීම් ඊර්ෂ්‍යාවේ සිට කෝපය දක්වා විවිධ වේ. සුනාමියෙන් විපතට පත් ගාල්ලේ කාන්තාවක් සුනාමියෙන්  විපතට පත් ආධාර ලැබූ තවත් පාර්ශ්වයක් ගැන සඳහන් කරමින් "මට උන්ට ගලකින් ගහන්න හිතෙනවා." යැයි කීවාය. පුත්තලමේ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයක් මගින් ගොඩනගන ලද ළදරු පාසැලක් සම්බන්ධයෙන් සඳහන් කරමින් අභ්‍යන්තර අවතැන් වූ අයෙක් "ඔව් මොන්ටිසෝරිය ප්‍රයෝජනවත් තමයි. ඒත් ඒක හදලා තියෙන්නේ පෞද්ගලික ඉඩමක. දූන් ඉඩම් අයිතිකාරයා තමයි ඒක පාලනය කරන්නේ. ඒක පොදු ඉඩමක හැදුවා නම් අපේ ගම දෙකට බෙදෙන්නේ නෑ" යනුවෙන් පැවසුවේය.

"වාරිමාර්ග ව්‍යාපෘතිවල යහපත් වගේ ම අයහපත් ප්‍රතිඵලත් තියෙනවා. යළි පදිංචි කරවීම නිසා ගොඩක් ගොවියන්ට නැවත වැඩ හම්බ උණා. ඒත් මේ නැවත පදිංචිවුන අයගෙන් බොහොමයක් දෙනා සිංහල. ජන විද්‍යාව වෙනස් කරන්න රජය අන්තර්ජාතික සහයෝගය ලබාගෙන තියෙනවා."

-ඌව පළාතේ ප්‍රජා නායකයෙක්

"සුනාමියෙන් පස්සෙ ගොඩක් දුෂ්කරතා ඇති වුණා. ගැටුම්වලින් අවතැන් වෙලා අවුරුදු ගණන් කඳවුරුවල ගාල් වෙලා හිටපු පුද්ගලයින්ට සාපේක්ෂව සුනාමියෙන් අවතැන් වූ අයට වැඩිපුර ආධාර හම්බ වුණා."

-කොලඹ සහන සේවා ආයතනයක නායකයෙක්

"පිටරට අනුග්‍රාහකයො තෝරගත්ත ළමයි මගේ දුවලට හරියට වෙනස් කම් කරනවා. කොන් කරනවා. ගම පුරාම දෙමව්පියො ළමයි අසල්වැසියො අතරෙ තියෙන්නෙ නෝක්කඩු."

-බදුල්ලේ දෙදරු මවක්

පුත්තලමේ අභ්‍යන්තර අවතැන් වූවන් හා ප්‍රාදේශිය ප්‍රජාව අතර ඇති වී ඇති ආතතිය සම්බන්ධයෙන් බොහෝ දෙනෙක් සඳහන් කළහ. ප්‍රාදේශීය ප්‍රජාවේ අයෙක් "හැම දෙයක්ම සාමකාමී විදියට පෙනුනට ප්‍රාදේශීය ප්‍රජාව හා අභ්‍යන්තර අවතැන් වූවන් අතරෙ ගැටුම් තියෙනවා. මේ දෙගොල්ලොම මුස්ලිම්." යැයි කීවේය. ප්‍රදේශයේ එක් පාසැලක් අභ්‍යන්තර අවතැන් වූවන්ගේ දරුවන් සඳහා වෙන්කර තිබීම නිසා ප්‍රාදේශීය ප්‍රජාව තුළ විශාල ඊර්ෂ්‍යාවක් ඇති වී තිබේ. "අපි අභ්‍යන්තර අවතැන් වූවන්ට ඉඩ දුන්නා. ඒත් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන අපිව නොසලකා හරිනවා." සාප්පු සේවකයෙක් පැවසුවේය. මුස්ලිම් ජාතික පූජකවරයෙක් මෙසේ ප්‍රකාශ කළේය. "මුලින් මුලින් අභ්‍යන්තර අවතැන්වූවන්ට ප්‍රජාව උදව් කළා. පස්සේ ඒ ගොල්ලන්ගෙ උදව් ලැබෙන්න පටන් ගත්තට පස්සෙ ඒ ගොල්ලන්ගේ ජීවන

තත්වය වඩාත් හොඳ අතට හැරුණා. ප්‍රාදේශිය ප්‍රජාවන් ගැන කවුරුත් සැලකුවේ නෑ. ඒ ගොල්ලන්ව අත ඇරලා දැම්මා. ඒ ගැන ඒගොල්ලන්ට තියෙන්නේ කේන්තියක්."

"ඒ ගොල්ලො ආවෙ කිසිම දෙයක් නැතුව. ඊට අවුරුද්දකට දෙකකට පස්සෙ ඒ ගොල්ලන්ගෙ අතට සල්ලි ලැබුණා. ඉඩම් ලැබුණා. ගෙවලුත් හදා ගත්තා. අපිට තාම ලැබෙන්නේ සලාකෙ විතරයි. අපි තාම දුප්පත් උණත් අපිට කිසිම දෙයක් ලැබෙන්නේ නෑ." සපත්තු මහන්නෙක් කීවේය.

අභ්‍යන්තර අවතැන් වූවන් කිහිප දෙනෙක් ද අප සමග කතා කළ අතර ඔවුන්ගේ අදහස වූයේ ප්‍රාදේශීය ප්‍රජාව තුළ පවත්නා දිළිඳුබව ද ආමන්ත්‍රණය විය යුතු බවයි. එක් අයෙක් මෙසේ පැවසුවේය. "අපි දන්නවා ප්‍රාදේශීය ප්‍රජාවට උදව් හම්බවෙන්නේ නෑ කියලා. ඒත් අපි හිතන්නේ ඒ ගොල්ලන්ටත් උදව් කළ යුතුයි කියලයි. ඒ ගොල්ලන්ට උදව් නොකරන්නේ ඒ ගොල්ලන්ට කිසි දෙයක් නැති වෙලා නැති නිසා වෙන්න ඇති. අනෙක් එක අපිට තමයි උදව් හිමිවිය යුතු කියලා හිතන නිසා වෙන්න ඇති."

කෙසේ වෙතත් පුත්තලමේ දිස්ත්‍රික් නිලධාරියෙක් පැවසුවේ රජය හා සහන සේවා ආයතන යන දෙපාර්ශ්වය විසින් ම මේ ආතති ලිහිල් කිරීමට හැකි සියලුම පියවර ගනිමින් සිටින බවයි. ඒ පිළිබඳව ඔහු මෙසේ උදාහරණ දැක්වීය. "අභ්‍යන්තර අවතැන් වූවන් වෙනුවෙන් වැසිකිලි 20ක් හැදුවොත් ප්‍රාදේශීය ප්‍රජාව වෙනුවෙන් 10 හදනවා." "ක්ෂණික ආධාර ලැබිය යුත්තේ අභ්‍යන්තර අවතැන් වූවන්ට කියන කාරණය එක්ක අපි එකඟ වෙනවා. එත් දිළිඳුකමේ සීමාවෙන් එපිට ඉන්න අභ්‍යන්තර අවතැන් වූවන් වගේ ම ප්‍රාදේශීය ප්‍රජාව වෙනුවෙනුත් කිසියම් දීර්ඝ කාලීන සැලැස්මක් තියෙන්න ඕනෙ." ප්‍රාදේශීය සහන සේවා නිලධාරියෙක් පැවසීය.

අවසාන වශයෙන් ජාතීන් වශයෙන් පවතින බෙදීම මත අයහපත් බලපෑමක් ඇති කරමින් සිදුවන සහන සේවා ආයතන මගින් සේවාවන් සපයා ගැනීම සම්බන්ධයෙන් බොහෝ දෙනෙක් අප වෙත උදාහරණ ඉදිරිපත් කළහ. මඩකලපුව දිස්ත්‍රික්කයේ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන විසින් දෙමළ ජාතිකයින් සහන සේවකයින් ලෙස වැඩි වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන්ට පරිපාලන තීරණ ගැනීමේ අවස්ථා ලැබුණ විට දී තව දුරටත් දෙමළ ජාතික සේවකයින් බඳවා ගැනීම හා දෙමළ ප්‍රජාවන්ට වැඩි ප්‍රතිලාභ ලැබෙන සේ වැඩසටහන් තීරණ ගැනීම සිදු වේ. අනෙක් අතට අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන මගින් බඳවා ගන්නා මුස්ලිම් ජාතිකයින් සංඛ්‍යාව අඩු බව පෙනී යයි. මේ හේතුව නිසා ඔවුන්ගේ ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ අඩු වී ඇත. මුස්ලිම් දේශපාලඥයන් මුස්ලිම් ප්‍රජාවට පමණක් උපකාර කරන්නේ මේ හේතුව නිසා බව සිතිය හැකිය.

## 6. ආධාර සපයන්නන් හා සැලසුම් ක්‍රියාත්මක කරන්නන්ගේ කාර්යභාරය හා වගකීම්

සෑම සංවාදයක දී ම ජනතාව විසින් ආධාර සපයන්නන් හා ක්‍රියාත්මක කරන්නන්ගේ කාර්ය භාර්යය හා වගකීම් සම්බන්ධයෙන් ප්‍රශ්න නගනු සිය මතයන් බෙදා හදා ගනු මෙන්ම නව යෝජනා ඉදිරිපත් කරනු ද දැකිය හැකි විය. ආධාර සපයන්නන් යන වදන ඇසෙන විට කිසිම කෙනෙක් පිටරට එසේත් නැත්නම් කොළඹ ස්ථාපනය වී ඇති ආධාර සපයන ආයතන හෝ සිය දේශීය ආයතන හරහා ව්‍යාපෘති දියත් කරන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන අතර වෙනසක් නොදකියි. බොහෝ දෙනෙකුට ශ්‍රී ලංකාව තුළ මූල්‍යාධාර සැපයීමට මෙන්ම ආධාර සැපයීමට ඉදිරිපත් වී සිටින ඕනෑම ආයතනයක් ආධාර සපයන්නෙක් වේ.

ආධාර සපයන්නෙක් විසින් කුමන කාර්යභාරයක් ඉටු කළ යුතු ද යන ප්‍රශ්නයට ජනතාව වටහා ගත් ආකාරයට සංවර්ධන වැඩ සටහන්වල මුදල් සම්පාදකයෙකු එසේත් නැත්නම් බැංකුවක කාර්යභාරයේ සිට සමහර අවස්ථාවල දී වැඩ සටහන්වල ගුණාත්මකභාවය හා සාධාරණත්වය තහවුරු කිරීම උදෙසා නිරීක්ෂණ සිදු කිරීම එනම් පොලිස් නිලධාරියෙකුගේ කාර්යභාරය එසේත් නැත්නම් මිතුරෙකු සගයෙකු හෝ උපදේශකයෙකුගේ කාර්යභාරය දක්වා පරාසයක් තුළ විහිදී තිබිණි. ආධාර සපයන ආයතනයන්හි කර්යභාර්ය හා වගකීම පිළිබඳ පොදු තේමාව, අද දවසේ අඛණ්ඩ සන්නිවේදනයේ හා ආධාරකරුවන් හා ප්‍රතිලාභී ප්‍රජාවන් අතර සම්බන්ධතාවය ගොඩනැගීමේ අවශ්‍යතාවයක් බවට පත් වී ඇත.

**අ) නියමිත කාර්යයන් හා අපේක්ෂා පිළිබඳ අදහස් දැක්වීම**

අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා ආධාර සපයන ආයතන විසින් සිය ප්‍රතිලාභ ලබන්නන් වෙනුවෙන් කළ හැකි මෙන්ම දැනට කරමින් සිටින දෑ පිළිබඳව පැහැදිලිව දැක්විය යුතු බව ජනතාවගේ අදහසයි. මෙසේ සිදු නොවුන හොත් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා ආධාර සපයන්නන් වෙතින් ඔවුන්ට කළ හැකි ප්‍රමාණයට වැඩි යමක් බලාපොරොත්තු විය හැකි බව ඔවුහු පවසති. මෙසේ ඇති වී ඇති සන්නිවේදන දුර්වලතා හේතුවෙන් ප්‍රතිලාභ ලබන්නන් අපේක්ෂා කරන සේවාව නොලැබී යාම නිසා ඔවුන්ට අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ඇත්තේ අවිශ්වාසයකි. එමෙන් ම කෝපයකි.

"අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන දැනගන්න ඕනේ මිනිස්සුත් එක්ක කටයුතු කරන්නේ කොහොමද කියලා. ආධාර ලබන්නන් එක්ක පවතින මහජන සම්බන්ධතාවත් වැදගත්."

-මඩකලපුවේ දේශීය මානව හිමිකම් පිළිබඳ අභිදේශකයෙක්

"ඔබේ සංවිධානය කරන්නේ මොනවද කියලා මිනිස්සුන්ට කියා දෙන්න ඕනේ. මෙහෙම කිව්වම ගොඩක් දෙනා තේරුම් ගන්නවා. ඒ මාර්ගයෙන් ඇතිවෙන දුර්අවබෝධය නැති කරන්න පුළුවන්."

-රාජ්‍ය නොවන සංවිධානයක් පවත්වා ගෙන යන ගාල්ලේ බෞද්ධ හිමිනමක්

"අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයක් ආවාම ඒ සංවිධානය තේරුම් ගන්න ඕනේ අනෙක් අයගේ අවශ්‍යතාවන් මොනවද කියලා. ඒ වගේම හැමදෙනාටම පැහැදිලි කරන්න ඕනේ තමන්ට කරන්න පුළුවන් මොනවද කියලා. එතකොට වැරදි අවබෝධයක් ඇති වෙන්නේ නෑ."

-බදුල්ලේ ගොවියෙක්

"අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන කෙලින් ම ප්‍රජාවන් වෙත ඇවිල්ලා ඒ අයගේ අවශ්‍යතා හඳුනා ගැනීම වැදගත්. ලියකියවිලි අරන් එන එකට වඩා ප්‍රජාව සමග කතා කරන එක වැදගත්. ඒක ඕගොල්ලො අද කරන දේ වගේ වෙන්න ඕනේ."

-අනුරාධපුරයේ ගොවියෙක්

"මෙම ක්‍රමයේ දක්නට ලැබෙන දුර්වලතාවක් වන්නේ ප්‍රතිලාභ ලබන ප්‍රජාවට ඔවුනට ආධාර සැපයීම කෙරෙහි සහභාගීවීමට ඊට අභියෝග ඉදිරිපත් කිරීමට හා ඔවුන්ගේ විකල්ප අවස්ථා ඉහළ නැංවීමට තුඩු දෙන තොරතුරු හිඟ වීමයි. අන්තර්ජාතික ආයතනවලට කිරීමට හැකි දේ අධි තක්සේරු නොකරන්න ප්‍රජාව දැනුවත් කිරීම වැදගත්. ඒ වගේම කිසියම් ව්‍යාපෘතියක සාර්ථකත්වයට බලපාන අනෙකුත් සාධක හඳුනා ගැනීමත් වැදගත් දෙයක් ඒ කියන්නේ කිසියම්

ව්‍යාපෘතියකින් උපරිම ප්‍රතිලාභ ලබන්න නම් තමන් කරන්න ඕනේ මෙනවද කියලා ජනතාව දැනුවත් කරන්න ඕනේ."

-කොළඹ අන්තර්ජාතික සංවිධානයක වැඩ සටහන් නිලධාරියෙක්

"සමහර උදවිය පෙර ව්‍යාපෘති ස්ථාපිත කිරීම් කටයුතු දිහා බලන්නේ සැකෙන්. රාජ්‍ය නොවන සංවිධානවල කාර්ය මණ්ඩල ආකල්ප ගැන සඳහන් කරනකොට නොසැලකිලිමත් කියන වචනය නිතරම පාවිච්චි වෙනවා. ගොඩක් දෙනා අන්තර්ජාතික රජ්‍ය නොවන සංවිධානවල ව්‍යාපෘති ගැන තොරතුරු දන්නේ නෑ. ගොඩක් වෙලාවට සමීක්ෂණ හා ඇගයීම් සිදු කරනකොට අනාගතයේ සිදු කිරීමට බලාපොරොත්තු වෙන දේවල් ගැන කිසිම දෙයක් සඳහන් කරන්නේ නෑ. සමහර වෙලාවට අපිට ඇහිලා තියෙනවා ගමකට ඇවිල්ලා වැඩි දුර තොරතුරු මොනවත් නොකියා සමීක්ෂණයක් කරලා යන අයට සමීක්ෂක භූතයෝ කියලා කියනවා. මේ අය ආයෙ කිසි දවසක එන්නෙත් නෑ."

"සමහර රාජ්‍ය නොවන සංවිධාන ඇවිල්ලා තොරතුරු එකතු කරගෙන යනවා. අයෙත් කිසිම දවසක එන්නෙ නෑ. මේ හේතුව නිසා මිනිස්සු පීඩනයට පත්වෙලා ඉන්නේ. ඉන් පස්සේ තව තවත් සංවිධාන සමීක්ෂණවලට ආවම මිනිස්සු කැමති වෙන්නේ නෑ කතා බහ කරන්නවත්."

-බදුල්ලේ ගැමි කාන්තාවක්

"විදේශීය මූල්‍යාධාර යටතේ දේශීය ප්‍රජා මූල සංවිධාන මගින් සිදු කිරීමට නියමිත සාම කොමිටියක් ගැන ඒකට සම්බන්ධ ප්‍රජාවන් තුළ සමීක්ෂණ කරලා තියෙනවා. මේ කියන්නේ මොනවද කියලවත් අපිට තේරෙන්නේ නෑ. ඒකෙන් මොනද කරන්නේ කියන එකත් අපි දන්නේ නෑ. මේක අපිට ඕන දෙයක් ද කියන එක ගැනවත් අපිට හරි අවබෝධයක් නෑ. මේ සමික්ෂණවලින් පස්සේ සිද්ද වෙන්නේ මොකක්ද කියලා අපි බලාගෙන ඉන්නවා. මේ වගේ ව්‍යාපෘති ගැන තීරණය කරන්නෙ කොහොමද කියන එක අපිට ප්‍රශ්නයක්."

-බදුල්ලේ ගැමි කාන්තාවක්

"සමහර ආයතන ඇවිල්ලා සමීක්ෂණ කරනවා. ඒත් ඒ ආයතන එන්නේ මොකටද කියලවත් මොකද කරන්නේ කියලවත් කිසි කෙනෙක් දන්නේ නෑ. සමහර ආයතනවලට නම් පැහැදිලි අරමුණු තියෙන බව පේනවා. ඒත් තවත් සමහර සංවිධානවලට තමන් කරන්න ආව කටයුත්ත සම්පූර්ණ කරගන්නවත් ලැබෙන්නේ නෑ. ඒ මොකද කියනවා නම් ප්‍රජාවට මේ ආයතන ආවේ මොකක් කරන්නද ඒ අයගේ අරමුණු මොකක්ද කියන එක ගැන අවබෝධයක් නැති නිසා."

-අනුරාධපුරයේ විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක්

සන්නිවේදනයේ ඇති දුර්වලතා හා තොරුතුරු හරිහැටි හුවමාරු නොවීම නැගෙනහිර ප්‍රදේශයේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවල බරපතල ගැටලුවක් බවට පත් වී ඇති අතර අනුරාධපුරයේ අර්බුදවලට මුහුණ පා ඇති ප්‍රදේශවලද මෙය නැගෙනහිර ප්‍රදේශයේ තරම් බරපතල නොවූවද ගැටලුවක් සේ පවතියි. මඩකලපුව ප්‍රදේශයේ දී අභ්‍යන්තර අවතැන් වූවන් යළි සිය ගම්බිම්වලට යා හැකි වේද යන්න පිළිබඳව කිසියම් අවිනිශ්චිත භාවයක පසුවන්නේ ඔවුන්ට සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව ප්‍රාදේශිය පාලනය ඔවුන් සමග සාකච්ඡා කර නොමැති බැවිනි. මොවුන් අවතැන් වූවන් සඳහා වන කඳවුරුවල වාසය කරන අතර ඔවුන්ට ලැබිය යුතු සේවා හා ආධාර පිළිබඳව ඔවුන් තුළ පැහැදිලි අදහසක් නොමැත. එමෙන්ම ආහාර සලාකය ඇතුළු ඔවුන්ට නිරන්තරයෙන් හිමිවිය යුතු දේ ගැන ඔවුහු නොදනිති. "අපි මෙතන ඉන්නේ එක්දාස් නවසිය අනූ ගණන්වල ඉඳලා. සැරින් සැරේට එක එක සංවිධාන ඇවිල්ලා එක

එක දේවල් පොරොන්දු වෙලා යනවා. ඒත් මේ වෙන කල් ම කිසිම දෙයක් ලැබිලා නම් නෑ. සමහර අය ඇවිල්ලා එක එක පොරොන්දු දීලා එක එක විදියෙ ගණන් මිනුම් අරගෙන යනවා. එත් ඒවයින් කිසිම ප්‍රතිඵයක් නෑ. ඇවිල්ලා පොරොන්දු දීලා යනවා විතරයි." පුත්තලම ප්‍රදේශයේ අවතැන්වූවන් ගේ කඳවුරක සිටි වියපත් අයෙක් මෙසේ කීවේය.

බොහෝ දෙනෙක් ප්‍රජා සජීවීකාරකයින් ඔස්සේ අවබෝධය වැඩි දියුණු කර ගැනීම සම්බන්ධයෙන් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලට ප්‍රශංසා කළහ. අනුරාධපුර ප්‍රදේශයේ සාප්පු සේවකයෙක් පැවසූ අන්දමට "අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන ප්‍රජාවන් තුළින් තොරතුරු ලබා දීමක් බලාපොරොත්තු වෙනවා. ඒත් ඔවුන්ගේ වැඩකටයුතු කරගෙන යන්න උදව් වෙන ආකාරයේ තොරතුරු ප්‍රජාවෙන් සැපයෙන්නෙ නෑ. අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන මගින් ප්‍රජා සජීවීකාරකයින් එවන්නේ මිනිස්සු තුළ අවබෝධය වැඩි දියුණු කරලා කටයුතු කළ යුතු ආකාරය ගැන කිසියම් වැටහීමක් ලබා දෙන්න. මේකෙන් පේනවා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාපෘතිවලට කොච්චර කැප වෙලා ඉන්නව ද කියලා."

<u>**සවන්දීමේ කණ්ඩායමේ සිතාබැලීම්**</u>

ඵලදායී නොවන හා අසම්පූර්ණ සන්නිවේදන ක්‍රම සම්බන්ධයෙන් සවන්දීමේ කණ්ඩායමේ පුද්ගලයන් අතර සාකච්ඡා සිදු විය. මෙහිදී මුහුණ පානු ලබන අභියෝගය වන්නේ අරමුණ හා අපේක්ෂිත ප්‍රතිඵල ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමයි. මෙම කාර්යයේ දී ප්‍රජාව තුළ ඇති අනවබෝධය හා සැකය දුරු කරමින් ඔවුන්ගේ සහභාගීත්වය ලබා ගන්නා අයුරින් සිදු කිරීම තවත් දුෂ්කර වේ. මේවා නිරන්තරයෙන් සිදුවන කෙටි ගමන්වාරවල දී ඉටු කර ගත යුතු බහු විධ සන්නිවේදන අභිමතාර්ථ වේ. අදහස් ඵලදායීව හා කාර්යක්ෂම ලෙස සන්නිවේදනය කිරීම එක් ගමන් වාරයකින් රැස්වීමකින් හෝ නිවේදනයකින් සිදු කළ නොහැක. කිසියම් සංවිධානයක් විසින් යම් ගමක සියලු ම දෙනා එක්රැස් කළ ද ඔවුන් එසේ කරන්නේ කුමන අරමුණකින් ද යන්න පැහැදිලි නැත්නම් සියලු දෙනාම එතැන සිටියත් ඵලක් නොවේ. එක් කණ්ඩායම් සාමාජිකයෙකු සිය සංවිධානය පිළිබඳ සඳහන් කරමින් මෙසේ පැවසීය. "අපේ වැඩ සටහන් වැඩි දියුණු වී ඇත්තේ මනා සන්නිවේදනය නිසයි. එමෙන්ම දේශීය ප්‍රජාව මේ සංවාදයන්හි කොටස්කරුවන් වන නිසයි. අඛණ්ඩව බොහෝ පුද්ගලයින් සම්බන්ධ කරගැනීම මගින් ගැටලු නිරාකරණය පහසුවන අතර ආතතිය අඩුවෙනවා."

**ආ) ක්‍රියාවලියට ආධාර ලබන්නන් සම්බන්ධ කර ගැනීම.**

සැලසුම් සකස් කිරීමේ හා ව්‍යාපෘති ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියේ දී ප්‍රජාව සම්බන්ධ කර ගැනීමට විවිධ සංවිධාන විසින් කටයුතු කළ යුතු බව අවධාරණය කරන සංවාදයන් මතු වී ඇත. මෙම සංවාදයන්හි දී ජනතාව විසින් පවසන්නට යෙදුණේ කිසියම් ප්‍රජාවක් තුළ සිදුවන සංවර්ධන කටයුත්තක දී එම ප්‍රජාවට අයත් පාර්ශ්ව සහාය කර ගැනීම තුළින් ඔවුන්ට අවශ්‍යවන්නේ කුමක්ද යන්න සම්න්ධයෙන් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන දරන උපකල්පන අභියෝගයට ලක් කළ හැකි බවයි. සමහර පුද්ගලයන් පෙන්වා දුන් ආකාරයට අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සිය කටයුතුවලදී සාර්ථක වීමට නම් අදාළ සංදර්භයක් තුළ ප්‍රජාවන් ප්‍රාදේශීය පාලනයන් හා සංවර්ධන ආයතන යන සියලු ම පාර්ශවකරුවන්හි අවශ්‍යතා හා කාර්යභාරයන් හඳුනා ගැනීම වැදගත් ය.

"සහභාගීත්ව සැලසුම්කරණය හුදෙක් වචනයට පමණක් සීමා වූ කරුණක්. ආධාර සපයන පාර්ශ්වය පිළිබඳ සලකා බලද්දී කාලය හා මුදල් දෙකම සීමිතයි. එමෙන්ම සැලසුම් සකස් කිරීම

සිදුවී ඇත්තේ මෙම සංවිධාන ප්‍රජාවන් වෙත යැමට බොහෝ කාලයකට පෙර. සැලසුම් සකස් කිරීම ඇගයීම් සිදු කිරීම හා ප්‍රජාවන්ගෙන් අවශ්‍ය සහයෝගය ලබා ගැනීම ආදී කටයුතුවලට යටත් පිරිසෙයින් මාස හයක පමණ කාලයක් වත් අවශ්‍යයි."

-අනුරාධපුරයේ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරියෙක්

"රාජ්‍ය නොවන සංවිධාන ස්වභාවයෙන්ම නිලධාරීවාදීයි. ඉහළ මට්ටම්වල ඉන්න නායකයෝ සැලසුම් සකස් කරන්නේ ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් විමසලා නෙමෙයි. සුනාමියට පෙර අවධියේ දී රාජ්‍ය නොවන සංවිධාන ප්‍රජාවන් තුළ බොහොම ක්‍රියාකාරී වෙලා හිටියා. සමහර අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන ප්‍රාදේශීය ජනතාවට ජංගම සේවාවන් පවා සැපයුවා. ඒත් සමහර උපදේශකයින්ට හා විදේශීය කාර්ය මණ්ඩලවලට ප්‍රාදේශීය වශයෙන් ඇති ධාරිතාව ගැන කිසිම අවබෝධයක් තිබුණේ නෑ. ඔවුන් ප්‍රාදේශීය පුද්ගලයන් සැලකුවේ සේවකයන් විදියට. භාෂාව හා සංස්කෘතිය නිසා විශාල හිඩැසක් ඇති වෙලා තිබුණා. සුදු හමේ මානසිකත්වය නිසා ගොඩක් වෙලාවට රාජ්‍ය නොවන සංවිධාන එකිනෙකා හමුවෙලා සාකච්ඡා කළේ පීඩාවට පත් පුද්ගලයන්ගෙන් ගොඩක් දුරස් තරු පහේ හෝටල්වල. එහෙම නොකර ඒ අය ප්‍රජාවත් එක්ක ම ජීවත් උණා නං ප්‍රජාවගේ අවශ්‍යතා මොනවද කියන එක ගැන ඒගොල්ලන්ට වඩාත් හොඳ අවබෝධයක් ලබා ගන්න තිබුණා."

-කලින් එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධව සිටි දෙමළ සිවිල් සංවිධාන නායකයෙක්

"ප්‍රතිලාභ ලබන්නන්ගේ උපකාර නැතුව අපිට කිසිම දෙයක් කරන්න බෑ. හැමදෙනාම සම්පූර්ණ වශයෙන් සහභාගි වීම වැදගත්."

-පුත්තලමේ ප්‍රාදේශීය සංවිධානයක නියෝජිතයෙක්

"කොළඹ කේන්ද්‍ර කරගෙන ස්ථාපනය කර ඇති ජාතික රාජ්‍ය නොවන සංවිධාන, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන, ආධාර සපයන්නන් ගේ හිත් දිනා ගන්න කියනවා ඒ ගොල්ලන්ට මුළු ලංකාව පුරාම පැතිරුණු ශාඛා ජාලයක් තියෙනවා කියලා. ඒත් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන වගේම කොළඹ කේන්ද්‍ර කරගෙන පවතින ජාතික රාජ්‍ය නොවන සංවිධානත් අපේ අවශ්‍යතා, ප්‍රමුඛතා ගැන දැන ගන්න අපි වෙතට එන්නේ කලාතුරකින්. සමහර වෙලාවට රෑ මැදියමේ ඇවිල්ලා බස් පුරවගෙන අපිව කොළඹට අරගෙන එන්නේ ඒ ගොල්ලන්ගේ දීප ව්‍යාප්ත ශාඛා ජාලයේ සාමාජිකයන්ව රැළියක ප්‍රදර්ශනේට තියන්න. ඒත් ඒ ගොල්ලො කවදාවත් අපේ හඬට කන්දෙන බවක් නම් පේන්නේ නෑ. ජාතික රාජ්‍ය නොවන සංවිධානවලට අධාර උපකාර කරන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන වගේම ආධාර සපයන පාර්ශ්වත් මේවා දැන ගන්න ඕනේ. දීප ව්‍යාප්තව ඉන්න පහළම මට්ටමේ සාමාජිකයන්ගේ සැබෑ හඬ ඇහෙන්නේ නෑ. කරුණාකරලා අපිට කියන්න තියෙන දේවල් වලටත් කන් දෙන්න. අපි ගැන යාතාර්ථය අඳුනගන්න. අපේ සංවර්ධන ප්‍රමුඛතා මොනවද කියලා අවබෝධ කර ගන්න."

-ඌව පළාතේ වතු ප්‍රජාවන් සමග කටයුතු කරන ප්‍රජා මූල සංවිධාන නායකයෙක්

"මේ මුළු කාලය පුරාවට ම සංවිධාන ආවේ ඔලු ගෙඩි ගාණ ගනන් කරන්න විතරයි. ඇවිල්ලා අපේ ප්‍රශ්නවලට කන් දීපු එකම සංවිධානය ඔයගොල්ලො විතරයි."

-සවන්දීමේ කණ්ඩායම සම්බන්ධයෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ අවතැන් වූවන්ගේ කඳවුරක වෙසෙන වැඩිහිටියෙක්.

“අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක නියෝජිතයෝ ඇවිල්ලා අපිත් එක්ක මේ විදියට කතා කරපු පළවෙනි වතාව තමයි මේ.”

-සවන්දීමේ කණ්ඩායම සම්බන්ධයෙන් උඅව පළාතේ කාන්තාවක්

ආධාර වැරදි පුද්ගලයන් අතට ගිය බවට බොහෝ දෙනා චෝදනා කළහ. අනෙක් අතට මිනිසුන් අතර ඇති වූ කුළල් කා ගැනීම් නිසා සම්පත් අපතේ යෑම සිදු විය. මේ තත්වයට විසඳුමක් සේ කුමන පියවර වෙනස් කිරීම උචිත වේද යන ගැටලුවට හැම විටම පාහේ විසඳුම වූයේ ග්‍රාමීය උපදේශකයන් තුළය. ඔවුන්ගේ කටයුතුවල විනිවිද භාවය ගැන ගැටලු විය. ඉංග්‍රීසි භාෂාව හැසිරවිය හැකි අය, සංචාරක මගපෙන්වන්නන් මෙන්ම පිටස්තර පුද්ගලයින්ට සම්බන්ධ තනි පුද්ගලයින් තොරතුරු සපයන්නන් ලෙස කටයුතු කළේ ගම් මට්ටමෙන් නිසි උපදේශකයන් ලබා ගැනීමේ ක්‍රියාවලිය මීට වඩා කල් ගත වන නිසාවෙනි.

“අපිට ඕනෙ මොනවද කියලවත් අපෙන් ඇහුවෙ නෑ. අපිට එක එක දේවල් දුන්නා.”

-සුනාමියෙන් පීඩාවට පත් ගාල්ලේ ධීවරයෙක්

“ඉංග්‍රීසි කතා කරන්න පුළුවන් අයට තමයි ඔක්කොම ආධාරයි අවධානයයි ලැබිලා තිබුණේ. සංවිධාන ගොඩක් වෙලාවට සම්බන්ධ කර ගත්තේ පෝසත් මිනිස්සුන් ව. ඒ ගොල්ලො තමයි කාටද ආධාර දෙන්නේ කියලා තීරණය කළේ. දුප්පත්ම මිනිස්සු ගැන ඒ ගොල්ලො බැලුවේ නෑ. දුප්පතුන්ගේ අවශ්‍යතා නොසලකා හැරලා තිබුණා.”

-ගාල්ලේ ත්‍රි රෝද රථ රියදුරෙක්

අනුරාධපුර ප්‍රදේශයේ බෞද්ධ භික්ෂුවක් විසින් දක්වන ලද අන්දමට ප්‍රජාව හා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධ කරන පාලමක් සේ පන්සල පවතියි. එනම් සහන සේවකයින් විසින් ඉදිරිපත් කෙරෙන අදහස් පන්සල මගින් ප්‍රජාව වෙත ඉදිරිපත් කරනු ලබයි. “ ගැටලු ඇති වෙන්නේ සංවිධාන මගින් ප්‍රජාවෙන් කෙනෙක් වැටුපට වැඩ කරන්න බඳවා ගත්තම තමයි. කමන් කරන කටයුත්තේ අරමුණ මොකක්ද කියන එක ගැනවත් සමහර වෙලාවට මේ වගේ පුද්ගලයන්ට අවබෝධයක් නෑ.”

“ප්‍රජා සහභාගීත්වය හරිම වැදගත්. සමහර වැඩ කටයුතුවල ගුණාත්මක භාවය පිළිබඳ සොයා බලන්න සුදුසු ම පුද්ගලයො තමයි ප්‍රජාව. ව්‍යාපෘතියක මුල ඉඳලා අගටම ඒ සම්බන්ධ හැම දෙයක් ම ප්‍රජාව දන්නවා නං ඒ මගින් වඩාත් ඵලදායී තොරතුරු ලබා දෙන්න මෙන් ම අනාගතයේ වඩාත් සාර්ථකව කටයුතු කරගෙන යන්න පුළුවන්.”

-අනුරාධපුරයේ ගැමියෙක්

“සැලසුම් හා ක්‍රමෝපායන් සමග තමන් වෙතට එන පුද්ගලයන්ට අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලින් ප්‍රමුඛත්වයක් ලබා දෙන්න ඕනේ. සමහර වෙලාවට මට බඩගිනියි කන්න දෙයක් දෙන්න කියාගෙන යන කෙනෙකුට ආධාර ලැබෙනවා ඒත් තමන් ඉන්න තත්වෙ ගැන ක්‍රමාණුකූල වාර්තාවක් අරගෙන යන කෙනෙක් කිසි දෙයක් නොදී එලියට තල්ලු කරලා දානවා.”

-අනුරාධපුරයේ ගැමි කාන්තාවක්

**සවන්දීමේ කණ්ඩායමේ සිතාබැලීම්**

ප්‍රජාවන් තුළින් ලබා ගත් අදහස්වලට අනුව සවන්දීමේ කණ්ඩායමට පෙනී ගියේ ආධාර සපයන්නන් හා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ආධාර සපයන ආයතනවලට ඔවුන් උපකාර කිරීමට බලාපොරොත්තුවන ප්‍රජාවන් සමග යතාර්ථවාදී සංවාදයක් පවත්වා ගත නොහැකි වී ඇති බවයි. අන්තර්ජාතික සංවිධාන මෙම ගැටලුව පිළිබඳව එතරම් අවධානයක් යොමු කර නොමැති බව කණ්ඩායමේ සාමාජිකයන්ගේ අදහස විය. එක් සාමාජිකයෙක් පැවසූ අන්දමට "අපිට අපේම භාෂා විලාසයක් තියෙනවා. ඒත් ඒක හැම තිස්සේ ම අපි වැඩ කරන ප්‍රජාවට ගැළපෙන්නේ නැති වෙන්න පුළුවන්. අපි ඇතුළත් වෙනවා කියලා කිව්වට ඒකෙ නියම තේරුම මොකක්ද කියලා හිතලා බලලා තියෙනවද කියන එක ප්‍රශ්නයක්. ඇතුළත් වීම කියන දේ තහවුරු කරන්න අපි සූදානම් ද? අපි කියනවා අපි විසින් හැම දෙනෙක්ම සහභාගී කර ගන්නවා කියලා. ඇත්තට ම පටන් ගන්නකොට නම් ඒක එහෙම කමයි. ඒත් ව්‍යාපෘතියක් ස්ථාපනය කරනකොට මේ ප්‍රවේශය නැත්තටම නැති වෙනවා. අපි ඒකට කියන්නේ මොකක්ද කියන එක නෙමෙයි වැදගත්. මේ ක්‍රියාවලිය ප්‍රජාව විසින් සහභාගීත්වයක් නැති එකක් විදියට දකීමයි.

ප්‍රජා රැස්වීම් සංවිධානය කිරීමේ දී බොහෝ අවස්ථාවල ප්‍රජාව තුළ වෙසෙන සාමාජිකයන්ට සහභාගී වීමට අසීරු වේලාවන්වල ඒවා සංවිධානය කිරීම පිළිබඳවත් මෙහිදී සංවාදයට භාජනය විය. රැස්වීම් සමීක්ෂණ හා ක්ෂේත්‍ර සංචාරවලදී සංවිධාන කාර්ය මණ්ඩලයට ප්‍රජාව හමු නොවීම ද අවධානයට ලක් විය. සහභාගීත්වය තහවුරු කරන ආකාරයට කටයුතු කළත් මිනිසුන්ගේ සම්ප්‍රදායන් චාරිත්‍ර වාරිත්‍ර හා සහන සේවා ආයතන සමග කලින් ඇති වූ අත්දැකීම් ආදිය පිළබඳ සැලකිලිමත් නොවෙමින් මෙම හමුවීම් සංවිධානය කර තිබීම පිළිබඳව කණ්ඩයම අවධාරණය කළේය.

එමෙන්ම සහන සේවා ආයතන හැම විටම ප්‍රතිඵල කෙරෙහි වැඩි අවධානයක් දක්වීම නිසා සෑම දෙයක් ම වඩාත් පැහැදිලිව දක්වීම උදෙසා ප්‍රමාණාත්මකව දැක්වීම පිළිබඳව ද කණ්ඩායම තුළ සංවාදයට බඳුන් විය. බොහෝ කාර්යයන් ව්‍යාපෘති අරමුණු කරගෙන සිදුවන අතර සංවිධාන මගින් සපයන වාර්තාවල ප්‍රජාවන් තුළ සිටින මිනිසුන් සමග සාකච්ඡාවලට යොදා ගත් කාලය හා ඒ වෙනුවෙන් වැය කළ ශ්‍රමය පිළිබඳව සඳහන් නොවේ. පුද්ගල සංවර්ධනයට සහයෝගය සපයමින් ප්‍රජාවන් ශක්තිමත් කිරීම යන අරමුණ සාක්ෂාත් කර ගැනීමට නම් මෙය වෙනස් කළ යුතු බව කණ්ඩායමේ හැඟීමයි.

**ඇ) ධාරිතා සංවර්ධනය හා එකාවන්ව කටයුතු කිරීම**

අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා ආධාර සපයන්නන් සමග එක්වී ව්‍යාපෘති දියත් කරන දේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග කළ සාකච්ඡාවල දී කැපී පෙණුනේ ඔවුන් ඉහළ මට්ටම සමඟ කටයුතු කිරීමට දක්වූ කැමැත්තයි. බොහෝ දේශීය ආයතන පැවසුවේ ආධාර සපයන්නන් සමඟ ඔවුන්ගේ ඇති වර්තමාන සම්බන්ධතාව ව්‍යාපෘති යෝජනාවලියක් ඉදිරිපත් කිරීම ඒ වෙනුවෙන් චෙක් පතක් ලබා ගැනීම හා වරින් වර වාර්තා ඉදිරපත් කිරීම දක්වා සීමා වී ඇති බවයි. ඌව පළාතේ දේශීය ප්‍රජා මූල සංවිධාන නායකයෙක් පැවසූ පරිදි "අපිට අළුත් ව්‍යාපෘතියක් ආරම්භ කරන්න ඕනේ උණාම ඒ වෙනුවෙන් ලියන යෝජනාවලිය හොඳට ලියන්න පුළුවන්. අපේ අදහස් නිර්මාණාත්මකව එළිදක්වලා මූල්‍යාධාර සපයා ගන්න පුළුවන්. ඒත් මේ යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී අපි කරන්න ඕනේ මොනවද කියන එක ගැන අපිට පැහැදිලි අවබෝධයක් නෑ. ඒ වගේම අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලින් සිදු කරන

නිරීක්ෂණ ක්‍රියාවලියත් දුර්වලයි. අපිට ආධාර සපයන්නන් සමග සහයෝගය ගොඩනගාගන්න උපදෙස් ලබා ගන්න වගේම එකට වැඩ කරන්නත් අවශ්‍යයි. ඒගොල්ලො නිකංම ආධාර සපයන්නො වෙනවට අපි කැමති නෑ. අපිට ඕනෙ අපිත් එක්ක එකට වැඩ කරන්න පුළුවන් ආධාර සපයන්නො. අපිට අදහස් හුවමාරු කර ගැනීම වගේම හොඳ ක්‍රියාමාර්ග ගැන අත්දැකීම් බෙදා හදා ගන්නත් අවශ්‍යයි."

බදුල්ලේ දේශීය කණ්ඩායමකට නායකත්වය සපයන කාන්තාවක් ඔවුන්ගේ ආධාර සපයනන්නන් පිළිබඳව මෙසේ කීවාය. "අපිට අවශ්‍ය ධාරිතාව හා දැනුම තියෙනවා. ඒත් අපේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සම්පත් අපිට නෑ. අපේ වගේ කුඩා ප්‍රමාණයේ සංවිධානවලට බාහිර ආධාර සපයන්නන් සමඟ කටයුතු කරනකොට අපේ අනන්‍යතාව හා දක්ම නැති කරගන්න බැහැ. අපි අපේ අවශ්‍යතා ප්‍රමුඛ කර සලකමින් අපි විසින් ම හඳුනාගෙන සංවර්ධනය කර ඇති විශේෂ වැඩසටහන්වලට මූල්‍යාධාර ඉල්ලනවා. අපට ආධාර සපයන ආයතන අපේ ධාරිතා වර්ධනයට සහයෝගය දෙන්නේ අපි විසින් ම අපේ වැඩසටහන් බොහොමයක් කරගෙන යා යුතු බවට වෙන අදහසත් එක්ක."

"දේශිය රාජ්‍ය නොවන සංවිධාන දේශීය අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කරනවා. ඒත් ඒකෙ බලපෑම වැඩි දුරකට යන්නේ නෑ. සැලසුම් ක්‍රියාත්මක කරන පාර්ශ්ව වශයෙන් සැලකුවාම ඒගොල්ලො සංවර්ධන රාමුවක ඉන්නවා කියලා කියන්න පුළුවන්. ඒත් මේ රටේ සංවර්ධන න්‍යාය පත්‍රය සකස් කිරීමෙ දී ඔවුන්ගෙන් ඒ තරම් දායකත්වයක් ලැබෙන්නේ නෑ. වර්තමාන සංදර්භය ගැන සලකා බලද්දී ගොඩක් තීරණ ගැනීම් සිද්ද වෙන්නේ කොළඹ නගරයෙ. මේ තත්වය යටතේ දේශීය රාජ්‍ය නොවන සංවිධානවලට කරන්න තියෙන කාර්යභාරය සීමිතයි."

-කොළඹ ජාතික සංවිධානයක පර්යේෂකයෙක්

මූලික තත්ව වාර්තාවෙන් ඔබ්බට යමින් ධාරිතා වර්ධනය හා දැනුම බෙදා හදා ගැනීමට කළ ඉල්ලීම් බොහොමයක් විය. ශ්‍රී ලාංකික රාජ්‍ය නොවන සංවිධානයක සේවකයින් සමග කළ සංවාදවල දී බොහෝ දෙනක් දේශීය කාර්ය මණ්ඩලයේ ධාරිතාව සැලකිල්ලට නොගැනීම ප්‍රමාණාත්මක ලෙස ප්‍රයෝජනයට නොගැනීම හා ප්‍රමාණාත්මකව සංවර්ධනය කර නොතිබීම සම්බන්ධ ගැටලුව ඉදිරිපත් කළහ.

**සවන්දීමේ කණ්ඩායමේ සිතාබැලීම**

යහපත් ආධාර සපයන්නෙක් වීම හා යහපත් හවුල්කරුවෙක් වීම එකිනෙකට බැඳී පවතියි. මේ සඳහා සහයෝගීතාව වෙනුවෙන් කැපවීමත් දෙපාර්ශ්වයටම ඵලදායීවන සහසම්බන්ධතාවක් ඇති කර ගැනීමත් වැදගත් වේ. ආධාර සපයන ආයතන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන දේශීය රාජ්‍ය නොවන සංවිධාන ප්‍රජා මූල සංවිධාන හා ප්‍රජාවන් අතර දැනුම බෙදා හදා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් තරම් සංවාදයන් ඇති වී නොමැති බවට කණ්ඩායම් සාමාජිකයන් ද ජනතාවගේ ඇගයීම සමග එකගවිය. මෙවන් සම්බන්ධතාවන් ගොඩනැගීමේ දී තවදුරටත් සවන් දීම සංවාද සිදු කිරීම එක් එක් කණ්ඩායමේ අපේක්ෂා හා අවස්ථාවන් විශ්ලේෂණය කිරිම වැදගත් වන අතර ඒ සඳහා කාලය වැය වේ.

කණ්ඩායම් සාමාජිකයන්ට පෙනී ගිය අන්දමට ආධාර සපයන ආයතන හා සමග අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයන් හි ඇති සබඳතාවට එක් එක් ආයතන අතර ඇති තරඟකාරී බව බෙහෙවින් බලපෑම් සිදු කරයි. එමෙන්ම ඔවුන් විශ්වාස කරන අන්දමට අන්තර්ජාතික රාජ්‍ය

නොවන සංවිධාන දේශීය රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජාවන් හේ සහය ඇතිව ගොඩනගා ඇති යෝජනාවලීන් වලට වැඩි දුරටත් සහයෝගය දැක්විය යුතුය. එක් සවන්දීමේ කණ්ඩායම් සාමාජිකයෙක් පැවසුවේ ප්‍රජාවන්ගේ ප්‍රමුඛතා ඔවුන්ගේ ආධාර සපයන ආයතනවලට සන්නිවේදනය කිරීමෙන් පසු ආධාර සපයන්නන්ගේ මූල්‍ය තීරණවලට බලපෑම් ඇති කළ හැකි වූ බවයි. ඔහු වැඩි දුරටත් පැවසූ ආකාරයට "මේ ප්‍රශ්නවලින් සමහර ඒවා අපේ ම ප්‍රශ්න. ඒවා ආධාර සපයන ආයතනවල ප්‍රශ්න නෙමෙයි. අපි ප්‍රජාවන් හා ආධාර සපයන ආයතන අතර මැදිහත්කරුවන් විදියට මීට වඩා ලොකු කාර්ය භාරයක් ඉටු කරන්න ඕනේ."

**ඇ) නිරීක්ෂණය**

ආධාර සපයන්නන්ගේ කාර්යභාරය හා වගකීම සම්බන්ධයෙන් පැන නැගුණු බරපතලම ගැටලුවක් වන්නේ නිරන්තරව සිදුවන නිරීක්ෂණ චාරිකාවල තත්වයයි. සුනාමියෙන් විපතට පත් බොහෝ ප්‍රදේශවල ජනතාව පැවසුවේ "ආධාර සපයන පුද්ගලයො ඇවිල්ලා දූන් ඔයගොල්ලො කරනවා වගේ කෙළින් ම අපිට කතා කළා නම් මේ දූෂණ ක්‍රියා වළක්වා ගන්න තිබුණා යනුවෙනි. මූල්‍යාධාර නිසි ලෙස කළමනාකරණය නොකිරීම පිළිබඳව ජනතාව තුළ වූයේ අප්‍රසාදයකි. එමෙන්ම මූල්‍යාධාර සැපයූ ආයතන සිය ආධාර බෙදා හරින ලද ආකාරය පිළිබඳ සොයා නොබැලීම් සම්බන්ධයෙන් ද ඔවුහු අසතුට පළ කළහ. ප්‍රජා මට්ටමින් සැලකූ කළ දූෂණයට එරෙහිව කටයුතු කිරීමට තමාට බලයක් නැති බව ජනතාව විශ්වාස කළ අතර ආධාර සපයන ආයතනවල මැදිහත් වීමෙන් ආධාර ව්‍යාපෘති සඳහා යොදා ගන්නා ආකාරය හා වැය කරන ආකාරය නිරීක්ෂණයට පියවර ගතයුතු බව ඔවුන්ගේ මතය විය.

අවශ්‍යතා හඳුනා ගැනීම සැලසුම් ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය හා ඇගයීමට ලක් කිරීම ආදී ව්‍යාපෘතියේ ග්‍රාමීය මට්ටමින් කටයුතු කරන සියලු ම අවස්ථාවල දී ආධාර සපයන ආයතන පැමිණ ඒ සම්බන්ධයෙන් සොයා බැලිය යුතු බව සමහරු අවධාරණය කළහ. ගාල්ල ප්‍රදේශයේ එක් පුද්ගලයෙක් පැවසුවේ මෙසේ කටයුතු කිරීම මගින් ආධාර සපයන ආයතනවලට සිය පෙර වැරදිවලින් පාඩම් ඉගෙන ගැනීමට මග සැලසෙන බවයි. ඒ තුළින් අනාගත ආධාර වඩාත් ඵලදායීව හා වගකීම් සහිතව වැය කිරීමට හැකි වනු ඇත. අප සමග කතා බහ කළ පුද්ගලයන් සුදුස්සන්ට සුදුසු ආධාර ලබා දීමත් මුදල් නාස්ති නොකිරීමත් වැදගත් බව අවධාරණය කළහ. මෙම කරුණු තුන ම තහවුරු කර ගැනීම ආධාර සපයන ආයතනවල වගකීම බව ඔවුහු විශ්වාස කළහ.

"විදේශ ආධාර ගොඩක් වෙලාවට පදනම් කරගන්නේ වාර්තා. ඒ වාර්තා හොඳට සකස් කරලා තියෙනවා නම් යතාර්ථය ගැන එච්චර සැලකිලිමත් වෙන්නේ නෑ. නිරීක්ෂණය කරනකොට කිසි විටෙක මැදිහත්කරුවා ළඟට යන්න එපා. ගැටලුවට සෘජුවම මුහුණ පාලා ඉන්න කෙනා වෙත යන්න."

-සුනාමියෙන් විපතට පත් ගාල්ලේ අන්ධ පුද්ගලයෙක්

"ආධාර සපයන්නො මුදල් දෙනකොට තමන්ට වඩා ඉහල ඉන්න අයට ඒ ගැන තොරතුරු ලබා දුන්නා. සුනාමියෙන් පස්සේ කිසි කෙනෙක් කිසිම දෙයක් ගැන තොරතුරු වාර්තා කරන්නේ නෑ. හැමෝටම ඕනේ උනේ ඒ වෙලාවෙ උදව් කරන්න විතරයි."

-ශ්‍රී ලංකාව තුළ සහනසේවා කටයුතු සම්බන්ධයෙන් අවුරුදු 15 අත්දැකීම් ඇති සහන සේවකයෙක්.

"නියමාකාර විදියට ආධාර සපයන්න නම් රාජ්‍ය නොවන සංවිධාන විසින් ආධාර අවශ්‍ය පුද්ගලයන් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලබා ගන්න ඕනේ. ඒ වගේම ආධාර ඇත්තටම ඒවා අවශ්‍ය පුද්ගලයින් වෙත ගියාද යන්න නිරීක්ෂණය කිරීමත් වැදගත්. උදාහරණයක් විදියට සුනාමියෙන් පස්සේ හැමෝටම බෝට්ටු මාළු දැල් ආදිය ලැබුණා. ජීවිතේටම මුහුදු ගිහිල්ලා නැති අයටත් මේවා ලැබුණා. ඉලෙක්ට්‍රික්වැඩ කරන අයට මේසන් බාස්ලටත් බෝට්ටු ලැබුණා. මේ විදියට ආධාර වැරදි පුද්ගලයන්ට දීලා තිබුණා. සුනාමිය නිසා ඇත්තටම විපතට පත් උණ අයට තාම කිසි දෙයක් දීලා නෑ."

-පුත්තලමේ ඇන්ග්ලිකන් පූජකවරයෙක්

"මම දන්න හැටියට නම් අන්තර්ජාතික සංවිධානවලින් 95% ක්ම ශ්‍රී ලංකාවේ හොඳ කාර්යභාරයක් ඉටු කරනවා. ඒ ගොල්ලො අවශ්‍ය ආධාරත් ගෙනල්ලා තියෙනවා. 5% ක ප්‍රමාණයක් දුර්වල ලෙස කටයුතු කරන්නේ ඒ ගොල්ලො සම්බන්ධ කරගෙන තියෙන පුද්ගලයන්ගේ අවිශ්වසනීයත්වය නිසා. සමහර වෙලාවට රුපියල් 200000 වැය වෙනවා කියලා ගණන් බලපු කටයුත්තක් රුපියල් 10000 සිදු කරන්නේ විවිධ කෙටි මාර්ග හා නිසි කළමනාකරණයකින් තොරවයි. කම්කරුවන්ව හරියට පාලනය කෙරෙන්නේ නෑ. ගිණුම් හරි ආකාරෙට පරීක්ෂා කිරීමක් සිද්ද වෙන්නේ නෑ. ඒ නිසාම ව්‍යාපෘති නිමා කෙරෙන්නෙ කිසි කමකට නැතුව."

-බදුල්ලේ ප්‍රජා මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක නියැලී සිටින ගොවියෙක්

"අරමුදල් හරියට පරිහරණය කෙරෙන්නේ නැත්නම් ඒ සම්බන්ධයෙන් රජය මැදිහත් විය යුතු බවට බල කරන්න බාහිර පුද්ගලයො හැටියට ඔයගොල්ලන්ට පුළුවන්. නිරීක්ෂණය කිරීමේ වගකීම කෙළින් ම පැවරෙන්නේ ආධාර සපයන ආයතනවලට. ඔයගොල්ලන්ට දීලා තියෙන දත්ත එහෙම නැත්නම් මැදිහත් කරුවො විශ්වාස කරන්න එපා. බොහෝ අවස්ථාවලදී බාහිර පුද්ගලයෝ විශ්වාස කරන්නේ එක් පුද්ගලයෙක් විතරයි. ඒ ගොල්ලො කීප දෙනෙක් ගෙ අදහස් විමසන්නේ නෑ."

-ගාල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්

සමහර පුද්ගලයින් තුළ අර්බුදකාරී අවස්ථාවල අන්තර්ජාතික සහන සේවා ආයතන වෙත පනවා ඇති සීමාවන් හා මේවා නිරන්තර නිරීක්ෂණයන් කෙරෙහි බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව අවබෝධයක් පවතියි.

"තමන් බෙදා දෙන දේවල් නියමාකාර පුද්ගලයන් අතට යනවද කියලා හොයලා බලන්න රාජ්‍ය නොවන සංවිධානවලට මෙන්ම ආධාර සපයන ආයතනවලට නිරීක්ෂණ පද්ධතියක් තියෙන්න ඕනේ. සමහර වෙලාවට සමහර රාජ්‍ය නොවන සංවිධානවලට විපතට පත් පුද්ගලයින් වෙත යන්න අවසර දීලා නෑ. සමහර විට රජය ඒ ගොල්ලන්ව වලක්වලා ඇති."

-මඩකලපුවේ මුස්ලිම් ප්‍රජා නායකයෙක්

"රාජ්‍ය නොවන සංවිධාන තමන්ගේ කටයුතු නිරීක්ෂණය කරන්න නිරීක්ෂණ පද්ධතියක් ඇති කරනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. අනවශ්‍ය පරිපාලන වියදම් කපා හරින්න රජ්‍ය නොවන සංවිධාන කටයුතු කරන්න ඕනේ. ඒ වගේ ම තමන් බෙදා දෙන ආධාර ගැන වාර්තා තියා ගන්නත් සැලකිලිමත් වෙන්න ඕනේ. මොකද කියනවා නම් සමහර වෙලාවට මුදා නොගත් ප්‍රදේශවලට ආධාර ගෙන ගියාම අවි ආයුධ ගත්ත කණ්ඩායම් බලෙන් ම ආධාර පැහැර ගන්න නිසා."

-මඩකලපුවේ ශ්‍රී ලාංකික මානව හිමිකම් සංවිධානයක සේවකයෙක්

**සවන්දීමේ කණ්ඩායමේ සිතාබැලීම්**

ව්‍යාපෘතියේ සෑම අදියරක දී ම ආධාර සපයන ආයතන සිටිය යුතු බවට වන ඉල්ලීම සලකා බැලිය යුතු වැදගත් කාරණයකි. ප්‍රතිලාභ ලබන්නන් විශ්වාස කරන අන්දමට නිරීක්ෂණයන් හා අදාළ ස්ථානවලට පැමිණීම තුළින් දූෂණය හා වෙනත් ගැටලු අවම කර ගත හැකිය. බොහෝ ව්‍යාපෘතිවලට නිරීක්ෂණය අංගයක් සේ එක් කර තිබුණ ද ප්‍රජාවන් විසින් යෝජනා කරන ලද අන්දමට ක්‍රමානුකූලව හෝ අවබෝධයෙන් යුතුව එය සිදු නොවේ. සිදුවන දූෂණ හා නිරීක්ෂණයන් සිදු නොවීම සම්බන්ධයෙන් ප්‍රජාවන් මීට වඩා ක්‍රියාකාරී ලෙස කටයුතු නොකරන්නේ ඇයිද යන කාරණාත් කණ්ඩායමේ අවධානයට ලක් විය. අනාගතයේ ලැබිය හැකි ආධාර අහිමිව යෑම පිළිබඳ බිය මෙයට හේතු වී ඇත.මේ නිසාම බරපතල ලෙස සිදුවන අක්‍රමිකතා නිරීක්ෂණ චාරිකාවල දී සැඟවීම සිදු වේ. එහෙත් තමා උපකාර කිරීමට අදහස් කරන ප්‍රජාව සමග වඩාත් සමීපව කටයුතු කිරීමෙන් මෙ අක්‍රමිකතා අනාවරණය කර ගත හැකි වනු ඇත. එහෙත් මෙහි දී පවතින අභියෝගය වන්නේ නිරීක්ෂණ චාරිකා නිසා පරිපාලන වියදම් ඉහළ යෑමයි.

**ඉ) ජාතික හා ප්‍රාදේශීය පාලනය සමග කටයුතු කිරීම**

ආධාර සපයන ආයතන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා ජාතික හා ප්‍රාදේශීය පාලනයන් එක්ව කටයුතු කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව බොහෝ විට සංවාදයට භාජනය විය. අනුරාධපුරයේ මෙන්ම වෙනත් විවිධ ප්‍රදේශවල ද රජය හා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම ආධාර සපයන ආයතන සමග සම්බන්ධිකාරකයෙක් සංවර්ධන කටයුතුවලදී නායකයෙක්, ප්‍රධානියෙක්, උපදේශකයෙක්, අරමුදල් බෙදා හරින්නෙක්, නිරීක්ෂක නියෝජිතයෙක් හා ප්‍රජා ජංගම සේවකයෙක් ආදී විවිධ කාර්යභාර්යයන් ඉටු කළ යුතු වේ.

මෙම වාර්තාවේ ආරම්භයේ දී සඳහන් අදහස්වලට අනුව බොහෝ දෙනෙක් ගේ හැඟීම වූයේ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන රජයට වඩා කාර්යක්ෂම බවයි. මේ අනුව ආධාර වැඩ සටහන් වලදී ඔවුන් පෙරමුණ ගත යුතු බව බොහෝ දෙනාගේ අදහස විය. මේ අතර ප්‍රාදේශීය පාලනයන්හි පුද්ගලයන් හා ප්‍රජාවන් පැවසුවේ සැලසුම් කළ හා දැනට සිදු කෙරමින් පවත්නා සංවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් රජයට මනා අවබෝධයක් තිබිය යුතු බවයි. මේ අනුව අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන මෙම කටයුතු වලින් ඉවත් වීමෙන් පසු ඒවා බාධාවකින් තොරව දිගටම පවත්වාගෙන යෑමටත් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලට තමා කටයුතු කරන සන්දර්භය පිළිබඳ මනා අවබෝධයක් ලබා දීම තහවුරු කිරීමට ද හැකි වේ.

සංවර්ධන සැලසුම් හා වැඩසටහන් ආරම්භ කිරීමට පෙර දත්ත ඒකරාශී කිරීමට හා අවශ්‍යතා ඇගයීම් සිදු කිරිමේ කටයුතුවල දී ඒවා නිසියාකාරව සිදු කෙරෙන බව තහවුරු කිරීමට අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන රජය සමග වඩාත් සමීපව ක්‍රියා කළ යුතු බව බොහෝ රාජ්‍ය නිලධාරීන්ගේ හා ප්‍රතිලාභ ලබන්නන්ගේ අදහස විය. මෙය ශ්‍රී ලංකාව තුළ කටයුතු කරන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලට මෙය නිර්දේශයක් සේ ඉදිරිපත් විය. ප්‍රාදේශීය පාලනයේ ධාරිතාව වර්ධනය කිරීම හා ජාතික හා ප්‍රාදේශිය පාලනයන් සමග එක්ව කටයුතු කිරීම තුළින් අනාගතයේ ඇති විය හැකි විපත් සඳහා වඩාත් හොඳ සූදානමක් පවත්වා ගැනීම විදේශීය ආධාර සපයන ආයතන මුහුණපාන විශාලතම අභියෝගයක් සේ පවතියි.

"ඔබ ප්‍රාදේශීය පාලනය සමග කටයුතු කරනවා නම් ඵ තුළින් ධාරිතා වර්ධනයක් හා තිරසාරත්වය තහවුරු වීම සිදු වෙනවා. අපි මීට කලින් කරපු වැරදිවලින් පාඩම් ඉගෙන ගෙන තියෙනවා. අතීතයේ අපි වැඩි වශයෙන් ම අවධානය යොමු කළේ ප්‍රජා මූලික එහෙම නැත්නම් ග්‍රාමීය සංවිධාන ගැන. අපි මූල්‍යාධාර ලබා ගන්න යෝජනාවලි ලියන විදිය ගැන ග්‍රාමීය කමිටු දැනුවත් කළා. අපි ඒ කටයුත්තෙන් අයින් උණාට පස්සේ මේ කමිටු නිකං ම දිය වෙලා ගියා. ඒකට හේතු උනේ මේ ගොල්ලන්ට ප්‍රාදේශීය පාලනයත් එක්ක නිසියාකාර සම්බන්ධයක් තිබුණේ නැති එක."

-බදුල්ලේ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයක සේවය කරන දේශීය සේවකයෙක්

"අපේ ප්‍රදේශයේ හැම අවශ්‍ය තාවක්ම සම්පූර්ණ කරන්න එක සංවිධානයකට බෑ. ප්‍රදේශීය රාජ්‍ය නොවන සංවිධාන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන වගේ ම රජය ලබා දෙන ආධාරත් අපි අගය කරනවා. මට හිතෙන විදියට මේ හැමෝම එකට කටයුතු කරන කොට ඒක වඩාත් ඵලදායී දෙයක්."

-බදුල්ලේ ගැමි කාන්තාවක්

ව්‍යාපෘතියක් රජයට පැවරුවාම ප්‍රශ්න ඇති වෙනවා. උදාහරණයක් හැටියට ජල සම්පාදන ව්‍යාපෘතියක් රජයට පැවරුවම මොනවද කරන්න ඕනෙ කියලා දැනගෙන හිටියේ නෑ. මොකද කියනවා නං සැලසුම ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල යෙදී හිටපු ආයතනය ඒ සම්බන්ධ සැපසුම්වලදි ඒකට රජය සම්බන්ධ කරගත්තේ නැති නිසා.

-අනුරාධපුරයේ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරියෙක්

බොහෝ රාජ්‍ය නිලධාරීහු දේශීය රාජ්‍ය නොවන සංවිධාන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සමග ඇති සබඳතාව වඩාත් ඉහළ මට්ටමකට නංවා ගනිමින් ඔවුන් සමග නිරන්තර සන්නිවේදනයක් පවත්වා ගත යුතු ය යන මතයට එකඟ වූහ. මේ සම්බන්ධයෙන් ගාල්ලේ රාජ්‍ය නිළධාරියෙක් මෙසේ පැවසීය. "අපි ගැන වැරදි අවබෝධයක් තියා ගන්න එපා. ඔබලාගේ සැකයන් ගැන කතා කරන්න. එතකොට හැමෝටම වඩා හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන්."

සමහර පුද්ගලයන් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් දැඩි අප්‍රසාදයක් පළ කළ අතර ඒවා වැඩි දුරටත් පාලනය කළ යුතු බව ඔවුන්ගේ හැඟීම විය. මඩකලපුවේ දෙමළ දේශපාලන නායකයෙක් "ශ්‍රී ලංකාව හරියට ගණිකාවක් වගේ. ඕනම කෙනෙකුට කැමති විදියට පාවිච්චි කරන්න පුළුවන්. රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් සීමා මායිම් මොකුත් නෑ. අපි රාජ්‍ය නොවන සංවිධාන නිරීක්ෂණය කරන්න ඕනේ." යැයි පැවසුවේය. අනුරාධපුරයේ ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක් පෙන්වා දුන් ආකාරයට රජය විසින් අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවල කටයුතු විමසිලිමත් ව නිරීක්ෂණය කළ යුතු ය. එමෙන් ම සීමා කළ යුතුය. මක් නිසාද යත් ඔවුන් බැඳී සිටින්නේ ආධාර සපයන්නා ගේ අපේක්ෂා සැපිරීමට මිස ඔවුන් කටයුතු කරන ප්‍රජාවේ හෝ රටේ අපේක්ෂා සපුරාලීමට නොවන බැවිනි.

7. ගැටුම් පවතින ප්‍රදේශවල රජය හා ආරක්ෂක හමුදා සමග සහන සේවාවල සම්බන්ධය

මඩකලපුවේ අනුරාධපුරයේ හා පුත්තලමේ ගැටුම්කාරී අවස්ථාවල දී සිවිල් වැසියන් ආරක්ෂා කර ගැනීමෙ හි ලා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉටු කරන කාර්යභාරය පිළිබඳව බොහෝ දෙනා අදහස් දැක්වූහ. මෙම සංවිධාන සමග විවිධ ප්‍රජාවන් සතුව එකිනෙකාගෙන් වෙනස් වූ අත්දැකීම් ඇත. උදාහරණයක් වශයෙන් පුත්තලම ප්‍රදේශයේ අන්තර්ජාතික සංවිධාන කිහිපයක් ම යාපනයෙන් මුස්ලිම් වැසියන් පිටමං කිරීමෙන් පසුව එකිනෙකා ගෙන් වෙන් වූ පවුලේ සාමාජිකයන් නැවත එක් කිරීමේ කාර්යයේ දී ඉතා වැදගත් සංවිධාන වශයෙන් හැඳින්විණි.

බොහෝ දෙනෙක් ආරක්ෂාව සම්බන්ධයෙන් අදහස් පළ කළහ. ආරක්ෂාව පොදු ජනතාව සම්බන්ධයෙන් මෙන් ම සහන සේවකයින් පාර්ශ්වයෙන් සැලකූ කළ ද වැදගත් වේ. නැගෙනහිර ප්‍රදේශයේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරු වල වෙසෙන බොහොමයක් දෙනා පැවසුවේ එම කඳවුරුවල ආරක්ෂාව පිළිබඳ හැඟීම ඉතා අවම මට්ටමක පවතින බවයි. මෙම අභ්‍යන්තර අවතැන් වූවන් විසින් කිසියම් සේවාවන් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලද අවස්ථාවල නාඳුනන පුද්ගලයින් විසින් ඔවුන්ට තර්ජන එල්ල කර ඇති බව වාර්තා විය. බොහෝ හිරිහැර කිරීම් වාර්තා වී ඇති අතර ජනතාවගේ අදහස වන්නේ මේ සිදුවීම් කඳවුරු නිලධාරීන් විසින් හෝ අන්තර්ජාතික ආරක්ෂාව සපයන කාර්ය මණ්ඩලය විසින් වාර්තා කර ගනු නොලබන බවයි.

කඳවුරුවල සිටින බොහෝ දෙනෙක් කිසියම් අන්තර්ජාතික සංවිධානයකට තමාට පැවරී ඇති කාර්යභාරය නිසියාකාරයෙන් සිදු කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් සිය නොසතුට පළ කර සිටියහ. ඔවුන්ගේ අදහස වූයේ එම ආයතනය ප්‍රාදේශීය ලේකම්ට පක්ෂපාතීත්වයක් දක්වමින් කඳවුරුවල වෙසෙන පිරිස වෙනුවෙන් පෙනී නොසිටින බවයි. කාර්ය මණ්ඩලය පැමිණ තොරතුරු එක්රැස් කරගෙන පිටව යති. අභ්‍යන්තර අවතැන් වූවන් මෙවැනි තොරතුරු ලබා දීමට පැකිලෙන්නේ එමගින් එම තොරතුරු ප්‍රාදේශීය ලේකම්වරයාට දැන ගැනීමට ලැබී ඔහු පැමිණ තර්ජනය කරනු ඇතැයි බියෙනි.

"රජයේ නිලධාරියා නිතරම වගේ එක එක අය එක්ක එනවා. එයා අපිට තර්ජනය කරනවා. එයා දෙතුන් සැරයක් ම ආයුධ අරගත්ත මිනිස්සුත් එක්ක ආවා. ඇවිල්ලා අපිට කිව්වා අපිට දෙන දේවල් අරගෙන කට වහගෙන හිටියේ නැත්නම් වෙඩි තියලා මරණවා කියලා. අපි අන්තර්ජාතික ආයතනය විශ්වාස කරන්නෙත් නෑ. මොකද ඒ ගොල්ලො වැඩ කරන්නෙත් ග්‍රාම සේවක කියන විදියට. ඒ ගොල්ලෝ අපිට කියන්නේ ග්‍රාම සේවක කියන විදියට වැඩ කරන්න කියලයි. මේක ඔප්පු කරන්න සාක්ෂිත් තියෙනවා. අපිට ලැබෙන වියලි සලාකය ගැන අපි ඇහුවොත් එහෙම අපිට ගහන්න කියලා ග්‍රාම සේවක කඳවුරේ කලමනාකරුට කියලා තියෙනවා. එයා අපිට ගහන්න කසයක් වගේ ඔතපු වයර් එකකුත් දුන්නා. ඉතිං අපිට කිසි දේකට කට අරින්න බෑ."

-යුද්ධය නිසා අවතැන් වූ මඩකලපුවේ කඳවුරක වෙසෙන දෙමළ කාන්තාවක්

දැන් බලන්න වාකරේ තියෙන තත්වෙ. අන්තර්ජාතික ආයතනයේ නිලධාරීන්ට එහෙට යන්න පුළුවන් වෙලා තිබුණ කාලෙ එහෙ තියෙන තත්වේ ගැන ඒ ගොල්ලන්ට හොඳ අවබෝධයක් තිබුණා. මේ සිද්ද වෙච්ච දේවල් වලට ඒ ගොල්ලොත් යම්තාක් දුරකට වග කියන්න ඕනේ. එහෙ මිනිස්සු හාමතේ මැරෙනවා. ඒත් ඒ ගොල්ලො කිසිම දෙයක් කළේ නෑ. ඒ ගොල්ලො සැලකිලිමත් උණේ තමන්ගේ කාර්ය මණ්ඩලය ගැන විතරයි. ඒ බය නිසාම ඒ ගොල්ලෝ දැන් එහෙ යන්නේ නෑ."

-මඩකලපුවේ සුනාමිය නිසා විපතට පත් අයෙක්

අන්තර්ජාතික ආයතනවලට හැකියාව තියෙනවා ආණ්ඩුවට බල කරන්න. ඒත් වාකරේ දි ඒක හරියට සිද්ද උණේ නෑ. හාමතේ මැරෙන මිනිස්සු ගැන ඒ ගොල්ලො බැලුවේ නෑ. ඒ ගොල්ලන්ට හැකියාව තිබුණා හමුදාවයි එල්ටීටීඊ එකයි අතරෙ යුද්දෙ නවත්තන්න. ඒ ගොල්ලන්ට එහෙට ගිහිල්ලා නියම තත්වය වාර්තා කරන්න තිබුණා. ඒත් ඒ ගොල්ලො එහෙම කළේ නෑ."

-මඩකලපුවේ දෙමළ දේශපාලන නායකයෙක්

ගැටුම්කාරී ප්‍රදේශවල සහන සේවා ආයතන හමුදා හා රාජ්‍ය නිලධාරීන් සමග ඇති සබඳතා පිළිබඳව ෂලකා බලද්දී අන්තර්ජාතික ආයතනවල ගුණාත්මකභාවය පිළිබඳ ද අවධානය යොමු කළ යුතුය.

"රාජ්‍ය නොවන සංවිධාන මිනිස්සුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්නෙ හුදෙක් රජයේ නොහැකියාව නිසා නෙමෙයි. දෙමළ ජාතිකයන්ට හඬක් දෙන්න ඒගොල්ලන්ට උවමනා උණා. ඒත් දැන් මේක රජයට තවත් ප්‍රශ්නයක් වෙලා. රජය අපේක්ෂා කළේ මානව හිමිකම් ආරක්ෂා කරන්න වෙන්න ඇති. ඒත් මේක දෙමළ ජාතිකයන්ට කරන පක්ෂපාතීත්වයක් වගෙයි පේන්නෙ. මේ හේතුව නිසා සිංහලයො තුළ රාජ්‍ය නොවන සංවිධාන ගැන තියෙන්නේ ඍණාත්මක ආකල්පයක්. සිවිල් ආරක්ෂකයො අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලට චෝදනා කරන්නේ ඒ ගොල්ලෝ මුදල් අයුතු ලෙස එල්ටීටීඊ එකට දෙනවා කියලයි."

-මඩකලපුවේ සිවිල් සමාජ නායකයෙක් මොහු කලින් එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධව සිට ඇත.

මඩකලපුවේ හා අනුරාධපුරයේ බොහෝ දෙනෙක් යුද්ධය නිසා විපතට පත්ව සිටින්නන් හා අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ තීරණ ගැනීමේ දී මානව හිමිකම් සුරැකීමේ කාර්යයේ යෙදී සිටින රාජ්‍ය නොවන සංවිධාන රජය හා ආරක්ෂක සංවිධාන අතර නිරන්තරව සිදුවන සන්නිවේදනයක් පවත්වාගෙන යාමේ වැදගත් කම අවධාරණය කළහ.

"රාජ්‍ය නොවන සංවිධානවලට වැඩ කරන්න නිදහසක් නෑ. මඩකලපුව එතකොට අනික් නිදහස් කර ගත්ත ප්‍රදේශවල තත්වය සලකලා බලන්න. මේ ප්‍රදේශවල තාම විවිධ සීමා පනවලා තියෙනවා."

-රජයේ හමුදා විසින් මෑතක දී මුදාගත් ප්‍රදේශ ගැන සඳහන් කරමින් මඩකලපුවේ දෙමළ දේශපාලන පක්ෂයක නියෝජිතයෙක්

"අන්තර්ජාතික ආයතනවලට කටයුතු කරන්න තියෙන්නෙ මිනිස්සුයි රජයයි සමග විතරක් නෙමෙයි. වෙනත් පාර්ශ්වවලට වරද පටවන එක නම් ලේසියි. අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන ඉගෙන ගන්න ඕනේ හමුදා සමග සහ සිවිල් ආරක්ෂක නිලධාරීන් සමග කටයුතු කරන්නේ කොහොමද කියලා."

-මඩකලපුවේ මානව හිමිකම් පිළිබඳ නීතිඥයෙක්

"නැවත පදිංචි කරවපු ප්‍රදේශවල 20000 පමණ අවතැන් වූවන් ඉන්නවා. ළමයි 15000 විතර ආපහු ඉස්කෝලෙ යනවා. ඒත් සමාජ ව්‍යුහයේ නොයෙක් දූෂ්කරතා තියෙනවා. මේක සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. මේ සම්බන්ධ සම්පූර්ණ වගකීම රජය සතුයි. එත් දැන් තත්වෙ

දුෂ්කර වෙලා තියෙන්නේ හමුදාව සම්බන්ධීකරණ කටයුතු කරන නිසායි. විවිධ අවි ගත්ත කණ්ඩායම්වල කටයුතු නිසා මේ තත්වය ගැන වැඩි දුර සොයා බැලීමත් අසීරුයි."

-මඩකලපුවේ විදේශ සහන සේවකයෙක්

**සවන්දීමේ කණ්ඩායමේ සිතාබැලීම්**

උතුරු නැගෙනහිර දැඩි අවදානම් සහිත ප්‍රදේශවල වැඩි වශයෙන් විදේශිය සේවකයින් සේවයේ යෙදවීම මගින් සිවිල් වැසියන්ගේ ආරක්ෂාව යම්තාක් දුරකට වැඩි කර ගත හැකි බව සවන්දීමේ කණ්ඩායමේ සාමාජිකයන් ගේ අදහස විය. කෙසේ වුවත් මේ තත්වය තහවුරු කිරීමට නම් ආයතනයේ ප්‍රතිපත්ති එයට උචිත ආකාරයෙන් පැවතිය යුතු අතර කාර්ය මණ්ඩලයට ඊට සූදානම්ව සිටිය යුතු වේ. කාර්ය මණ්ඩලය දේශීය භාෂාවන් භාවිත කරන්නේ නම් වඩාත් ඵලදායී වනු ඇත.

**අවසාන ප්‍රත්‍යාවේක්ෂණය**

රට තුළ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා ආධාර සපයන ආයතන සන්දර්භය තුළ දී වැඩි දුරටත් අධ්‍යයනයට ලක් විය යුතු බවට සවන්දීමේ කණ්ඩායම් සාමාජිකයන් විසින් තේමා හා ගැටලු කිහිපයක් අවධාරණය කෙරිණි. මෙවන් එක් ගැටලුවක් වන්නේ ආධාර සපයන ආයතන විසින් න්‍යාය පත්‍ර සකස් කිරීමේ දී කුමන ආකාරයේ මැදිහත් වීමක් සිදු කළ යුතුද භූගෝලීය අවධාරණය කෙසේ විය යුතු ද ප්‍රතිලාභ ලබන්නන් තෝරා ගැනීමේ දී කිනම් නිර්නායක අනුගමනය කර ඇත් ද යන කරුණු ය. ප්‍රජාවන් තුළ සිටින පුද්ගලයින් සමග කළ සාකච්ඡාවලදී පැහැදිලි වූයේ මෙම කරුණු කොළඹ ප්‍රදේශයේ සහන කවයන්ට පමණක් සීමා වූ ඒවා නොවන බවයි. එනම් මෙම කරුණු අන්තර්ජාතික ආධාර ලබන සපයන හෝ ඒ පිළිබඳව නිරීක්ෂණය කරන සියලු ම ශ්‍රී ලංකිකයන්ගේ අවධානය යොමු විය යුතු කරුණු සේ පවතියි.

ආධාර සපයන්නන් හා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් සමග කොළඹ පැවති සාරංශගත කිරීමේ හමුවේ දී යළිත් මෙම ප්‍රශ්නය සභාවේ සිටි නියෝජිතයන් විසින් මතු කරන ලදි. බොහෝ දෙනෙක් දිවයිනේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක් පවතින පුත්තලමේ තත්වය ගෙන හැර පෑහ. මේ ප්‍රදේශය තුළ ආධාර සැපයීම සිදු වන්නේ අභ්‍යන්තර අවතැන් වූවන්ට පමණි. අවදානමේ හා දිළිඳුබවේ මිනුම් දඬු නිර්ණය කරගෙන ඇත්තේ කෙසේද යන්න ප්‍රජා වැසියන්ට මෙන් ම සහන සේවා ආයතනවලට ද ගැටලු සහගත වේ. සහභාගී වූවන් ආධාර සපයන ආයතන හා සහන සේවා නිලධාරීන්ගෙන් ඉල්ලා සිටියේ ඔවුන්ගේ අවදානම පිළිබඳ නිර්ණායක පැහැදිලි කරන ලෙසය.

ආධාර සපයන ආයතනවල න්‍යාය පත්‍රයන් හා අවදානම පිළිබඳ නිර්ණායක පිළිබඳ ගැටලුව තව දුරටත් පවතිද්දී ආධාර ලබන්නන් විසින් ඉදිරිපත් කරන ලද සෙසු ඉල්ලීම් කඩිනම් වැඩි දියුණු කිරීම් අවශ්‍ය ක්ෂේත්‍ර ලෙස හඳුනා ගැනුණි. උදාහරණයක් වශයෙන් වැඩිදුර තොරතුරු ලබා දෙන ලෙස හා මැදිහත් වීමේ ක්‍රියාමාර්ගය ආයතනවලට කඩිනමින් පියවර ගත හැකි ක්ෂේත්‍රයක් බවට හඳුනා ගැනිණි. මේ සඳහා වැය කරන කාලය හා කාර්යමණ්ඩල ශ්‍රමය අපතේ නොයනු ඇත. විශේෂයෙන්ම දීර්ඝ කාලීන සැලසුම් සකස් කිරීමේ දී මෙය වැදගත් වේ. කණ්ඩායම් සාමාජිකයන් විසින් තවත් වැදගත් සේ හඳුනා ගත් ක්ෂේත්‍රයක් වන්නේ ප්‍රජා සහභාගීත්වය ශ්‍රම හා මූල්‍ය දායකත්වය යන ඉසව් ඔස්සේ යහපත් සේ ඇගයීමට ලක් කල යුතු බවයි.

භූගෝලීය වශයෙන් සවන්දීමේ කණ්ඩායම්වලට ආරක්ෂක හේතූන් මත උතුරු ප්‍රදේශයට හා බලධාරීන්ගේ අවසරය නොමැතිව ඇතුළු විය නොහැකි නැගෙනහිර මුදා නොගත් ප්‍රදේශවලට යාමට හැකියාවක් නොවීය. බොහෝ සාමාජිකයන් පෙන්වා දුන් පරිදි මේ ප්‍රදේශවල තොරතුරු රහිතව අන්තර්ජාතික උපකාරවල සමස්ත බලපෑම පිළිබඳ සාක්ෂි එක්රැස් කිරීම සම්පූර්ණ නොවේ. ළඟදීම දිනෙක මේ ප්‍රදේශවල තත්වය යහපත් වනු ඇති බවක් ඉන්පසු දේශීය වශයෙන් සංවිධානය කරන ලද සවන්දීමේ කණ්ඩායමකට මේ ප්‍රදේශය තුළ ද සිය කටයුතු සිදු කිරීමට හැකි වනු ඇති බවත් සවන්දීමේ කණ්ඩායමේ විශ්වාසයයි.